# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,924 — 1970 සැප්තැම්බර් 18 වැනි සිකුරාදා — 1970.9.18

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 1341 | තොටුපළ් වේන්ද හා වෙනත් වේන්ද විකිණීම ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1351 | ආණ්ඩුවේ නොවන දැන්වීම ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම ... ... ... | 1352 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම ... ... | 1365 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම ... ... | 1369 |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | 1366 | විවිධ දැන්වීම ... ... ... ... | — |


[සැලකිය යුතුයි.—මෙවර ප්‍රසිද්ධ කරන ගැසට් පත්‍රිකාවේ VI වැනි කොටසේ ජූරි සභිකයින්ගේ සහ උපදේශකයින්ගේ නාම ලේඛනයක් පළවේ.]

## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

දීමනා.—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. සේවා කොන්දේසි.—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි, යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට යටත් වන්නේ ය.

3. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½ කට සමාන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥා පනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, අදාලවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

**ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් භාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.**

1970 ජූනි මස 2 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

(ඈ) පුහුණුවීමේ කාල තුළදී ශිෂ්‍ය භට නිලධාරීන්ගේ තරාතිරම සෙසු නිලයන් හා සමාන වන අතර, ඔවුන් යුද හමුද නීතියට යටත් වනු ඇත.

(ඉ) (i) පුහුණුවීමේ කාලසීමාව තුළදී ශිෂ්‍ය භට නිලධාරියෙකු සිය කැමැත්තෙන්ම අධිකාරය සඳහා වූ තම අපේක්ෂකත්වය හමාර කළහොත්, එතෙක් එම ශිෂ්‍ය භට නිලධාරියා වෙනුවෙන් ලංකාණ්ඩුව මගින් දරන්නට යෙදුන සියළුම වියහියදම් දෙමව්පියන් හෝ භාරකරු විසින් ලංකාණ්ඩුවට ආපසු ගෙවිය යුතුය.

(ii) ශිෂ්‍ය භට නිලධාරියෙක් පාඨමාලාවේ නියුතුව සිටින කාලය තුළ කිනම් අවස්ථාවක වුවත්, විෂමාචාරය හේතුන් නිසා හෝ තමන් විසින්ම වලක්වා ලිය හැකි හේතුන් නිසා හෝ අධිකාරය පිරිනැමීමට නුසුදුසුයැයි බලධාරීන් විසින් වාර්තා කරණු ලැබුවහොත්, ලංකාණ්ඩුව මගින් ඔහු වෙනුවෙන් දරන්ට යෙදුන සියළුම වියහියදම් දෙමව්පියන් හෝ භාරකරු විසින් ලංකාණ්ඩුවට ආපසු ගෙවිය යුතුය.

(ඊ) අධිකාරයට පත්කිරීමේදී, ශිෂ්‍ය භට නිලධාරියෙකු වශයෙන් නිත්‍ය බල හමුදවට ඇතුලත් වූ බැඳීමෙන් ශිෂ්‍ය භට නිලධාරීත්ව මුද හරිනු ලැබේ.

(උ) නිලධාරීන් වශයෙන් අධිකාරයට පත් කිරීමෙන් පසුව අඩු වශයෙන් අවුරුදු 7 ක් යුද හමුදවේ සේවය කළ යුතුවේ.

(ඌ) වැටුප්, මතු බලාපොරොත්තු හා සේවා කොන්දේසි සම්බන්ධයෙන් පහත සඳහන් රෙගුලාසිවලින් නිලධාරීන්ට බලපවත්වනු ලැබේ :—

(1) 1961 අප්‍රේල් මස 28 වැනි දින අංක 12,395 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබ, කලින් කල සංශෝධිත 1961 යුද හමුද වැටුප් සංග්‍රහය.

(2) 1949 ඔක්තෝබර් මස 10 වන දින අංක 10,028 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබ, කලින් කල සංශෝධිත 1949 නිලධාරීන්ගේ රෙගුලාසි.

(3) 1961 සැප්තැම්බර් මස 28 වැනි දින අංක 12,680 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබ, කලින් කල සංශෝධිත 1961 විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහය.

(එ) සන්නද්ධ සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම අරමුදල සඳහා තම දයක මුදල වශයෙන් තම මූලික වැටුපෙන් සියයට 4ක මුදලක් අඩුකර ගැනීම ගැන තම කැමැත්ත ප්‍රකාශ කරන ලියවිල්ලක් යුද හමුදවට බැඳීමේදී ශිෂ්‍ය භට නිලධාරියෙක් විසින් දිය යුත්තේය.

5. මෙහි පහත 6 වැනි ඡේදයෙහි දක්වා ඇති පරිදි දෙමව්පියන් හෝ භාරකරුවන් විසින් ප්‍රකාශ පත්‍රයකට අත්සන් කළ යුතු වන අතර එය අයදුම් පත්‍රයත් සමග ඉදිරිපත් කළ යුතුවේ. අපේක්ෂකයන්ගේ දෙමව්පියන් හෝ භාරකරුවන් විසින් එකී අපේක්ෂකයින් පත්කිරීමට පෙර ප්‍රකාශ පත්‍රයෙහි අඩංගු කරුණුවලට අනුව, ලංකාණ්ඩුවත් සමග ඇපකරයකට අත්සන් කළ යුතුය.

6. අයදුම්කරුගේ මව, පියා හෝ භාරකරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :

(අ) ලංකා යුද හමුදවේ ශිෂ්‍ය භට නිලධාරි ඉල්ලුම්කරුවෙකු වන ....................................ගේ පියා/මව/භාරකරු මම වෙමි.

(ආ) ලංකාවේ පුහුණුවීමේ පාඨමාලාවක් හැදෑරීම සඳහා පහත නම සඳහන් අයදුම්කරු තෝරා ගනු ලැබුවහොත්, මෙහි පහත සඳහන් කරුණු සම්බන්ධව වගකීම මම භාරගනිමි :—

(i) පුහුණුවීමේ කාලසීමාව තුළදී, අයදුම්කරුහට දරන්නට වන සියළුම පෞද්ගලික වියදම් දැරීමට ;

(ii) පුහුණුව ලබන කාලය තුළ ඉහත නම සඳහන් අයදුම්කරු සිය කැමැත්තෙන්ම අධිකාරය සඳහා වූ තම අපේක්ෂකත්වය හමාර කළහොත්, ඔහු වෙනුවෙන් දරන්ට වූ සියළුම වියදම් ලංකාණ්ඩුවට ආපසු ගෙවීමට ;

(iii) පුහුණුව ලබන කාලය තුළ ඉහත නම සඳහන් අයදුම්කරු කිනම් අවස්ථාවක වුවත් (විෂමචාරය හෝ ඔහුට තමන් විසින්ම වළක්වා ලිය හැකි හේතුන් හෝ නිසා) අධිකාරිය ලැබීමට නුසුදුසු යයි බලධාරීන් විසින් වාර්තා කරනු ලැබුවහොත් ලංකාණ්ඩුව මගින් ඔහු වෙනුවෙන් දරන්නට වූ සියළුම වියහියදම් ලංකාණ්ඩුවට ආපසු ගෙවීමට ද වේ.

————————,
අත්සන.

නම සහ ලිපිනය (පැහැදිලි අකුරෙන්) :————.
දිනය :————.
සාක්ෂිකරුගේ අත්සන :————.
නම සහ ලිපිනය (පැහැදිලි අකුරෙන්) :————.

7. භාෂා අවශ්‍යතා.—ලංකාණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහා විශේෂයෙන්ම වර්ෂ 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාවේ යෙදවීම සඳහා දනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන්ම, මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද, අනුකූලව තෝරාගත් අපේක්ෂකයින් ක්‍රියා කළ යුතු වේ.

8. රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්‍ර, අපේක්ෂකයා තෝරාගත හොත් මුදලිය හැකි බවට සහතිකයක්ද සහිතව, දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මගින් එවිය යුතුය.

9. ඉල්ලුම් පත්‍ර.—ඉල්ලුම් පත්‍ර පහත දක්වෙන ආකෘතියට අනුව ලියා 1970.10.8 වැනි දින දහවල් 12 ට හෝ එයට පෙර ලැබෙන සේ '' යුද හමුද මූලස්ථානය, තැ. පෙ. 553, කොළඹ '' යන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත බහාලන කවරයේ '' යුද හමුදවේ ශිෂ්‍ය භට නිලධාරි තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය '' යනුවෙන් සඳහන් කළ යුතුවේ. අයදුම් පත් භාරගනු ලබන දිනයට හා වේලාවට පසුව මෙම මූලස්ථානයට ලැබෙන අයදුම් පත් භාරගනු නොලැබේ අයදුම් පත්‍ර නිකුත් කරනු නොලැබේ.

10. ඉල්ලුම් පත්‍ර සමග පහත සඳහන් සහතිකවල පිටපත් එවිය යුතුය :—

(අ) උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සහතිකය.

(ආ) දක්වා ඇති අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීමේ සහතිකය.

(ඇ) අයදුම්කරුවා පුද්ගලිකව දන්නා හඳුනන වගකිව යුතු පුද්ගලයින්ගෙන් මෑතකදී ලබාගන්නා ලද චරිත සහතික. යටත් පිරිසෙයින් දෙකක්. මින් එක් සහතිකයක් අයදුම්කරු අවසාන වරට ඉගෙනීම ලැබූ පාසැලේ ප්‍රධානාචාර්යතුමාගෙන් විය යුතු වේ.

11. ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලන අයදුම්කරුවන්ට මූලික තේරීම්වලට භාජනය කරනු ලැබේ. එසේ තෝරාගනු ලබන අයදුම්කරුවන්ට යුද හමුදපති විසින් නියම කරනු ලබන පරිදි පරීක්ෂණවලට පෙනී සිටීමට සිදු වන්නේය. රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශය මගින් පත් කරනු ලබන තේරීම් මණ්ඩලයක් ඉදිරිපිට තෝරාගනු ලබන අපේක්ෂකයින්ට සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අවසාන තේරීම කරනු ලැබේ.

12. තේරීම් මණ්ඩල මගින් සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින්ට සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන ස්ථානය, වේලාව හා දිනය ලිපියකින් දැනුම් දෙනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය කොළඹදී පවත්වනු ලැබේ. මේ සම්බන්ධයෙන් දරණු ලබන ගමන් වියදම හෝ වෙනයම් වියදම් කිසිවක් ලංකාණ්ඩුව මගින් ගෙවනු නොලැබේ.

එම්. ඒ. ජයවීර,
බ්‍රිගේඩියර්,
යුද හමුදපති වෙනුවට.

1970 සැප්තැම්බර් 10 වැනි දින.

### ලංකා යුද්ධ හමුදාවේ ශිෂ්‍ය භට නිලධාරි තනතුරු සඳහා ඉල්ලුම් පත්‍රය

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
2. ලිපිනය :————.
3. පුරවැසි බව (ලාංකික වනුයේ පරම්පරාවෙන්ද, නැතහොත් ලියාපදිංචිවීමෙන්දැයි දක්වා, ලියාපදිංචිවීමෙන් නම් සහතිකයේ අංකය හා දිනය සඳහන් කරන්න) :————.
4. (i) උපන් දිනය (උප්පැන්න සහතිකයකින් සනාථ කළ යුතුය. බෞතීස්ම සහතිකය හෝ අධ්‍යාපන සංග්‍රහය යටතේ නිකුත් කරනු ලබන සහතිකය පිළිගනු නොලැබේ) :————.
   (ii) 1971 ජනවාරි 1 වැනි දිනට වයස :—අවුරුදු :————, මාස :————, දින :————.
5. ආසන්න පොලිස් ස්ථානය :————.
6. පියාගේ නම සහ උත්පත්තියේදී ජාතිය : (පුරවැසි බව ලැබුවෙකු නම්, සහතිකයේ දිනය හා අංකය සඳහන් කරන්න) :————.
7. මවගේ නම සහ උත්පත්තියේදී ජාතිය :————.
8. ඔබේ පාසැල් සමයේ පහත සඳහන් විස්තර සපයන්න :————

| පාසැලේ නම | ඇතුල් වූ දිනය | අස් වූ දිනය | සමත් කළ ප්‍රසිද්ධ විභාග සහ විෂයයන් |
|---|---|---|---|
| | | | |

9. ඔබ පාසැලේදී ලැබූ ක්‍රීඩා පිළිබඳ විශිෂ්ටතාවයන් :————.
10. ඔබ විසින් පාසැලේදී ලැබූ වෙනත් සැලකිලිමත් ජයග්‍රහණ :————.
11. ලංකා ශිෂ්‍ය භට බලකායේ, බාලදක්ෂ ව්‍යාපාර, ලංකා ස්වේච්ඡා බල හමුදාව යනාදී ස්වේච්ඡා සංවිධානවල කළ සේවය :————.
12. කිසියම් සන්නද්ධ සේවාවකට කලින් ඉල්ලුම් කර ඇත්නම්, එහි ප්‍රතිඵලය දක්වන්න :————.
13. පාසැලෙන් අස්වූ තැන් පටන් කළ රැකියාව :————.
14. චරිත සහතික දුන් පුද්ගලයාගේ නම සහ ලිපිනයන් :—
    (අ) ————.
    (ආ) ————.
15. වෙනත් අදාල කරුණු :————.

ඉහත දැක්වෙන ප්‍රකාශයන්ට ම විසින් සපයන ලද පිළිතුරු මගේ දැනීමේ හැටියට සත්‍ය බැව් ගෞරව පූර්වකව ප්‍රකාශ කර සිටිමි. යුද්ධ හමුද ශිෂ්‍ය භට නිලධාරි තනතුරු සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයින්ට බලපාන සේවා කොන්දේසි මෙන්ම නිලධාරීන්ට බලපාන වැටුප්, මතු බලාපොරොත්තු හා සේවා කොන්දේසි ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කර ඇති පරිදි ම විසින් කියවා ඇති අතර එය මම අවබෝධ කර ගනිමි.

අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

9–723—70.9.18 දින අංක 14,924 දරන ගැසට් පත්‍රය

---

## මහජන බැංකුව

### ලිපිකරු තනතුරු—VI ශ්‍රේණිය

1970.9.4 දින රජයේ ගැසට් පත්‍රයෙහි ඇති අපගේ දැන්වීමට අමතරවයි. නියමිත සුදුසුකම් පහත දැක්වෙන අයුරින් සංශෝධනය කොට ඇත :—

සුදුසුකම් :

(අ) වයස.—අයැදුම්කරුවන් 1970.10.31 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 28 ට නොවැඩි විය යුතුය.

(ආ) ජාතිය.—අයැදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් හෝ ලංකාවේ පුරවැසියන් විය යුතුය.

(ඇ) අධ්‍යාපනික සුදුසුකම්.—අංක ගණිතය, වාණිජ ගණිතය නැතහොත් ගණිතය (ශුද්ධ/මූලික/ව්‍යවහාරික හෝ උසස්) සහ සිංහල නොහොත් දෙමළ යන විෂයයන්ටද සමග අවම සම්මාන සාමාර්ථ 5 ක් ඇතිව, එකම වතාවකදී අඩුම වශයෙන් විෂයයන් 6 කින් පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගය හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය හෝ සමත්ව තිබීම. සෞඛ්‍ය විද්‍යාව, චිත්‍ර කර්මය, සංගීතය, ගෘහ විද්‍යාව, මැහුම් වැඩ සහ හස්ත කර්මාන්තය යන විෂයයන් වෙනුවෙන් ලබාගන්නා ලද සම්මාන සාමාර්ථයන් ගණන් ගනු නොලැබේ.

හෝ

පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයේ දී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී අංක ගණිතය/වාණිජ අංක ගණිතය නැතහොත් ගණිතය (ශුද්ධ/මූලික/ව්‍යවහාරික හෝ උසස්) සහ සිංහල නොහොත් දෙමළ යන විෂයයන්ට එකවර සම්මාන සාමාර්ථ සමග අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය සමත් වීම.

හෝ

වෙනත් උසස් විභාගයකින් සමත්වීම.

සුදුසුකම් ඇති අයදුම්කරුවනට, අවශ්‍ය වුවහොත්, තෝරාගැනීමේ පරීක්ෂණයකට පෙනී සිටීමට සිදු විය හැක.

මුද්‍රිත අයැදුම්පත් ආකෘති පත්‍රය සඳහා ඉල්ලුම් කිරීමේදී පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගය හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය හෝ සමත් වූවන් සම්බන්ධයෙන්, ඔවුන්ගේ පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතික පත්‍රයෙහි හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) සහතිකයෙහි සත්‍ය පිටපතක්ද, උසස් විභාගයකින් සමත් අය සම්බන්ධයෙන් ඔවුන්ගේ උසස්ම අධ්‍යාපනික සහතිකයෙහි සත්‍ය පිටපතක්ද සමග, තම ලිපිනය ලියූ මුද්දර ගැසූ ලොකු ලිපි කවරයක් එවිය යුතුය.

අයැදුම්පත් භාරගන්නා අවසාන දිනය 1970 ඔක්තෝබර් මස 31 දින දක්වා දීර්ඝ කර ඇත.

අයැදුම්පත් සඳහා ඉල්ලීම් 1970 ඔක්තෝබර් මස 20 දිනට පසුව භාරගනු නොලැබේ.

මහජන බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
රජයේ ලිපිකරු සේවා සංගම් ගොඩනැගිල්ල,
කොළඹ 2, 1970.9.10.

සේවක කළමනාකාර තැන.

9–723—70.9.18 දින අංක 14,924 දරන ගැසට් පත්‍රය

15. සෑම අයදුම් පතක් සම්බන්ධයෙන්ම රුපියල් 10 ක මුද්දර ගාස්තුවක් ගෙවිය යුතුවන්නේය. අයදුම්පත් ආකෘතියේ මුල් පිටුවේ ඒ සඳහා වෙන්කොට ඇති කොටුවේ රුපියල් 10 ක මුද්දර අලවා ඒ මත අයදුම්කරුගේ අත්සන යෙදීමෙන් අවලංගු කළ යුතුය. කවර හේතුවක් නිසාවත් මුද්දර ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

16. රජයේ සේවකයින් විසින් එවන අයදුම් පත් සිය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ද, මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතන වල සේවකයින් විසින් එවන අයදුම් පත් ඒ ඒ ආයතන ප්‍රධානීන් මඟින් ද එවිය යුතු යි. සේවයෙන් ඉල්ලා අස්වීමට සූදානම් වුවද මේ අවශ්‍යතාව සපුරාලිය යුතුය.

17. සියළුම අයදුම් පත් ලැබුණු බව දන්වනු ලැබේ. අයදුම් පත් භාරගනු ලබන අවසාන දින සිට දින 7 ක් ඇතුළත අයදුම් පත් ලැබුණු බවට දැන්වීමක් නොලදහොත්, ඒ බව අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත වහාම දැනුම් දිය යුතුය. එසේ නොකිරීමේ හේතුවෙන් අයදුම්කරු ගැන සලකා බැලීමට ඇති අයිතිවාසිකම් ඔහුට අහිමි වන්නේය.

ප්‍රේමදාස උඩගම,
අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 සැප්තැම්බර් මස 10 වැනිදා,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

9-763—70.9.18 දින අංක 14,924 දරන ගැසට් පත්‍රය

---

මගේ අංකය : සාප/5/90.

## අධ්‍යාපන අමාත්‍යාංශය

### කාර්මික අධ්‍යාපන ආයතනවල 1 වැනි පන්තියේ වඩු කාර්මික තනතුර

අධ්‍යාපන අමාත්‍යාංශයේ 1 වැනි පන්තියේ වඩු කාර්මික තනතුරු සඳහා පහත දැක්වෙන සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. මෙහි පහත දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද ඉල්ලුම් පත් 1970 ඔක්තෝබර් මස 5 වැනි දින හෝ ඊට පෙර කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ (සාමාන්‍ය පරිපාලන ශාඛාවේ) ස්ථිර ලේකම් ට ලැබෙන සේ එවිය යුතුය. කවරයේ වම් කෙළවරේ උඩ 'වඩු කාර්මික තනතුර' යන්න සඳහන් කළ යුතුයි.

සටහන.—1969. 8. 15 වැනිදා ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනය අනුව ඉල්ලුම් පත් එවූ අය නැවත ඉල්ලුම් පත් එවිය යුතුයි.

2. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි :—

(i) තනතුර ස්ථිරය. පත්කරනු ලබන්නාගේ විශ්‍රාම වැටුප් හිමි තත්ත්වය 1964. 2. 7 වැනි දින අංක 633 දරණ භාණ්ඩාගාර චක්‍ර ලේඛයේ විධිවිධානයන්ට යටත්වනු ඇත. මාසික වැටුප් ක්‍රමයෙහි තැබීමෙන් පසු විශ්‍රාම වැටුප් හිමි තත්ත්වය ලැබෙන තුරු රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. විශ්‍රාම වැටුප් හිමි තත්ත්වය ප්‍රදානය කළ විට වැන්දඹු හා අනත් දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුයි.

(ii) පත් කරනු ලබන්නා රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ අවශ්‍යතාවන් සඳහා රාජ්‍ය සේවයට නව ප්‍රවේශකයකු වන්නේ නම් පරීක්ෂා කාල සීමාව අවුරුදු 3 ක් වන්නේ ය.

(iii) රජයේ සේවයේ ස්ථිර තනතුරක් දරන්නකු තෝරා ගනු ලැබුවහොත් පත්වීම නියමිත කාලයක වැඩ බැලීමේ තත්ත්වයේ පවතිනු ඇත.

(iv) පත් කරනු ලබන්නා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතුයි.

(v) බඳවා ගනු ලබන්නේ සම්මුඛ පරීක්ෂණයකින් හා ප්‍රායෝගික පරීක්ෂණයක් මඟිනි.

3. වැටුප් සහ දීමනා :—(ඒකාබද්ධ වැටුප)

(අ) කොළඹ නාගරික සීමාව සහ නාගරික සීමාවේ සිට සැතපුම් 5 ක අරය තුල වූ ප්‍රදේශය තුල හෝ ඉංජිනේරු හා කම්මාන්ත ශාලීය ආයතනයක් හැටියට භාණ්ඩාගාරය විසින් පිළිගනු ලැබ ඇති ආයතනවල හෝ සේවය කරන්නවුන් සඳහා. (පළමු හය මස තුල දිනකට රු. 10.70 බැගින් සහ ඊට පසු වර්ෂයකට රුපියල් 3,240—12 × 60—3,960)

(ආ) පිට පළාත්වල ඉංජිනේරු හා කර්මාන්තශාලීය ආයතන හැටියට භාණ්ඩාගාරය විසින් පිළිගනු නො ලැබ ඇති ආයතනවල සේවය කරන්නවුන් සඳහා. (පළමු හය මස තුල දිනකට රු. 9.70 බැගින් සහ ඊට පසු වර්ෂයකට රුපියල් 3,060—9 × 60—3,600.)

4. අවශ්‍ය සුදුසුකම් :—සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් කරුණු සනාථ කිරීම සඳහා සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතු වෙයි.

(අ) ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනට යටත් පිරිසෙයින් අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතුයි. දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින්නන්ට උපරිම වයස් සීමාව බලපානු නො ලැබේ.

(ආ) (i) කියවීමට හා ලිවීමට පිළිවන් විය යුතුයි.

(ii) 1/32" පරිමාණයක් කියවීමට පිළිවන් විය යුතුයි.

(iii) ඇඳීම් කියවීමට පිළිවන් විය යුතුයි.

(iv) සිය වෘත්තිය හා සම්බන්ධ ආයුධවල නම්, භාවිතය හා ඒවා තබා ගැනීම පිළිබඳව හොඳ පළපුරුද්දක් තිබිය යුතුයි.

(v) තමන් යොදවනු ලබන්නාවූ වඩුවැඩ හා මූට්ටු කිරීමේ වැඩ පිළිබඳව සම්පූර්ණයෙන් දැන ගත යුතු අතර, එවැනි ඕනෑම වැඩක් කිරීමට හැකි විය යුතුයි.

(ඇ) පිළිගත් ආයතනයක පළමුවැනි පන්තියේ අදාල වෘත්තියකරුවෙකු (වඩු කාර්මික) වශයෙන් අවුරුදු 6 කට නොඅඩු සේවයක් සහිතව අදාල වෘත්තීයකරුවෙකු වශයෙන් අවුරුදු 10 කට නොඅඩු සේවයක් තිබිය යුතුයි. (සහතික පත් මඟින් සනාථ කළ යුතුයි.)

සටහන.—එක්සත් රාජධානි කඳවුරුවල වෘත්තිකයෙකු ලෙස කළ සේවය පිළිගත් ආයතනයක සේවය වශයෙන් පිළිගනු ලැබේ.

(ඈ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්තව සිටිය යුතුයි.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය වූ විටෙක ඉදිරිපත් කිරීමට සෑම අයදුම්කරුවෙක් ම සූදානම් විය යුතුය :—

(අ) ලැබූ ඉහළම අධ්‍යාපන සහතිකය.

(ආ) ලබා ඇති වෘත්තීය හා/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඇ) 4 වැනි ඡේදයේ (ඇ) අනුඡේදය යටතේ සඳහන් වන පිළිගත් ආයතනයන්හි පූර්වසේවය පිළිබඳ සහතික.

(ඈ) සිංහලෙන් හා/හෝ දෙමළෙන් සමත්වූ ඉහළම විභාගය දැක්වෙන සහතිකය.

සටහන—

(i) ලියකියවිලිවත්, ලියකියවිලිවල පිටපත්වත් අයදුම්පතට අමුණා නොඑවිය යුතුයි.

(ii) ලියකියවිලි ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබූ විට ඒවා ඉදිරිපත් කිරීමට අපොහොසත්වන අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

6. අයදුම්කරුවන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත් ස්වකීය දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. එසේ කුදු වුවත්, තම ඉල්ලුම් පත්‍රයේ පිටපතක් කෙළින්ම අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්ගේ නමටද එවිය යුතුය. නියමිත දිනට ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. එහෙත් නියම අවස්ථාවේදී දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාට ලැබී ප්‍රමාදය සඳහා සැළකිය යුතු කාරණයක් ඉදිරිපත් කළ හොත් පමණක් එසේ ප්‍රමාදවී ලැබෙන ඉල්ලුම් පත් බාර ගනු ලැබේ.

7. මෙම ගැසට් පත්‍රයේ පළමුවැනි කොටසේ දෙවැනි ඡේදයේ ආරම්භයේ දැක්වෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත්වීම් සම්බන්ධ පොදු කොන්දේසි ද බලනු මැනවි.

8. ඉල්ලුම්පත් ලැබුණු බව දන්වනු ඇත. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනය පසුවී දින 21ක් ඇතුළත ඉල්ලුම් පත ලැබුණු බවට ලිපියක් නොලද හොත් වහාම ඒ බව අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත දැන්විය යුතුය. කිසියම් අයදුම්කරුවෙක් මේ අවශ්‍යතාවය පැහැර හරින්නේ නම් තම අයදුම්පත්‍රය සලකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට අහිමි වනු ඇත.

ප්‍රේමදාස උඩගම,
අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 සැප්තැම්බර් මස 11 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ
අධ්‍යාපන අමාත්‍යාංශයේ
සාමාන්‍ය පරිපාලන ශාඛාවේදී ය.

**ඉල්ලුම්පත්‍රයේ ආදර්ශ ආකෘතිය.**—මෙම ඉල්ලුම්පත්‍රය අඟල් 8½×13½ ප්‍රමාණයේ කඩදාසියක ටයිප් කළ යුතුය.

## 1 වැනි පන්තියේ විබු කාර්මික තනතුර සඳහා ඉල්ලුම් පත්‍රයයි

(1) සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

(2) ස්ථිර ලිපිනය :————.

(3) ගම් ප්‍රදේශය :————.

(4) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට තියම වයස :————.
උපන් දිනය :————.

(5) උපන් ස්ථානය :—
- (අ) ඉල්ලුම්කරු :————.
- (ආ) ඉල්ලුම්කරුගේ පියා :————.
- (ඇ) ඉල්ලුම්කරුගේ පියාගේ පියා :————.
- (ඈ) ඉල්ලුම්කරුගේ පියාගේ පියාගේ පියා :————.

(6) ලාංකිකත්වය පරම්පරාවෙන් ද, ලියාපදිංචි කිරීමෙන් ද යන වග :————.

(7) අධ්‍යාපන සුදුසුකම් :—
- (i) සාමාන්‍ය :————.
- (ii) වෘත්තීය හා/හෝ කාර්මික සහතිකවල විස්තර : ————.
- (iii) සිංහලෙන්/දෙමළෙන් සමත් වී ඇති උසස්ම විභාගයේ විස්තර :————.

(8) නිවේදනයේ 4 වැනි ඡේදයේ (ආ) අනුඡේදය යටතේ සේවා විස්තර (සේවය කළ ආයතන, සේවා කාලයන්, දැරූ තනතුර සඳහන් කළ යුතුයි.) :————.

(9) විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.

(10) කිසියම් අපරාධ වරදක් නිසා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේද ? එසේ නම්, (අ) දිනය (ආ) නඩු නොම්මරය (ඇ) වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

(11) මුදල් කරදරවලින් නිදහස්ද ? එසේ නොවේ නම්, ඔබේ ණය තුරුස්වල ප්‍රමාණය කොපමණද ? :————.

(12) ඔබට විරුද්ධව විනයානුකූලව කටයුතු කර තිබේද ? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.

(13) සේවා මුක්ත භටයෙක් වී නම් (අ) සේනාංකය (ආ) නිලය (ඇ) සේවයට බැඳුනු හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

(14) පාඨශාලාවෙන් අස්වූ දින සිට යෙදී සිටි රක්ෂා :—
- (i) දරන ලද තනතුර :————.
- (ii) නියුක්තව සිටි වකවානුව :————.
- (iii) අස්වීමට හේතුව :————.

(15) ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලන ආයතනයන් යටතේ හෝ කලින් ස්ථිර හෝ තාවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදී සිට, එම සේවය යම් අවස්ථාවකදී නතර කරන ලද්දේ නම් :—
- (අ) එම රක්ෂාව පිළිබඳ විස්තර :————.
- (ආ) සේවයේ යෙදී සිටි කාලය :————.
- (ඇ) සේවය නතර කිරීමට හේතු :—

(16) දැනට යෙදී සිටින රක්ෂාව :—
- (i) ආයතනය :————.
- (ii) තනතුර හා ශ්‍රේණිය :————.
- (iii) ඊට පත් වූ දිනය :————.
- (iv) විශ්‍රාම වැටුප් සහිතද ? තාවකාලික හෝ අනියම් ද : ————.
- (v) දීමනා රහිතව දැනට ලැබෙන වැටුප හා වැටුප් ක්‍රමය :————.
- (vi) මීළඟ වැටුප් වැඩිවීමේ දිනය :————.

(17) වෙනත් කරුණු :————.

(18) මේ අයදුම්පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බව තෝරාගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය

අධ්‍යා./ලේ.,

මගේ අංකය :
ඔබේ අංකය : සාප/5/90

මෙම අයදුම්පත මෙම කාර්යාලයට ලැබී ඇත්තේ අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පසුව/පෙරය.*

ඉල්ලුම්පත්‍රයේ සඳහන්..................ඇංකිත ඡේදවල විස්තර නිවැරදි බැව්/පහත සඳහන් සංශෝධනයන්ට යටත් බැව්* මෙයින් සහතික කොට ඉදිරිපත් කරමි.

..................................
..................................

————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.
පදවි නාමය.

(*අදාල නැති කොටස් කපා හරින්න)

දිනය :————.

9–771—70.9.18 දින අංක 14,924 දරන ගැසට් පත්‍රය

---

යොමු අංකය : සාප 30/206

## අධ්‍යාපන අමාත්‍යාංශය

### අධ්‍යාපන අමාත්‍යාංශයේ පාඨශාලා ගොඩනැගිලි අංශයේ කාර්මික සහකාර තනතුරු (ගොඩනැංවීම්/ප්‍රමාණ සමීක්ෂණ)

අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්මික සහකාර තනතුරු (ගොඩනැංවීම් හා ප්‍රමාණ සමීක්ෂණ) සඳහා පහත දැක්වෙන සුදුසුකම් ඇති අපේක්ෂකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙහි පහත දක්වා ඇති ආදර්ශ පෝරමය අනුව ඉල්ලුම් පත් සකස් කොට කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ (සාමාන්‍ය පරිපාලන ශාඛාවේ) ස්ථිර ලේකම්තුමා වෙත 1970 සැප්තැම්බර් 30 වැනි දින හෝ ඊට ප්‍රථම ලැබෙන්ට සැලැස්විය යුතුය. ඉල්ලුම්පත් අමාත්‍යාංශයේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික ලිපිනයට නොඑවිය යුතුය.

සටහන :

(1) 1969 දෙසැම්බර් මස 19 වැනි දින ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ යොමු අංක සාප 30/206 යටතේ පළවූ නිවේදනය අනුව දැනටමත් අයදුම්පත් එවූ අයදුම්කරුවන්ද මෙම නිවේදනය යටතේ නැවත අයදුම්පත් එවිය යුතු බව සැළකිය යුතුය.

(2) තනතුරු දෙක සඳහා අයදුම්පත් වෙන වෙනම එවිය යුතුයි.

2. **වැටුප් ක්‍රමය.**—වර්ෂයකට රු. 2,580 න් පටන් ගෙන රු. 120 බැගින් වන වාර්ෂික වැටුප් වැඩිවීම් 11 කින්, රු. 180 බැගින් වන වාර්ෂික වැටුප් වැඩිවීම් 4 කින් වර්ෂයකට රු. 4,620 දක්වා නැග, රු. 4,620 වාර්ෂික වැටුපේ දී ඇවුරුද්දක නැවතීමකින් පසුව වර්ෂයකට රු. 4,800 න් පටන් ගෙන රු. 180 බැගින් වන වැටුප් වැඩිවීම් 3 කින් සහ රු. 240 බැගින් වන වාර්ෂික වැටුප් වැඩිවීම් 5 කින් වර්ෂයකට රු. 6,540 දක්වා නගින්නකි.

**1969.10.1 දින සිට වලංගුවන නව ඒකාබද්ධ වැටුප් ක්‍රමය.**—වර්ෂයකට රු. 5,016—11×144 සහ 4×180—රු. 7,320 දක්වා නැග, රුපියල් 7,320 වාර්ෂික වැටුපේදී අවුරුද්දක නැවතීමකින් පසුව, වර්ෂයකට රු. 7,500—3×180 සහ 5×240—රු. 9,240 දක්වා නගින්නකි.

3. **සේවයට යෙදවීමේ වගන්තිය.**—තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

4. **වයස් සීමාව.**—අවුරුදු 40 ට වැඩි නොවිය යුතුය. රජයේ සේවයේ දැනටමත් යෙදී සිටින නිලධාරීන්ට මෙම වයස් සීමාව බලපාන්නේ නැත.

5. **අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්.**—

(i) දෙවාරයකට නොවැඩි වාර ගණනකදී ගණිතය (ශුද්ධ හෝ ව්‍යවහාරික) සහ භෞතික විද්‍යාව ඇතුළු විෂයයන් 6 කින් පොදු අධ්‍යයන සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ගණිතය (ශුද්ධ හෝ ව්‍යවහාරික) සහ භෞතික විද්‍යාව සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන් හෝ ඊට උසස් විභාගයකින් සමත් වී සිටීම.

(ii) ලංකාවේ කාර්මික විද්‍යාලය මගින් පවත්වනු ලබන ගොඩනැගිලි නිර්මාණය පිළිබඳ විභාගයේ I වන සහ II වන අවස්ථාව සමත් වී ඇති බව ඊට අතිරේකව ලංකා කාර්මික විද්‍යාලයේ ගොඩ නැංවීම පිළිබඳ ඉංජිනේරු විද්‍යාව සඳහා ඇති තුන් අවුරුදු අර්ධකාල පාඨමාලාවක් සම්පූර්ණ කර ඇති බව හෝ ඊට උසස් සුදුසුකමක් ඇති බව, සහ

(iii) කාර්මික සහකාර (ගොඩනැංවීම්) තනතුරු සඳහා ඉහත (5 වැනි ඡේදයේ I, II යටතේ ඇති සුදුසුකම්වලට අමතරව මෙහි පහත දක්වා ඇති (අ) යටතේ ඇති සුදුසුකම්ද, කාර්මික සහකාර (ප්‍රමාණ සමීක්ෂණ) තනතුරු සඳහා ඉහත (5 වැනි ඡේදයේ) I, II යටතේ ඇති සුදුසුකම්වලට අමතරව මෙහි පහත දක්වා ඇති (ආ) යටතේ ඇති සුදුසුකම්ද අනිවාර්යයෙන්ම තිබිය යුතුය :—

(අ) පිළිගත් සිවිල් ඉංජිනේරු ආයතනයක අඩු ගණනේ අවුරුදු 3 ක් ඇඳීම් කාර්යාලයක ලත් අත්දැකීමක් සහිතව, යටත් පිරිසෙයින් අවුරුදු 10 ක පළපුරුද්දක් ඇති බව,

(ආ) පිළිගත් සිවිල් ඉංජිනේරු ආයතනයක ප්‍රමාණ වෙන් කිරීම් හා ඇස්තමේන්තු පිළියෙල කිරීම පිළිබඳව අවුරුදු 3 ක අත්දැකීමක් සහිතව, යටත් පිරිසෙයින් අවුරුදු 10 ක පළපුරුද්දක් ඇති බව.

6. ඉහත 5 වැනි ඡේදයේ ප්‍රකාර සුදුසුකම් ඇති රජයේ සේවකයින්ගේ ඉල්ලුම්පත්‍ර ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

7. මෙම ගැසට් පත්‍රයේ පළමුවැනි කොටසේ දෙවන ඡේදයේ ආරම්භයේ ඇති රාජ්‍ය සේවා තනතුරුවලට කෙරෙන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසිවලට විශේෂ සැලකිල්ල යොමු කරනු ලැබේ.

8. ඉල්ලුම්කරුවන් විසින් සිය ඉල්ලුම්පත්‍රවලට පහත සඳහන් වන සහතිකපත්‍රවල පිටපත් (මුල් පිටපත් නොවේ) අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකපත්‍රය (බව්තීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථා මාලාවේ කටයුතු සඳහා දෙන සහතිකපත්‍ර හෝ පිළිගනු නොලැබේ).

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන හා/හෝ වෘත්තීය සහතිකපත්‍ර.

(ඉ) ඉල්ලුම්කරුගේ සුදුසුකම්, චරිතය සහ මෙම තනතුරට පත් කිරීමට ඇති යෝග්‍යතා සම්බන්ධයෙන් මෑතදී ලබාගත් සහතිකපත්‍ර තුනක් (දැනටමත් රජයේ සේවයෙහි යෙදී සිටින අයදුම්කරුවන් මෙම අතුරු ඡේදය යටතේ සහතික එවීම අවශ්‍ය නොවේ).

සංලක්ෂ්‍යය.—මෙම සහතිකපත්‍ර පිටපත් ආපසු එවනු නොලැබේ.

9. සියලුම ඉල්ලුම්පත්‍ර ලැබුණු බව දන්වා එවනු ඇත. අයදුම්පත් භාර ගැනීම අවසන් කොට දෙසතියක් ඇතුළත එසේ දන්වා එවනු නොලැබූ අයදුම්කරුවන් ඒබව වහාම ස්ථිර ලේකම්, සාමාන්‍ය පරිපාලන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය, කොළඹ 2, යන ලිපිනයට දැනුම් දිය යුතුය.

10. ඉල්ලුම්පත්‍ර කාර්මික සහකාර (ගොඩනැංවීම්) තනතුරු සඳහා නම් කා. ස. ගො. යන්නද ඉල්ලුම්පත්‍ර කාර්මික සහකාර (ප්‍රමාණ සමීක්ෂණ) තනතුර සඳහා නම් කා. ස. ප්‍ර. යන්නද පැහැදිලිව, ලොකු අකුරෙන් ඉල්ලුම් පත්‍රයේ ඉහළ වම් කෙළවර ලිවිය යුතුය.

ස්ථිර ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය

1970 සැප්තැම්බර් මස 10 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දිය.

යොමුව : කාප/30/206

### ආදර්ශ ආකෘති පත්‍රය

අධ්‍යාපන අමාත්‍යාංශයේ (පාඨශාලා ගොඩනැගිලි අංශය) කාර්මික සහකාර (ගොඩනැංවීම්/ප්‍රමාණ සමීක්ෂණ) තනතුර

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. ලිපිනය (පැහැදිලි අකුරෙන්) :————.

3. අයදුම්පත් බාරගන්නා අවසාන දිනය නියම වයස :—
   අවුරුදු :——. මාස :——. දින :——.

   උපන් දිනය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය) :————.

4. ඔබ පුරවැසියෙක් ද? එසේ නම් උත්පත්තියෙන් ද නැතහොත් ලියාපදිංචි කිරීමෙන් ද :————.

   පහත සඳහන් අයගේ උපන් ස්ථාන :—
   (i) අයදුම්කරුගේ :————.
   (ii) අයදුම්කරුගේ පියාගේ :————.
   (iii) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තාගේ :————.
   (iv) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මී මුත්තාගේ :————

5. අයදුම්කරු විවාහකද, අවිවාහකද නැතහොත් වැන්දඹු ද යන වග (විවාහක නම් විවාහ වූ දිනය සහ දරුවන් ගණන සඳහන් කරන්න) :————.

6. ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් (සහතික පිටපත් අමුණන්න) :————.

   පහත සඳහන් භාෂාවන් පිළිබඳ දැනීම :—
   (i) සිංහල :————.
   (ii) දෙමළ :————.
   (iii) ඉංග්‍රීසි :————.

7. වෘත්තීය හා කාර්මික සුදුසුකම් තිබේ නම් විස්තර (සහතික පත්‍ර ඇතොත් පිටපත් අමුණන්න) :————.

8. විශේෂ සුදුසුකම්, පුහුණුවීම් හෝ පළපුරුදුකම් තිබේ නම් විස්තර :————.

9. පාසැල හැර යාමෙන් පසුව කළ රක්ෂා දින සහිතව :————.

10. චරිත සහතික ඉදිරිපත් කර ඇති සම්භාවනීය පුද්ගලයින් තිදෙනාගේ නම් සහ පදවි නාමයන් (සහතික පත්‍රවල පිටපත් ඇමිණිය යුතුය) :————.

11. ඔබ ණය ගැති කමින් නිදහස් ද? නොඑසේ නම් කොතෙක් දුරට ණය ගැතිද? :————.

මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති කරුණු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. තවද, මෙහි අන්තර්ගත කරුණු අසත්‍ය බව මා තෝරාගැනීමට කලින් දැනගතහොත් මෙම තනතුර සඳහා මා නුසුදුස්සකු කිරීමට හැකි බවත් පත් කරනු ලැබූමායින් පසුව සොයා ගතහොත් කිසිම වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකර දැමිය හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

9–769—70.9.18 දින අංක 14,924 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන අමාත්‍යාංශය

### සිංහල මාධ්‍ය පාසල්වලට උපාධි අපේක්ෂක විද්‍යා ගුරු භවතුන් බඳවා ගැනීම

රජයේ පාසල්වල විද්‍යා උපගුරු තනතුරු සඳහා ගැහැණු සහ පිරිමි උපාධි අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම පුරප්පාඩු ඇත්තේ සිංහල මාධ්‍යයෙන් ඉගැන්වීම කරන පාසල්වල ය.

2. මෙහි පහත දැක්වෙන ආදර්ශ පෝරමය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 1970 ඔක්තෝබර් 10 වැනි දින හෝ ඊට ප්‍රථම කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ, පාඨශාලා පරිපාලන ශාඛාවේ ස්ථිර ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය. ලියුම් කවරයේ වම් කෙළවරේ "විද්‍යා උපාධි අපේක්ෂක" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය.

3. වැටුප් සහ දීමනා.—මෙම තනතුරට හිමි වැටුප් ක්‍රමය මෙසේ ය :

(i) කල්පිත වැටුප—1,344—18/72, 3×120—3,000.

(ii) ඒකාබද්ධ වැටුප—3,450—19×90 සහ 3×144—5,592.
විවාහක දීමනාව නියමිත ප්‍රමාණයන්ට අනුව ගෙවනු ලැබේ.

4. සුදුසුකම්.—සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(i) 1970.10.10 වැනි දිනට වයස අවුරුදු 18 ට අඩු හෝ 45 ට වැඩි හෝ නොවන බව (මෙම උපරිම වයස් සීමාව දැනටමත් රාජ්‍ය සේවයෙහි නියුක්තව සිටින්නන් සඳහා අදාළ නොවේ).

(ii) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධි පරීක්ෂණයට පෙනී සිට ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් සිටින්නකු විය යුතුය.

(iii) යටත් පිරිසෙයින් පහත සඳහන් විෂයයන්ගෙන් දෙකක්වත් උපාධි පරීක්ෂණය සඳහා ගෙන තිබිය යුතුය :—

(අ) භෞතික විද්‍යාව
(ආ) රසායන විද්‍යාව
(ඉ) උද්භිද විද්‍යාව
(ඊ) සත්ව විද්‍යාව
(උ) ශුද්ධ ගණිතය
(ඌ) ව්‍යවහාර ගණිතය
(එ) භූ විද්‍යාව

(iv) සිංහල මාධ්‍යයෙන් අධ්‍යයන පොදු සහතික පත්‍රය සාමාන්‍ය පෙළ පන්තිවල ඉගැන්වීම කළ හැකි අය විය යුතුය. අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී ප්‍රායෝගික සිංහලෙන් හෝ රජයේ සේවකයන් සඳහා වූ සිංහල ප්‍රවීණතා විභාගයේ (iv) වැනි ශ්‍රේණියේ විභාගයෙන් හෝ සමත් අය විය යුතුය.

(v) විශිෂ්ඨ චරිත ශුද්ධියකින් යුක්ත බව.

(vi) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කැමති බව හා ඊට සුදුසු ශාරීරික සෞඛ්‍යයෙන් යුක්ත බව.

5. අයදුම්කරුවන් විසින් ස්වකීය ඉල්ලුම් පත්වලට පහත සඳහන් සහතික පත්‍රවල පිටපත් ඇමිණිය යුතුය.

(අ) උප්පැන්නය ලියා පදිංචි කිරීමේ සහතිකය.

සැ. යු.—බව්තිස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා ව්‍යවස්ථා සංග්‍රහය පරිදි නිකුත් කරන ලද උප්පැන්න සහතිකය හෝ පිළිගනු නො ලැබේ.

(ආ) ලබාගත් උසස්ම ශාස්ත්‍රීය සුදුසුකම් පිළිබඳ සහතික පත්‍රය හා සිංහල භාෂාවෙන් සාමර්ථය ලත් උසස් ම සහතික පත්‍රය.

(ඉ) චරිත සහතික දෙකක්, ඉන් එකක් තම ප්‍රදේශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගෙන් විය යුතුය.

6. සේවයට භාර ගැනීමේ හා සේවා කොන්දේසි.—(i) මෙම තනතුරු ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.

(ii) මෙම තනතුරු වලට පත්වීම ලබන්නන් විසින් විශ්‍රාම වැටුප ට දායක වීම අවශ්‍යය. පත්වීම ලබන පිරිමි අපේක්ෂකයන් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට ද දායක විය යුතුය.

(iii) පත්වීම ලබන්නන් දැනටමත් ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත රජයේ සේවයේ නියුක්තව නො සිටිත් නම්, ඔවුන්ගේ පත්වීම අවුරුදු 3 ක ආධුනික කාලයකට යටත් වේ. දැනටමත් ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත රජයේ සේවයේ නියුක්ත වූවිත් අවුරුද්දක කාලයක් තනතුරෙහි වැඩ බැලීම අවශ්‍ය වේ.

(iv) පත්වීම සඳහා තෝරාගනු ලබන්නන්, දිවයිනේ කවර ප්‍රදේශයක හෝ සේවය කළ යුතුය.

(v) රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහාත්, විශේෂ යෙන්ම වර්ෂ 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පණතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත්, දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන් ම මින්මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූලව පත්වීම් ලබන්නන් ක්‍රියා කළ යුතුය.

7. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන්ගේ අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු වේ.

8. අයදුම්පත් හා ඒ පිළිබඳ වෙනත් ලිපි ස්ථිර ලේකම් වෙත එවිය යුතු අතර මෙම අමාත්‍යාංශයේ වෙනයම් නිලධාරියෙකු නමට පෞද්ගලිකව නො එවිය යුතුය.

9. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්වීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි වෙත අවධානය යොමු කරවනු ලැබේ.

10. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම් පත් පිළිගනු නො ලැබේ. තැපැලේ දී සිදු වන ප්‍රමාදයන් වෙතොත් එය මග හැරවීම සඳහා සිය අයදුම්පත් කල්වේලා ඇතිව ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුවන්ට දැනුම් දෙනු ලබේ.

පී. උඩගම,
ස්ථිර ලේකම් හා අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්.

1970 සැප්තැම්බර් මස 11 දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

## ආදර්ශ අයදුම් පත්‍රය

### උපාධි අපේක්ෂක විද්‍යා ගුරු පත්වීම්

1. සම්පූර්ණ නම :————.

2. ලිපිනය :————.

3. ස්ත්‍රී පුරුෂ භාවය :————.

4. විවාහක අවිවාහක බව :————.

(විවාහක නම් ස්වාමිපුරුෂයා/භාර්යාව රජයේ සේවකයෙක්ද/සේවිකාවක්ද) (විස්තර සඳහන් කරන්න).

5. අයදුම්කරුගේ උපන් දිනය :————.

6. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඉ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තා :————.

(ඊ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මී මුත්තා :————.

7. ජාතිය :————.

(ලාංකික වූයේ පරම්පරාවෙන්ද ලියාපදිංචි කිරීමෙන්ද ?) :

8. අධ්‍යාපනික සුදුසුකම් :—

(i) උපාධි අපේක්ෂකයෙක්ද ? :————.

(ii) උපාධියට ගන්නා ලද විෂයයන් :————.

(iii) විශ්ව විද්‍යාලය :————.

(iv) වර්ෂය :————.

9. සිංහල පිළිබඳ සුදුසුකම් :————.

10. වෘත්තීය සුදුසුකම් තිබේ නම් ඒ පිළිබඳ විස්තර :————.

11. කලින් සේවය :————.

12. (i) ගුරුවරයකු/වරියක වශයෙන් :—

(අ) ලියාපදිංචි කළ අංකය :————.

(ආ) සේවා විස්තර :————.

පාසලේ නම :————.

................. දින සිට ................. දින දක්වා දරූ තනතුරු :————.

(ii) වෙනත් රජයේ සේවකයෙකු/සේවිකාවක වශයෙන් දරූ තනතුරු :————.

................. දින සිට ................. දින දක්වා

13. ගුරුවරයකු/වරියක හෝ රජයේ සේවකයකු/සේවිකාවක හෝ වශයෙන් සේවය අවසන්/අත්හිටුවීම ඉල්ලා අස්වීම/නිදහස් කිරීමට හේතුව (සම්පූර්ණ විස්තර සඳහන් කළ යුතුය) :————.

ඉහත සඳහන් විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත්, මා රජයේ සේවයෙන් පහකරනු ලැබූවකු නොවන බවත්, රජයේ සේවය හැර ගිය අයකු ලෙස සළකා සේවය නතර කිරීමක් සිදුවී නැති බවත්, උත්පත්තියෙන්/ලියාපදිංචි කිරීමෙන් මා ලාංකිකයෙකු බවත්, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට මා සතුටු බවත්, මෙයින් සහතික කරමි. මෙම අයදුම් පත්‍රයෙහි දක්වෙන යම්කිසි කරුණක් වැරදි බව හෝ අසත්‍ය බව හෝ මා තෝරා ගැනීමට පෙර එළිදරව් වුවහොත් එයින් මා නුසුදුස්සකු වන බවත්, එම දෝෂය පත් කිරීමෙන් පසුව එළිදරව් වුවහොත් කිසිදු වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකරනු ලැබිය හැකි බවත්, මම පිළිගනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

9–774—70.9.18 දින අංක 14,924 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන අමාත්‍යාංශය

### රජයේ ගුරු විද්‍යාලයන්හි අභ්‍යාසාචාර්ය/ආචාරිනී තනතුරු (සිංහල හා දෙමළ මාධ්‍ය)

ඉහත කී තනතුරු සඳහා අයදුම් පත් කැඳවමින්, අංක 14,906 හා 1970.5.15 දින දරණ රජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද දැන්වීමට අවධානය යොමු කරවනු ලැබේ. මෙම තනතුරු සඳහා අයදුම් පත් භාර ගන්නා අවසාන දිනය 1970 ඔක්තෝබර් 2 දක්වා දීර්ඝ කරනු ලැබේ.

2. කලින් ප්‍රසිද්ධ කළ දැන්වීම අනුව අයදුම්පත් එවන ලද අයදුම් කරුවන් නැවත ඉල්ලුම් කිරීම අනවශ්‍යය.

ප්‍රේමදාස උඩගම,
අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 සැප්තැම්බර් මස 10 වන දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

9–770—70.9.18 දින අංක 14,924 දරන ගැසට් පත්‍රය

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

මගේ අංකය : ආර්ඔජ්./340.

## ලංකාණ්ඩුවේ විභාග දෙපාර්තමේන්තුව

### රජයේ සංගීත විද්‍යාලයයේ සහ රජයේ නැටුම් හා මුද්‍රා නාට්‍ය විද්‍යාලයයේ විභාග ප්‍රතිඵල—1970

පහත නම් සඳහන් අයදුම්කරුවෝ රජයේ සංගීත විද්‍යාලයයේ අවසාන පරීක්ෂණයෙන් සමත්යහ.

1 වැනි පංතිය : (ගායනය)
කිසිවෙකු නැත.

1 වැනි පංතිය : (වාදනය)
කිසිවෙකු නැත.

2 වැනි පංතිය : (ගායනය)

| | නම | | විභාග අංකය |
|---|---|---|---|
| | | | බී |
| 1. | පෙරේරා, එල්ලිකා ශ්‍රීමතී | ... | 56 |
| 2. | වැදිසිංහ, ඩී. ඒ. ... | ... | 65 |
| 3. | රත්නායක, ආර්. එම්. බී. | ... | 68 |
| 4. | ආතාවුද, ඩී. ඩී. එන්. | ... | 77 |

2 වැනි පංතිය : (වාදනය)
කිසිවෙකු නැත.

3 වැනි පංතිය : (ගායනය)

| | | | |
|---|---|---|---|
| 1. | ප්‍රනාන්දු, කේ. සී. | ... | 67 |
| 2. | කන්නන්ගර, ජී. | ... | 72 |

3 වැනි පංතිය : (වාදනය)

| | | | | | භාණ්ඩය |
|---|---|---|---|---|---|
| 1. | ජේ.තිපාල, එච්. ඒ. | ... | 55 | ... | වයලීනය |
| 2. | පෙරේරා, එල්ලිකා ශ්‍රීමතී | ... | 56 | ... | එස්රාජ් |
| 3. | චන්ද්‍රසේන, කේ. ඒ. | ... | 57 | ... | බටනලාව |
| 4. | තිලකරත්න, පී. කේ. | ... | 58 | ... | තබලාව |
| 5. | වික්‍රමසිංහ, ආර්. එස්. | ... | 60 | ... | සිතාරය |
| 6. | වික්‍රමසිංහ, ඉරන්දතී | ... | 62 | ... | සිතාරය |
| 7. | දෙව්ගිරි ,චන්ද්‍රා පී. | ... | 66 | ... | එස්රාජ් |
| 8. | තියඩෝර්, පී. ඒ. ඩී. ජේ. | ... | 73 | ... | සිතාරය |

පහත නම් සඳහන් අයදුම්කරුවෝ රජයේ සංගීත විද්‍යාලයයේ මධ්‍යම පරීක්ෂණයෙන් සමත්යහ.

| | නම | | විභාග අංකය | | භාණ්ඩය |
|---|---|---|---|---|---|

1 වැනි පංතිය : (ගායනය)

| | | | |
|---|---|---|---|
| | | | බී |
| 1. | කරුණාරත්න, කේ. විනීතා | ... | 5 |

1 වැනි පංතිය : (වාදනය)
කිසිවෙකු නැත.

2 වැනි පංතිය : (ගායනය)

| | | | |
|---|---|---|---|
| 1. | ජයසේකර, එච්. ඩී. පී. එස්. | ... | 2 |
| 2. | බන්දුමතී, කේ. ... | ... | 3 |
| 3. | චන්ද්‍රලතා, පී. කේ. පී. | ... | 6 |
| 4. | ප්‍රනාන්දු, ආර්. ටී. ජී. | ... | 8 |
| 5. | රුදිගු, එම්. ඩී. විමලසිරි | ... | 14 |
| 6. | මෙන්ඩිස්, හැරල්ඩ් | ... | 16 |
| 7. | සෝමසිලි, පී. ... | ... | 17 |
| 8. | ජයවික්‍රම, කනකලතා | ... | 21 |
| 9. | යසවතී, එස්. පී. ... | ... | 22 |
| 10. | පළිහුමැණිකේ, පී. කේ. ජී. | ... | 26 |
| 11. | රාජසිංහ, එල්. කේ. | ... | 28 |

2 වැනි පංතිය : (වාදනය)

| | | | | | භාණ්ඩය |
|---|---|---|---|---|---|
| 1. | පළිහුමැණිකේ, පී. කේ. ජී. | ... | 26 | ... | වයලීනය |
| 2. | රාජසිංහ, එල්. කේ. | ... | 28 | ... | වයලීනය |
| 3. | වරසකෝන්, ඒ. ... | ... | 46 | ... | වයලීනය |
| 4. | ධර්මදස, එම්. ඩබ්. | ... | 49 | ... | එස්රාජ් |

3 පංතිය : (ගායනය)

| | | | |
|---|---|---|---|
| 1. | සුනිලාවතී, එස්. ඩබ්. | ... | 4 |
| 2. | පෙරමුණආරච්චි, එච්. පී. ඒ. පී. ඩී. ... | | 11 |
| 3. | ප්‍රේමදස, එස්. ඩී. | ... | 15 |
| 4. | වර්ණකුලසූරිය, මෙරී | ... | 19 |
| 5. | ඒකනායක, කේ. එම්. | ... | 31 |

3 වැනි පංතිය : (වාදනය)

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | සුනිලාවතී, එස්. ඩබ්. | ... | 4 | | එස්රාජ් |
| 2. | නානායක්කාර, පී. | ... | 9 | ... | සිතාරය |
| 3. | වර්ණකුලසූරිය, මෙරී | ... | 19 | ... | වයලීනය |
| 4. | ජයවික්‍රම, කේ. ... | ... | 21 | ... | වයලීනය |
| 5. | යසවතී, එස්. පී. ... | ... | 22 | ... | වයලීනය |
| 6. | රූපවතී, ඩබ්. ඒ. ඩී. | ... | 24 | ... | වයලීනය |
| 7. | සෝමාවතී, එම්. පී. | ... | 25 | ... | වයලීනය |
| 8. | වික්‍රමසිංහ, ජේ. ජී. ඒ. | ... | 34 | ... | වයලීනය |
| 9. | ගුණවර්ධන, කේ. ඒ. | ... | 44 | ... | වයලීනය |
| 10. | විජේසූරිය, ඩී. අයි. | ... | 45 | ... | වයලීනය |

පහත නම් සඳහන් අයදුම්කරුවෝ රජයේ නැටුම් හා මුද්‍රා නාට්‍ය විද්‍යාලයයේ පහත දක්වෙන පරීක්ෂණ වලින් සමත්ය හ.

| | නම | | විභාග අංකය |
|---|---|---|---|

පරීක්ෂණය : උඩරට නැටුම් උපාධි අවසාන විභාගය

1 වැනි පංතිය :
කිසිවෙකු නැත.

2 වැනි පංතිය :

| | | | |
|---|---|---|---|
| 1. | අමරසේන, බී. ඒ. ජී. | ... | ඒ6 |
| 2. | සරත් ලාල් පනාවල | ... | 8 |

3 වැනි පංතිය :

| | | | |
|---|---|---|---|
| 1. | ඒකනායක, ඩී. ඒ. | ... | 1 |
| 2. | කුසුමාවතී, එස්. එම්. | ... | 2 |
| 3. | මොඩිපාරිස්, එම්. එම්. | ... | 4 |
| 4. | කුලතුංග, සී. එස්. බී. | ... | 5 |
| 5. | සෝමාවතී, පී. එම්. | ... | 9 |
| 6. | බණ්ඩාර, ඩබ්. ජේ. | ... | 11 |

පරීක්ෂණය : පහත රට නැටුම් උපාධි අවසාන විභාගය

1 වැනි පංතිය :
කිසිවෙකු නැත.

2 වැනි පංතිය :
කිසිවෙකු නැත.

3 වැනි පංතිය :

| | | | |
|---|---|---|---|
| 1. | හේමන්ත කුමාර, ඒ. ජී. එස්. | ... | 37බී |

පරීක්ෂණය : උඩරට නැටුම් සහතික පත්‍ර පන්තිය

1 වැනි පංතිය :
කිසිවෙකු නැත.

2 වැනි පංතිය :

| | | | |
|---|---|---|---|
| 1. | සු.්නලතා, එම්. පී. | ... | 13 |
| 2. | නිමලා චන්්‍රවතී, ප්‍රනාන්දු | ... | 33 |

3 වැනි පංතිය :

| | | | |
|---|---|---|---|
| 1. | චන්දනා ජයන්තී, එස්. එම්. එම්. | ... | 12 |
| 2. | චිත්‍රලේ.ා රත්නායක | ... | 14 |
| 3. | තෙන්නකෝන්, පී. ආර්. | ... | 15 |
| 4. | .න්ද්‍රා රා.කරුණා | ... | 16 |
| 5. | අමරා ඉන්.්‍ර රණවීර | ... | 17 |
| 6. | වසන්ත මල්ලව ... | ... | 18 |
| 7. | ජයසූරිය, ඩී. එස්. | ... | 19 |
| | | | ඒ |
| 8. | ලීලාවතී, එම්. පී. ... | ... | 20 |
| 9. | රූප.ාතී, කේ. ඒ. | ... | 22 |
| 10. | කුසුමා දන්දෙණිය | ... | 23 |
| 11. | ජයා.ත්න, කේ. ජී. ජී. එම්. | ... | 24 |
| 12. | අමර වතී, ජේ. එම්. | ... | 26 |
| 13. | කරුණාවතී, කේ. ඩී. | ... | 28 |
| 14. | පුංචිබණ්ඩා, යූ. ජී. | ... | 29 |
| 15. | රත්නායක, ජේ. ටී. | ... | 31 |
| 16. | විමලරත්න, එන්. පී. | ... | 34 |
| 17. | ප්‍රේමවර්ධන, එම්. ඩබ්. | ... | 35 |
| 18. | විජේරත්න, මල්ලිකා | ... | 36බී |

පරීක්ෂණය : පහත රට නැටුම් මධ්‍යම සහතික පත්‍ර විභාගය

1 වැනි පංතිය :

| | | | |
|---|---|---|---|
| 1. | රනවීර, කේ. එස්. ... | ... | 39 |
| 2. | සිරිමා රමණී, එච්. පී. | ... | 40 |
| 3. | සිරිල් ප්‍රනාන්දු, කේ. | ... | 41 |

2 වැනි පංතිය :

| | | | |
|---|---|---|---|
| 1. | පියදස, එච්. ඩී. සී. | ... | 38 |
| 2. | චන්ද්‍රසේන, එම්. ඩී. | ... | 42 |
| 3. | ගුණවර්ධන, ඒ. එන්. | ... | 43 |

කේ. ටී. ඩබ්ලිව්. සුමනසූරිය,
විභාග කොමසාරිස්.

1970 සැප්තැම්බර් මස 4 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
විභාග දෙපාර්තමේන්තුවේ දිය.

9–561—70.9.18 දින අංක 14,924 දරන ගැසට් පත්‍රය

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## රජයේ සැපයීම් දෙපාර්තමේන්තුව

### 1970-71 මුදල් වර්ෂය සඳහා වයර් සහ විදුලි සැපයීම

ඉහත සඳහන් සැපයීම සඳහා අංක 14,917 හා 1970.7.31 දින ගැසට් පත්‍රයේ පළවූ ටෙන්ඩර් කොන්දේසිවලට පහත සඳහන් කොන්දේසි දෙකද ඇතුලත් කර ඇති බව ටෙන්ඩර් කිරීමට බලාපොරොත්තු වන ටෙන්ඩර්කරුවන් කරුණාවෙන් සටහන් කරගන්නා.

ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් ඉදිරිපත් කරන අවස්ථාවේදී තමන්ගේ මිල ගණන් දෙවදෑරුම් අන්දමකින් ඉදිරිපත් කළ යුතුය. එනම්, ණය සහ ණය බල ගිවිසුම් යටතේ ද, කෙලින්ම තම විනිමය වැයකර ගෙන්වීම් ක්‍රමයටද : වයර් සහ විදුලි සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ටෙන්ඩර් මිල ගණන් වෙන වෙනම සඳහන් කළ යුතුය.

ටෙන්ඩර් අයදුම් පත් සලකා බලන විට ණය සහ ණය බල ගිවිසුම් යටතේ ලබාගැනීම තමන්ගේ විනිමය වැය කර ලබාගැනීමට වඩා සුදුසුකමක් හැටියට සලකන බවද ටෙන්ඩර්කරුවන් සටහන් කර ගත යුතුය.

ඇස්. ඒ. පී. රූපසිංහ,
රජයේ සැපයීම් අධ්‍යක්ෂ.

1970.9.18.
කොළඹ දී ය.

9-767—70.9.18 දින අංක 14,924 දරන ගැසට් පත්‍රය

---

## රජයේ සැපයීම් දෙපාර්තමේන්තුව

කොළඹ රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය: තැ. පෙ. 418, කොළඹ 2.) මෙරට සෑදූ කම්බි ඇණ සැපයීම සඳහා 1970 ඔක්තෝබර් මස 13 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

ටෙන්ඩර් විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ, ශ්‍රීමත් සිත්තම්පලම් ගාඩිනර් මාවතේ, රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තැනගෙන් ෆෝරම් කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 50 ක් රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1970 ඔක්තෝබර් මස 12 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝරම් කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

ඇස්. ඒ. පී. රූපසිංහ,
රජයේ සැපයීම් අධ්‍යක්ෂ.

1970 සැප්තැම්බර් මස 18 වැනි දින,
කොළඹ දීය.

9-772—70.9.18 දින අංක 14,924 දරන ගැසට් පත්‍රය

---

## ආහාර දෙපාර්තමේන්තුව

### ප්‍රයෝජනයට ගත නොහැකි ගෝනි හා රෙදි උර

කොළඹ වාමස් ධාන්‍යාගාරවල හා මැනිං වෙළඳ සැලෙහි තිබෙන 73,117 ක් පමණ වූ ප්‍රයෝජනයට ගත නොහැකි ගෝනි හා රෙදි උර මිළදී ගැනීම සඳහා ටෙන්ඩර් පත් 1970 ඔක්තෝබර් 2 වැනි දින සිකුරාදා සවස 2.30 දක්වා කොළඹ 2, අංක 330, යූනියන් පෙදෙසේ ආහාර දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ.

රු. 500 ක් තැන්පත් කිරීමෙන් පසුව මෙම කාර්යාලයෙන් ලබාගත හැකි ෆෝරම් වල ටෙන්ඩර් පිළියෙල කල යුතුය. ටෙන්ඩර් පිළිබඳ විස්තර වාර්තාවක් මෙම කාර්යාලයෙන් ඉල්ලුම් කළවිට ලබා ගත හැකිවේ.

පී. නවරාජා,
ආහාර කොමසාරිස් වෙනුවට.

1970 සැප්තැම්බර් මස 10 වැනි දින,
330, යූනියන් පෙදෙස, කොළඹ 2.

9-751—70.9.18 දින අංක 14,924 දරන ගැසට් පත්‍රය

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

කොළඹ 7, ජාතික පොළෙහි පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් වෙළඳ හලේ සහ කොළඹ මරදානේ ට්‍රිපොලි වෙළඳ හලේ එකතු වන කුළුබඩු හිස් ගෝනි, අල හා රතුළූණු හිස් ගෝනි, දියලුනු හිස් ගෝනි සහ කෑලි ගෝනි, 1970.10.1 සිට 1970.12.31 දක්වා කාලයට මිළදී ලබාගන්නට කරගෙන යෑම සඳහා මිල ගණන් කොළඹ 1, අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970 සැප්තැම්බර් මස 30 වන දින අ. භා. 2.30 දක්වා භාරගනු ලැබේ.

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට රු. 100 ක මුදලක් තැන්පත් කොට ලබාගන්නා කුවිතාන්සිය අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයට ඉදිරිපත් කිරීමෙන් 1970 සැප්තැම්බර් මස 30 දින දහවල් 12 දක්වා මිල ගණන් ෆෝරම් ලබා ගත හැක. මිල ගණන් ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුය.

ගෝනි මිළදී ගැනීම සඳහා දැනට දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇති වෙළෙඳුන්ගෙන් තැන්පත් මුදල් අවශ්‍ය නොවේ.

වැඩි විස්තර කොළඹ 1, අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් දැන ගැනීමට පිළිවන.

එන්. වාමදේව,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1970.9.11 දින,
කොළඹ 1,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව.

9-750—70.9.18 දින අංක 14,924 දරන ගැසට් පත්‍රය

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

කොළඹ 1, චැතැම් වීදියේ පිහිටා තිබූ [illegible] ද්‍රව්‍ය වෙළඳ සැලට අයත්ව තිබූ කළුවර, බුරුත සහ පොල් ලී ආදියෙන් කළ විවිධ ප්‍රමාණයන්ගෙන් යුත් ලී අලි තොගයන් මිළදී ලබාගෙන කරගෙන යාම සඳහා මිල ගණන් කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ බී. එස්. එස්. අයි. ගොඩනැගිල්ලේ පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970 ඔක්තෝබර් මස 4 දින අ. භා. 2.30 දක්වා භාර ගනු ලැබේ. මෙම ලී අලි තොගයන් පරීක්ෂා කර බැලීම සඳහා කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ බී. එස්. එස්. අයි. ගොඩනැගිල්ලේ පිහිටි අලෙවි කිරීමේ කොමසාරිස් වෙත ලියා අවසර ලබා ගත යුතුය.

තමන් විසින්ම පිළියෙල කරගත් මිල ගණන් පිටපත් දෙකකින් යුක්තව, අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත 1970 ඔක්තෝබර් මස 4 දින අ. භා. 2.30ට පෙර ලැබෙන සේ එවිය යුතුය.

වැඩි විස්තර අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

එන්. වාමදේව,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1970. 9. 10 දින,
කොළඹ 1,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව.

9-691—70.9.18 දින අංක 14,924 දරන ගැසට් පත්‍රය

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

පුත්තලම, පොම්පරිප්පු හි, දඩයම් රැකවල් සහ දඩයම් මුරකරු සඳහා නිවාසයක් තැනීමට සීල් කරන ලද ටෙන්ඩර්පත්‍ර කොළඹ 1, ඇව්ලන් චතුරශ්‍රයේ වන සත්ව සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වන සත්ව සංරක්ෂණ අධ්‍යක්ෂ විසින් 1970 ඔක්තෝබර් මස 10 වන දින දහවල් 12 දක්වා භාරගනු ලැබේ.

2. 1970 ඔක්තෝබර් මස 5 වැනි දින පස්වරු 3 දක්වා කාර්යාල වේලාවන්හිදී, ආපසු ගෙවිය හැකි රු. 50ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ගෙවීමෙන් ටෙන්ඩර් ෆෝර්ම මෙම කාර්යාලයෙන් ලබා ගත හැකිය.

3. මෙම සේවාව සඳහා ටෙන්ඩර් බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ "පොම්පරිප්පුහි දඩයම් රැකවල් සහ දඩයම් මුරකරු සඳහා නිවාසයක් තැනීමට ටෙන්ඩර්" යනුවෙන් ලියාපදිංචි කරන ලද තැපෑලෙන් එවීම හෝ මෙම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය.

4. ගොඩනැගිල්ලේ නිර්මාණය හා අයපත්‍රය මෙම කාර්යාලයේ දී 1970 ඔක්තෝබර් මස 5 වන දින දක්වා කාර්යාල වේලාවන් තුළ දී පරීක්ෂා කළ හැකිය.

5. ටෙන්ඩරයට අදාළ කොන්දේසි ටෙන්ඩර් ෆෝර්මයේ සඳහන් කර ඇත.

ඩබ්ලිව්. එල්. ඊ ද අල්විස්,
වැඩබලන අධ්‍යක්ෂ.

1970.9.10 වන දින,
කොළඹ 1,
වන සත්ව සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ දී ය.

9–720—70.9.18 දින අංක 14,924 දරන ගැසට් පත්‍රය

---

## වන සත්ව සංරක්ෂණ දෙපාර්තමේන්තුව

නුවරඑළියේ හෝර්ටන් තැන්නේ පිහිටි "ඇන්ඩර්සන්" බංගලාවට අවශ්‍ය අතිරේක අළුත්වැඩියා කිරීම් සඳහා සීල් කරන ලද ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ඇව්ලන් චතුරශ්‍රයේ වන සත්ව සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වන සත්ව සංරක්ෂණ අධ්‍යක්ෂ විසින් 1970 ඔක්තෝබර් මස 10 වන දින දහවල් 12 දක්වා භාරගනු ලැබේ.

2. 1970 ඔක්තෝබර් මස 5 වන දින පස්වරු 3 දක්වා කාර්යාල වේලාවන්හිදී, ආපසු ගෙවිය හකි රු. 50ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ගෙවීමෙන් ටෙන්ඩර් ෆෝර්ම මෙම කාර්යාලයෙන් ලබා ගත හැකිය.

3. මෙම සේවාව සඳහා ටෙන්ඩර් බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ "ඇන්ඩර්සන් බංගලාවේ අතිරේක අළුත්වැඩියා කිරීම් සඳහා ටෙන්ඩර්" යනුවෙන් ලියා, ලියාපදිංචි කරන ලද තැපෑලෙන් එවීම හෝ මෙම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය.

4. ගොඩනැගිල්ලේ නිර්මාණය හා අයපත්‍රය මෙම කාර්යාලයේ දී 1970 ඔක්තෝබර් මස 5 වන දින දක්වා කාර්යාල වේලාවන් තුළ දී පරීක්ෂා කළ හැකිය.

5. ටෙන්ඩරයට අදාළ කොන්දේසි ටෙන්ඩර් ෆෝර්මයේ සඳහන් කර ඇත.

ඩබ්ලිව්. එල්. ඊ ද අල්විස්,
වැඩබලන අධ්‍යක්ෂ.

1970.9.10 වන දින,
කොළඹ 1,
ඇව්ලන් චතුරශ්‍රයේ
වන සත්ව සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ දී ය.

9–721—70.9.18 දින අංක 14,924 දරන ගැසට් පත්‍රය

---

## සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව—දෙහිවල

1970.8.28 දින ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ සත්වෝද්‍යානයට ආහාර ද්‍රව්‍ය සැපයීම සඳහාවූ ටැන්ඩර් දැන්වීම් දෙකේ සඳහන් ටැන්ඩර් පත් භාරගැනීම 1970 සැප්තැම්බර් මස 23 වැනි බදාදා උදේ 10 වන තෙක් නැවතත් දීර්ඝ කොට ඇත. 1970.9.21 දින උදේ 10 දක්වා ටැන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ.

ඩබ්. එල්. ඊ. ද අල්විස්,
සත්වෝද්‍යාන අධ්‍යක්ෂ.

1970 සැප්තැම්බර් මස 11 වැනි දින,
දෙහිවල සත්වෝද්‍යානයේ දිය.

9-748

---

## නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

### ටෙන්ඩර් දැන්වීමයි

වාලච්චෙනෙයි පිහිටි නැගෙනහිර කඩදාසි කර්මාන්ත ශාලාවට සිමෙන්ති මලු නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය රීල්වලින් යුත් මලු ක්‍රාෆ්ට් කඩදාසි දිග ටොන් 3,000 ක් සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබේ.

ටෙන්ඩර් භාර ගැනීම 1970 නොවැම්බර් මස 24 දයින් අවසන් වේ.

ටෙන්ඩර් පත්‍රිකා සහ වෙනත් විස්තර සඳහා ප්‍රධාන නිෂ්පාදනකරුගේ/සැපයුම්කරුගේ නම සහ ලිපිනයන් සඳහන් කළ ලියවිල්ලක් ඉදිරිපත් කිරීමෙන් තැපෑලෙන් හෝ පැමිණ හෝ ලබාගත හැකිය.

ති. බ. නාරන්පනාව,
සාමාන්‍යාධිකාරී,
නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය.

356, යූනියන් පෙදෙස,
කොළඹ 2.

9–737/1—70.9.18 දින අංක 14,924 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—පිඹුරත්තෑව උප කොටස

පහත සඳහන් වැඩ සඳහා පොළොන්නරුවේ ඊසාන කොටසේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1970 ඔක්තෝබර් මස 16 වැනි සිකුරාදා පෙරවරු 10 වන තෙක් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 35,000 කට හෝ ඊට වැඩියෙන් ලියාපදිංචි කොන්ත්‍රාත් කරුවන්ට, සමූපකාර සහ ග්‍රාම සංවර්ධන සමිතිවලින් ටෙන්ඩර් කැඳවනු ලැබේ:—

(1) පිඹුරත්තෑවේ ප්‍රධාන ඇළේ සැතපුම් 1 සිට 7 දක්වා පිඹුරී ගෑසීම,

(2) 1970/71 මුදල් වර්ෂයේදී අඟල් 1½" සහ ¾" ගල් සැපයීම.

2. පිඹුරත්තෑව, පොලොන්නරුව, කවුඩුල්ල සහ මින්නේරිය වාරිමාර්ග කාර්යාලයන්හි ඉංජිනේරුතැනගේ කාර්යාලවලින් 1970 ඔක්තෝබර මස 12 වැනි දින දක්වා කාර්යාල වේලාවන් තුළදී ලබාගත හැකි ටෙන්ඩර් ආකෘති පත්‍ර පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ආකෘති සහ ලේඛන [illegible] කොන්ත්‍රාත්කරුවකු වශයෙන් ලියාපදිංචිවී ඇති රෙජිස්ටර් පොත සහ දැනට රජය යටතේ කරනු ලබන කොන්ත්‍රාත් වැඩ පිළිබඳ සහතිකයක් ඉදිරිපත් කළ යුතුය. කොළඹ හැර ඕනෑම කච්චේරියක රු. 50ක ටෙන්ඩර් ඇප මුදලක් එක් ටෙන්ඩරයක් සඳහා වෙනම තැන්පත්කොට ලබාගත් කුවිතාන්සි පතක් ඉදිරිපත් කළ පසු පමණක් ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ඇත.

3. වැඩි විස්තර අවශ්‍ය වෙතොත් පිඹුරත්තෑවේ වාරිමාර්ග ඉංජිනේරුතැනගෙන් ලබාගත හැක.

පී. කන්දසාමි,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
පිඹුරත්තෑව උ. කො.

වාරිමාර්ග කාර්යාලය,
අරලගන්විල, මනම්පිටිය හරහා.

9–[illegible]—70.9.18 දින අංක 14,924 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—පිඹුරත්තාව උප කොට්ඨාශය

1970-71 යන මුදල් වර්ෂයන් සඳහා පිඹුරත්තාව උප කොට්ඨාශයේ බඩු බාහිරාදිය ප්‍රවාහනය කිරීම සඳහා ඊශාන කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1970 සැප්තැම්බර් මස 24 වෙනි බ්‍රහස්පතින්දා පෙරවරු 10 වන තෙක් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000 හෝ ඊට වැඩියෙන් ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන් සහ සමූපකාර සහ ග්‍රාමසංවර්ධන සමිති වලින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

2. ටෙන්ඩර් කිරීමට සුදුසුකම් ඇත්තේ අඩු වශයෙන් ලොරි රථ තුනක් තමා නමින් ටෙන්ඩර් ඉල්ලුම් කරන අවස්ථාවේදී තිබෙන කොන්ත්‍රාත්කරුවන්ට වන අතර ටෙන්ඩර්පත ඉල්ලුම් කරනවිට තමා නමින් ඇති වාහන ලියාපදිංචිකිරීමේ සහතික හා ඒ ඒ වාහන සඳහා 1970 වර්ෂය වෙනුවෙන් නිකුත් කළ බලපත්‍රද ඉදිරිපත් කළ යුතුය.

3. පිඹුරත්තාව, පොලොන්නරුව, හිඟුරක්ගොඩ, සහ කවුඩුල්ල වාරිමාර්ග කාර්යාලයන්හි ඉංජිනේරු තැනගේ කාර්යාලවලින් 1970 සැප්තැම්බර් මස 20 දින දක්වා කායාලය වේලාවන් තුළ ලබාගත හැකි ටෙන්ඩර් ෆෝර්ම පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර ඉල්ලුම් කරනවිට තමා කොන්ත්‍රාත්කරුවකු වශයෙන් ලියාපදිංචිවී ඇති රෙජිස්ටර් පොත සහ දැනට රජය යටතේ කරනු ලබන කොන්ත්‍රාත් වැඩ පිළිබඳ සහතිකයක්ද ඉදිරිපත් කළ යුතුය. කොළඹ හැර දිවයිනේ ඕනෑම කච්චේරියක රු. 25 මුදලක් තැන්පත්කොට ලබාගත් රිසිට් පතක් ඉදිරිපත් කළ පසු පමණක් ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ඇත.

4. වැඩි විස්තර අවශ්‍ය වේනොත් වාරිමාර්ග ඉංජිනේරු තැන, පිඹුරත්තාව වෙතින් ලබාගත හැකිය.

පී. කන්දසාමි,
වාරිමාර්ග ඉංජිනේරු,
පිඹුරත්තාව.

වාරිමාර්ග කායාලයය,
අරලගන්විල, මනම්පිටිය.
1970.8.18 දින.

9-563—70.9.18 දින අංක 14,924 දරන ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් පහත සඳහන් ද්‍රව්‍ය පේරාදෙණියේ ගන්නොරුවේ පිහිටි සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයට ලබාගැනීම සඳහා 1970–71 මුදල් වර්ෂය නිමිත්තෙන් ටෙන්ඩර් පත්‍ර 1970 සැප්තැම්බර් මස 20 වෙනි දින දවල් 12.00 වන තෙක් භාරගනු ලැබේ.

| | පේරාදෙණියේ සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයට දළ වශයෙන් 70–71 මුදල් වර්ෂය තුළදී උවමනා කරන ප්‍රමාණය |
|---|---|
| (1) පාන් (අවුන්ස 16 ට නොඅඩු) ... | රු. 10,000 පමණ |
| (2) ගවමස් (1) කටු සහිත ... (2) කටු රහිත ... | රු. 3,000 පමණ |
| (3) එළුමස් (1) කටු සහිත ... (2) කටු රහිත ... | රු. 1,000 පමණ |
| (4) විවිධ සැපයීම :— | |
| 1. බේකන්, ස්ට්‍රීකි ... ... | රු. 100 පමණ |
| 2. බේකන්, බැක් ... ... | රු. 75 පමණ |
| 3. සොසේජස් (මෙරට) ... ... | රු. 200 පමණ |
| 4. අළුත් බටර් ... ... ... | රු. 800 පමණ |
| 5. බටර් කේක් ... ... | රු. 400 පමණ |
| 6. ප්‍රෘට් කේක් ... ... | රු. 200 පමණ |
| 7. ජෑම් රෝල් ... ... ... | රු. 200 පමණ |
| 8. විස්කෝතු රාත්තලේ පැකැට් (ජින්ජර් නට්, මාරී, නයිස්, ලෙමන් පෆ්, නස්ටඩ් ක්‍රීම්, ක්‍රිස්කෝ, වේෆර්ස්, ක්‍රීම් ක්‍රැකර් ආදිය) පැකැට් ... ... ... | 1,000 පමණ |

(5) රෙදි ඇපිල්ලීම :—මේස රෙදි, ඇඳ ඇතිරිලි, කොට්ට උර, අත්පිසිනාකඩ දූවිලි පිසිනාකඩ, පෙරවැසුම්, කනප්පු රෙදි, ජනෙල් තිර, වීදුරු බඩු පිසිනා තුවා, ටරේ රෙදි, සහ කුස්සියේ පාවිච්චි කරන තුවා, ඩොයිලි, තුවා, සරොන්, බැනියම්, කෝට්.

2. පේරාදෙණියේ ගන්නොරුවේ පිහිටි සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයෙන් ෆෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායෙහි එව්ය යුතුයි. සියළුම ටෙන්ඩර් පත්‍ර ලියුම් කවරයක දමා සීල් තබා " සභාපති, ටෙන්ඩර් මණ්ඩලය, ව්‍යාප්ති අංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය " යනුවෙන් එහි පිට ලියා එහිම මුදුන් කෙළවරේ " පේරාදෙණියේ සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයට අලුත් බටර් සැපයීම " (වෙනත් ද්‍රව්‍යයක් නම් ඒ ද්‍රව්‍යයෙහි නම යෙදිය යුතුයි) යන්න ලියා එව්ය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දින දවල් 10.00 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම දෙනු ලැබේ. ඒ දීම කරනු ලබන්නේ එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 10ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. මේ තැන්පත් කිරීම පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක කළ යුතුයි. පොරොන්දු පත්‍රයක් අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ. පත් කර ගනු ලැබූ ටෙන්ඩර් කරුවාට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වා දින 7 ක් ඇතුළත දී අවශ්‍ය ඇපය තැබීමට හෝ ගිවිසුම් පත්‍රය අත්සන් කිරීමට හෝ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුලත් වෙන්නට ඉඩ තිබේ.

4. ටෙන්ඩර් පත්‍ර ලියා පදිංචි කළ තැපෑලෙන් එව්ය යුතුයි. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් නොඑවුවහොත් ටෙන්ඩර් කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් විසින්, පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති අංශයේ ටෙන්ඩර් කටයුතු කරන ලිපිකරුට ඒවා අතින්ම භාර දිය යුතුයි. ටෙන්ඩර් බහාලන ලද කවරයෙහි " පේරාදෙණියේ සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයට........................(ද්‍රව්‍යයේ නම) සැපයීම " යන්න ලියා ටෙන්ඩර් කරුවාගේ නම සහ ලිපිනයද ඇතුළත් කළ යුතුයි. ලියා පංදිචි කළ තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණ බව ඒවා විවෘත කරණ දිනයේදී සියළුම ටෙන්ඩර් කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින 4 ක් ඇතුළත යම් ටෙන්ඩර් කරුවෙකුට එවැනි දන්වීමක් නොලැබුනහොත් ඔහු පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිගෙන් ඒගැන කරුණු වහාම විමසිය යුතුයි.

5. ටෙන්ඩර් කරුවන්ට වුවමනානම් ටෙන්ඩර පත්‍ර විවෘත කරන වේලාවේදී ඉදිරියෙහි සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් භාර ගැනීම නැවැත්වීමට නියමිත ඉහත කී දිනයේදී ඉහත කී වේලාවට පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිගේ කායාලයේදී ඒවා විවෘත කරනු ලැබේ.

6. නියමිත ෆෝර්මයේ ලියා නැති නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටු වී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක්, ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නො ලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිළි ලෙය තීන්ත වලින් ලකුණු කළ යුතුවාත් හැර, ඒවා සම්බන්ධයෙන් යම් කිසි වෙනසක් කළ හොත්, ඒ තැන්වල ටෙන්ඩර් කරුගේ කෙටි අත්සන තැබිය යුතුවේ.

7. ටෙන්ඩර් කරුවන් තම ලිපිනය පැහැදිළි ලෙස අකුරෙන් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍රයේ සඳහන්වූද, පිළිගනු ලැබූවාවූද, ද්‍රව්‍යවල මුළු වියද මෙන් සියයට 5 ක ඇප මුදලත් කෘෂිකර්ම අධ්‍යක්ෂගේ නමින් තැන්පත් කිරීමටත්, පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමටත් ,පත්කර ගනු ලැබූ ටෙන්ඩර් කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙනු ලබන්නේ කොන්ත්‍රාත්තුව ඉටු කළ පසුවය. මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකළ හොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වෙනවා පමණක් නොව, ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුලත් වෙනවා ඇත.

9. ගිවිසුම් පත්‍රයට ඇලවිය යුතු මුද්දර වල වටිනාකම පත් කර ගනු ලැබූ ටෙන්ඩර් කරුවා විසින් ගෙවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වූ දින සිට, සති තුනක් යනතුරු ටෙන්ඩර් කරුවන් තම ටෙන්ඩර් පත්‍ර සැළකිල්ලට භාජනය කිරීමට ඉඩ තැබිය යුතුයි.

10. යම කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර් පත්‍ර හෝ ප්‍රතික්ෂෙප කිරීමේත්, ටෙන්ඩර් පත්‍රයක යම් කිසි කොටසක් පිළිගැනීමේත් බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත තබා ගනු ලැබේ.

11. මේ කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩ කරවා ගැනීමට, පුහුණු හා නුපුහුණු හා දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟ වෙන අතර, ඔවුහු පමණක් එසේ නියුක්ත කරනු ලබන්නාහ. ඒ කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගනු ලබන්නේ, වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරිනි.

කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසිය සපුරාලීමට කොන්ත්‍රාත්කරුවා යම්කිසි විධියකින් අසමත් වුවහොත්, කොන්ත්‍රාත්තුව අවලංගු වීමට එය හේතු වෙනවා ඇත. එහෙත් කොන්ත්‍රාත්තුවට එළඹෙන ලද නිලධාරියා විසින් විශේෂ අවස්ථාවලදී කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වරයාගේ එකඟත්වය ඇතිව, නිශ්චිතව ලියවිල්ලකින් එකී නිළධාරියා විසින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැක.

එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීම තහනම් වන අතර, එය කොන්ත්‍රාත්තුව කඩ කිරීමක් ලෙස සලකනු ලැබේ.

මේ කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා "ලාංකික" යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රටවැසියෙකු අදහස් කෙරෙණ අතර, එවැන්නෙක් එකී පාඨයට ඇතුලත් වෙයි. මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යෙදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරණ වූද, කම්කරුවනට වේතන ගෙවීම සම්බන්ධයෙන් දනට බල පවත්වන සහ මින් මතු ක්‍රියාත්මක විය හැකි සියළුම රෙගුලාසි වලට අනුකූල වූද වේතනයක් ගෙවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟවෙයි.

කොන්ත්‍රාත්කරු විසින් එකී වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පත පොත, චැක්රෝල් පොත්, පෙරටවු පොත් සහ අනිකුත් ලිපි ලේඛන පරීක්ෂා කර බැලීමට කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් විධිමත්ව බලය දෙනු ලැබූ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඕනෑම නිළධාරියකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩ දීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

12. කොන්ත්‍රාත්කරුට භාර දිය යුතු සියළුම දන්වීම් ඔහුගේ අතට දුන හොත් හෝ ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපැලෙන් යැව්ව හොත්, හෝ ඔහුගේ අතටම භාර දුන්නා ලෙස සලකනු ලැබේ.

13. 1934 අංක 19 දරණ කම්කරු වන්දි ආඥපනත (117 වැනි පරිච්ඡෙදය) යටතේ තමාගේ යම් කිසි සේවකයෙකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත් ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරුවා විසින් ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

14. වැඩට ගැනීමට නුසුදුසු යයි කල්පනා කරනු ලබන යම්කිසි කම්කරුවකු කොන්ත්‍රාත්කරුවා විසින් වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ බලය ආණ්ඩුව වෙත තබා ගනු ලැබේ.

15. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවේ නම් තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමඟ හෝ නම ඇතුලත් වූ හෝ තමාට සැහේයයි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන විරුද්ධ වන හෝ කිසිවෙකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

16. වැඩි විස්තර පේරාදෙණියේ ගන්නොරුවේ සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයේ කෘෂිකර්ම නිළධාරී තැනගෙන් දනගත හැකිය.

ඊ. අබේරත්න,
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (ව්‍යාප්ති).

1970 අගෝස්තු මස 20 වෙනි දින,
පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දී ය.

9-538—70.9.18 දින අංක 14,924 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### අළුත් ගෝනි සැපයීම සඳහා ටෙන්ඩර්

අළුත් ගෝනි 2,50,000 ක් සැපයීම සඳහා ටෙන්ඩර් 1970 ඔක්තෝබර් මස 18 වැනි දින අ. භා. 2.30 තෙක් පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් ඉදිරිපත් කළ යුත්තේ පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ව්‍යාප්ති) ගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවලය.

3. 1970 ඔක්තෝබර් මස 17 වැනි දින දහවල් 12 වන තෙක් ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කෙරෙනු ලැබේ. මෙම ආකෘති පත්‍ර නිකුත් කරනු ලබන්නේ ඕනෑම කච්චේරියක හෝ පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂගේ අංක 37 දරණ ගිණුමට කොළඹ යෝර්ක් වීදියේ ලංකා බැංකුවේ දී රු. 100 ක මුදලක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළහොත් පමණි.

4. වැඩි විස්තර පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ව්‍යාප්ති) තැනගෙන් ලබාගත හැක.

ඊ. එල්. එෆ්. අබේරත්න,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

1970 සැප්තැම්බර් මස 7 වැනි දින,
පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දීය.

9-684—70.9.18 දින අංක 14,924 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

1970 ඔක්තෝබර් මස 23 වෙනි දින පෙ. ව. 10.30 දක්වා මෙහි පහත සඳහන් පාලම සෑදීම සඳහා කොළඹ 1, තැ. පෙ. 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

"ගලේවෙල පත්කොලගොල්ල පාරේ පළල අඩි 15 × උස අඩි 10 පාලමක් සෑදීම."

2. ටෙන්ඩර් පත්‍ර, කොළඹ 1, තැ. පෙ. 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත ලියාපදිංචි කළ තැපැලෙන් යැවිය යුතුය. නැතහොත් ගාලු මුවදොර මහ ලේකම් කාර්යාලයේ 3 වෙනි මාලයේ, අංක 357 දරණ කාමරයේ තබා ඇති පෙට්ටියේ බහාලිය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර මාතලේ දිසාපති කාර්යාලයේ ඉඩම් අංශයෙන් 1970 ඔක්තෝබර් මස 20 වෙනි දින පෙ. ව. 10.30 වන තෙක් ලබා ගත හැක. මෙසේ ලබා ගන්නා ටෙන්ඩර් ෆෝර්ම හැර වෙනත් ටෙන්ඩර් ෆෝර්මවලින් ඉදිරිපත් කරන ටෙන්ඩර් පත්‍ර හා ටෙන්ඩර් දැන්වීමේ සඳහන්ව ඇති කොන්දේසිවලට අනුකූල නොවන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ ඉඩම් කොමසාරිස් කාර්යාලයේ හෝ ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රුපියල් 50 ක් තැන්පත් කර ඒ වෙනුවෙන් ලබා ගන්නා කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් ෆෝර්ම ලබාගත හැකිය. ටෙන්ඩර් ෆෝර්ම පිටපත් දෙකකින් යුක්තව එවිය යුතු අතර, එසේ එවනු ලබන ටෙන්ඩර් පත්‍ර මුද්‍රා තබන ලද කවරයක බහා එවිය යුතුය. ලියුම් කවරයේ වම් කෙළවරේ ටෙන්ඩරයේ නම සඳහන් කළ යුතුය.

5. තෝරා ගනු ලබන ටෙන්ඩර්කරු විසින් පිළිගත් ටෙන්ඩරයේ මුළු මුදලින් සියයට 5 ක මුදලක් ඇප වශයෙන් තැබිය යුතුයි. එසේම ටෙන්ඩර්කරු විසින් තම ටෙන්ඩරය පිළිගත් බවට දැනුම් දීමෙන් දින හතක් ඇතුළත දී වැඩ ගිවිසුමක් අත්සන් කිරීමට සූදානම්ව සිටිය යුතුයි. ටෙන්ඩරය භාරගත් බව සඳහන් වන ලියවිල්ල ඔහුට පුද්ගලිකව භාර දීමෙන් හෝ ඔහු විසින් දී ඇති ලිපිනයට ලියාපදිංචි කළ තැපැලෙන් යැවීමෙන් හෝ ඔහුට ඒ බැව් දැන්වූ බව පිළිගන්නවා ඇත. මෙසේ දැනුම් දීමෙන් පසුව ගිවිසුම් පත්‍රය අත්සන් තැබීම අතපසු කළහොත් හෝ ප්‍රතික්ෂේප කළහොත් ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කරනු ලැබේ.

6. කිසිදු හේතුවක් නොදක්වා සියළුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීම හෝ ඕනෑම ටෙන්ඩරයක් හෝ ටෙන්ඩරයක කොටසක් පිළිගැනීම හෝ ටෙන්ඩර් මණ්ඩලය සතුය.

7. මාතලේ දිසාපතිතැනගෙන් අවසරයක් නොලබා වැඩ ගිවිසුම් පත්‍රය වෙන අයෙකුට පැවරීමට හෝ භාර දීමට හෝ පුළුවන්කමක් නැත. එසේම පත්කරනු ලබන ටෙන්ඩර්කරු වැඩය කරන ප්‍රදේශයේ අවශ්‍යතාවයේ හැටියට පුහුණු හෝ නුපුහුණු හෝ ලාංකික කම්කරුවන් සේවය සඳහා යෙදවිය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍ර ලබාගත හැක්කේ ලියාපදිංචි කළ කොන්ත්‍රාත්කරුවන්ට ඔවුන්ගේ ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කිරීමෙන් ය. ලියාපදිංචි නොවූ අය තමාට රුපියල් 25,000 වටිනා කොන්ත්‍රාත්තුවක් කිරීමට හැකියාවක් ඇති බවට තමා පදිංචි කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරිතැනගෙන් සහතිකයක් ඇතිව පැමිණිය යුතුයි.

9. ලියාපදිංචි සමූපකාර සමිති හා ග්‍රාම සංවර්ධන සමිතිවලට ටෙන්ඩර් ෆෝර්ම ලබා ගැනීමට මුදල් තැන්පත් කිරීම අවශ්‍ය නැත. නමුත් සමිති ලියාපදිංචි කළ බවට හා වැඩය භාරගෙන කිරීමට හැකියාවක් ඇති බවට ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රාදේශීය නිලධාරීන්ගෙන් ලබාගත් සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි. තවද, වැඩය භාරගෙන කිරීමට සතුටු බව ප්‍රකාශ කරන සමිතියේ සම්මත කරගත් වාර්තාවක පිටපතක් ද ඉදිරිපත් කළ යුතුයි.

10. වැඩි විස්තර අවශ්‍ය නම් මාතලේ දිසාපති කාර්යාලයේ ඉඩම් අංශයෙන් ලබාගත හැක.

ඩී. කේ. ඇහැලේපොල,
මාතලේ දිසාපති වෙනුවට.

1970. 9. 5 වෙනි දින,
මාතලේ දිසාපති කාර්යාලයේ දීය.

9-593—70.9.18 දින අංක 14,924 දරන ගැසට් පත්‍රය

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### ඉරාපු පරණ ලී මිලයට ගැනීම සහ ඉවත් කර ගැනීම

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත්, පදවිය ලී මෝලේ ඇති ඉරාපු පරණ ලී මිලයට ගැනීම සහ ඉවත් කර ගැනීම සඳහා අනුරාධපුර ඉඩම් සංවර්ධන නිලධාරි විසින් 1970 ඔක්තෝබර් 5 වැනි දින දවල් 12 දෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ. ලී ප්‍රමාණය පහත සඳහන් කර ඇත :—

| | | |
|---|---|---|
| (1) 3″ × 2″ අඩි 4 සිට 18 දක්වා කෑලි | ... | 6,406 |
| (2) 4″ × 2″ අඩි 5 සිට 20 දක්වා කෑලි | ... | 3,062 |
| (3) 4″ × 3″ අඩි 3 සිට 18 දක්වා කෑලි | ... | 3,154 |
| (4) 5″ × 3″ අඩි 2 සිට 13 දක්වා කෑලි | ... | 18 |
| (5) නොයෙක් ප්‍රමාණයේ කලවම් ලී කෑලි | ... | 481 |
| (6) රීප්ප දිග් අඩි 4,024 හොඟ එකයි | | |

2. ඉහත සඳහන් ලී කායාිල වේලාවන් තුළ පදවිය ලී මෝලේදී පරීක්ෂාකර බැලීමට පිළිවන.

3. මෙම ලැයිස්තුවට අයත් ලී සියල්ලම හෝ ඉන් කොටසක් හෝ ඉල්ලුම් කිරීමට ඉල්ලුම්කරුවනට හැකිකම තිබේ. එහෙත් ඉල්වන එක් එක් අංකයන් යටතේ මිළ ගණන් වෙන් වෙන්ව සඳහන් කළ යුතුය.

4. මගේ කායාිලයේ හෝ ඕනෑම කච්චේරියක රු. 50 ක් තැන්පත් කොට ලබාගත් රිසිට් පතක් ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් ආකෘති පත්‍ර 1970 ඔක්තෝබර් මස 5 වැනි දින පෙරවරු 10.30 දක්වා මගේ කායාිලයෙන් ලබාගත හැකිය.

5. සෑම ටෙන්ඩර් පත්‍රයකම වම්පස මුදුණේ "ඉරාපු පරණ ලී මිළදී ගැනීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් ද, "කවරයේ වම්පස පහළින් ටෙන්ඩර්කරුගේ නමද" ලිපිනයද ලියා මුද්‍රා තබා ඉඩම් සංවර්ධන නිලධාරි, අනුරාධපුර, යන ලිපිනයට ලියාපදිංචි කරන ලද තැපෑලෙන් එවීම හෝ මගේ කායාිලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීම හෝ කළ හැක. සෑම ටෙන්ඩරයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය.

6. එම ටෙන්ඩර් පත් 1970 ඔක්තෝබර් මස 5 වැනි දින පස්වරු 2.30 ට අනුරාධපුර ඉඩම් සංවර්ධන කායාිලයේදී විවෘත කරනු ලැබේ. අවශ්‍ය යැයි හැඟේ නම් ටෙන්ඩර්කරුවනට හෝ ඔවුන්ගේ නියෝජිතයෙකුට එම අවස්ථාවේදී පැමිණ සිටීමට පිළිවන.

7. තෝරාගත් ටෙන්ඩර්කරුවන් විසින් ඒ බව ඔහුට දන්වා සතියක් ඇතුළත නියමිත මුදල් මෙම කායාිලයට ගෙවා සති දෙකක් ඇතුළත දී ඉවත් කර ගත යුතුයි. නියමිත කාල සීමාව තුළ ඉවත් නොකර ගබඩාවේ ඉතිරිවන ලී නැවත විකිණීම හෝ වෙනත් සුදුස්සක් කිරීමේ බලය මා වෙත පැවරේ.

8. (අ) ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනයට කලින් ටෙන්ඩරය අස් කර ගන්නා බැව් නොදැන්වීම, (ආ) ටෙන්ඩරය භාර ගන්නා අවසාන දිනයට හා වේලාවට ඉදිරිපත් නොකිරීම, (ඇ) ටෙන්ඩරය පිළිගත් බැව් දැන්වීමෙන් පසු නියමිත කාල සීමාව තුළදී මුදල් නොගෙවා සිටීම හෝ ලී ඉවත් කර නොගැනීම, තැන්පත් මුදල් රාජසන්තක කිරීමටත් සමහරවිට රජයේ කොන්දේසි කඩ කළ කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයට ඇතුළත් කිරීමටත් හේතු වනවා ඇත.

9. කිසිම හේතුවක් නොදන්වා ඕනෑම ටෙන්ඩරයක් හෝ ඉන් කොටසක් හෝ සියලුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂෙප කිරීමේ අයිතිය මගේ භාරයේ පවතිනු ඇත.

එන්. බී. එෆ්. භාරතී,
ඉඩම් සංවර්ධන නිලධාරි,
අනුරාධපුරය.

1970 ක්වූ සැප්තැම්බර් මස 5 වැනි දින,
අනුරාධපුර ඉඩම් සංවර්ධන කායාිලයේ දිය.

9–600—70.9.18 දින අංක 14,924 දරන ගැසට් පත්‍රය

---

## ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

### බඩු බාහිරාදිය ලොරිවලින් ප්‍රවාහණය කිරීමේ සේවාව, බදුල්ල/බිබිල

කොළඹ 10, තැ. පෙ. අංක 355, රේල්වේ ඇවනියුහි, ලංකා දුම්රිය සේවයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් බදුල්ල/බිබිල ප්‍රදේශයෙහි හා බදුල්ල දුම්රිය ස්ථානයට හෝ එම දුම්රිය ස්ථානයෙහි සිට හෝ බිබිල බාහිර නියෝජ්‍යස්ථානයට සහ එම දුම්රිය ස්ථානය හා බාහිර නියෝජ්‍යස්ථානයට සේවය කරන අවට ප්‍රදේශයන්වද මුදල්, බඩු, පාර්සල් සහ අනිකුත් සෑම වර්ගයක්ටම අයත් බඩු බාහිරාදිය 1970 නොවැම්බර් මස පළමුවැනිදා සිට 1972 සැප්තැම්බර් මස 30 වෙනිදා දක්වා වූ කාලය තුළ ප්‍රවාහණය කිරීම සඳහා 1970 ඔක්තෝබර් මස 12 වෙනි සඳුදා පූ. භා. 11 වන තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ. තව වසියකට මෙම කොන්ත්‍රාත්තුව දීර්ඝ කිරීමේ අභිමතය දුම්රිය සේවයේ ටෙන්ඩර් මණ්ඩලය සතුව ඇත.

බඩු බාහිරාදිය ප්‍රවාහණය කිරීම සඳහා ටොන් එකකට සැතපුමකට අයකරන ගාස්තුව ද, නිතිපතා නියමිත වේලාවන්ට දිනකට එක් වරක් බදුල්ල දුම්රිය ස්ථානය සහ බිබිල බහිර නියෝජ්‍ය ස්ථානය අතර යැම්-ඊම් කරන ලොරියෙන් හෝ ලොරිවලින් දිනපතා මුදල් සහ සෑම වර්ගයකම බඩු බාහිරාදිය පිළිගත් කාලසටහන අනුව ගෙන යාමට අයකරන මාසික ගාස්තුවක් ද ටෙන්ඩර්කරු විසින් සඳහන් කළ යුතුය. මෙසේ ඉදිරිපත් කරන ලද මිළ ගණන් වලින් දෙපාර්තමේන්තු ගාස්තුව වශයෙන් සියයට 10 ක් අඩු කර ගනු ලැබේ. බඩු ප්‍රවාහණය සඳහා ටොන් එකකට සැතපුමකට අයකරන වඩාත්ම යෝග්‍ය ගාස්තු ප්‍රමාණය ඉදිරිපත් කරන ටෙන්ඩර්කරු ගැන වැඩි සැලකිල්ලක් දක්වනු ඇත.

කොළඹ දුම්රිය දෙපාර්තමේන්තුවේ වාණිජ අධිකාරිගෙන් ලබාගත් ටෙන්ඩර් පෝර්මවල පමණක් ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් ලියකියවිලිවල මිළ වශයෙන් රු. 10 ක මුදලක් ද, ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 500ක මුදලක් ද ගෙවා ටෙන්ඩර් ලියවිලි සහ මේ පිළිබඳ අනිකුත් සියලු තොරතුරු, 1970 ඔක්තෝබර් මස 11 වෙනි ඉරිදා පස්වරු 3 වනතෙක් එකී දුම්රිය දෙපාර්තමේන්තුවේ වාණිජ අධිකාරිගෙන් ලබාගත හැකිය.

ටෙන්ඩර් පත්‍රයක් නිකුත් කිරීමට ප්‍රථම ටෙන්ඩර්කරුට අයත් ලොරිවල ලියාපදිංචි කරන ලද හැඳින්වීමේ අංක හා නියමිත බර ප්‍රමාණයද, නිවැරදි බවට මෝටර් රථ ප්‍රවාහණ කොමසාරිස්ගෙන් හෝ බලපත්‍ර අධිකාරියෙන් සහතිකයක් ඉදිරිපත් කළ යුතුය. හොණ්ඩර 20 හෝ හොණ්ඩර 40 හෝ ලොරියක් අවශ්‍ය වූ විට, එය සැපයීමට ටෙන්ඩර්කරුට අපහසු නම් ඒ වෙනුවට වැඩි බර ප්‍රමාණයක ලොරියක් යොදවා අවශ්‍ය බර ප්‍රමාණයට පමණක් ගාස්තුව ලබා ගන්නා බවට ද ටෙන්ඩර්කරු ලියවිල්ලකින් පොරොන්දු විය යුතුය.

ලොරිවල අයිතිය හා ටෙන්ඩර් තැන්පත් මුදල් පිළිබඳ නියමයන් ගෙන් ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති නිදහස් වේ.

ටෙන්ඩර්කරුවන් මෙම සේවය යටතේ වූ වැඩ කරවාගැනීමට පුහුණු හා නුපුහුණු හා දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යොදවා ගත යුතුය. ඒ කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගත යුත්තේ වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරිනි.

ඉහත සඳහන් සේවාව බාරගෙන එය සතුටුදායක අන්දමින් ක්‍රියාවේ යෙදවීමට ටෙන්ඩර්කරුට ධන ශක්තියක් ඇති බවට ලියවිලි ටෙන්ඩර්කරු විසින් ඉදිරිපත් කළ යුතුයි.

ටෙන්ඩර් කොන්දේසි හා පොදු කොන්ත්‍රාත්තු කොන්දේසි සමග ටෙන්ඩර්පත්‍ර මුද්‍රා තබා "සභාපති, ටෙන්ඩර් මණ්ඩලය, ලංකා දුම්රිය සේවය, තැ. පෙ. අංක 355, කොළඹ 10" කියා ලිපිනය යොදා, ලියාපදිංචි කරන ලද තැපෑලෙන් 1970 ඔක්තෝබර් මස 12 වෙනි සඳුදා පූ. භා. 11 ට ප්‍රථම ලැබීම පිණිස එවිය යුතුය. නොඑසේ නම් ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් ටෙන්ඩර් පත් ඇතුළත් මුද්‍රා තැබූ කවරයේ පිටපැත්තේ සේවා විස්තර සඳහන් කර, එවැනි ටෙන්ඩර් භාරගැනීමට ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් බලය පවරන ලද නිලධාරියාට බාරදී, එය ලැබුණු බවට ඔහුගෙන් කුවිතාන්සියක් ලබාගත යුතුය.

ටෙන්ඩර් පත් 1970 ඔක්තෝබර් මස 12 වෙනි සඳුදා අ. භා. 2 ට කොළඹ 10, තැ. පෙ. අංක 355, රේල්වේ ඇවනියුහි, ලංකා දුම්රිය සේවයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති ගේ කාර්යාලයේ දී විවෘත කරනු ලැබේ. එම වේලාවට එහි පැමිණ සිටීමට කැමති ටෙන්ඩර්කරුවන්ට ඊට අවසර දෙනු ලැබේ.

වී. ඊ. තවරත්න,
වැඩ බලන දුම්රිය සාමාන්‍යාධිකාරී.

තැ. පෙ. අංක 355,
කොළඹ 10,
1970 සැප්තැම්බර් මස 10 වෙනිදා.

9–747—70.9.18 දින අංක 14,924 දරන ගැසට් පත්‍රය

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

මරදාන දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුවේ හා දෙමටගොඩ දුම්රිය ගබඩා අංශයේ ඇති ගැළුම් 45හේ හිස් තෙල් පීප්ප 2,500 මිලයට ගෙන ඉවත් කර ගැනීමේ ටෙන්ඩර් පත්‍ර දුම්රිය මූලස්ථාන ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ලිපිනය, දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය, තැ. පෙ. 355, කොළඹ, 1970 ඔක්තෝබර් මස 18 වෙනි දින පෙ. ව. 11 වනතෙක් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කිරීමට පෙර, අවශ්‍ය වුවහොත් ටෙන්ඩර්කරු විසින් ඉහත සඳහන් සේවා භාරගැනීමට සහ සතුටු දායක ලෙස ඉටුකිරීමට තමාගේ මුදල් තත්ත්වය ප්‍රමාණවත් බව ඔප්පු කිරීමට අදාලවන ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.

3. කොළඹ 10 හි දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් ලබාගත හැකි පෝර්ම කොලවල ටෙන්ඩරය ලියා අනුපිටපතක් ද සගිතව එවිය යුතුය.

4. ටෙන්ඩර් තැන්පත් මුදල බශයෙන් රු. 1,000 ක් කොළඹ 10 හි දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරි කාර්යාලයෙහි දී හෝ කොළඹින් පිටතම ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1970 ඔක්තෝබර් 16 වෙනිදා දහවල් 12 තෙක් ටෙන්ඩර් පෝර්ම කොල නිකුත් කරනු ලැබේ.

5. 1970 ඔක්තෝබර් 18 වෙනි දින පෙ. ව. 11.05 ට දුම්රිය සාමාන්‍යාධිකාරි කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට පෙනීසිටීමට අවසර ඇත.

6. වැඩිමනත් විස්තර අවශ්‍යනම්, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් ලබාගත හැක.

ඇම්. සරීන්,
දුම්රිය සාමාන්‍යාධිකාරි වෙනුවට.

කොළඹ, 1970.9.18.

9-768—70.9.18 දින අංක 14,924 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

### ගැලුම් 45/46 ප්‍රමාණයේ පීප්ප විකිණීම

දිවයිනේ සියලු ලං. ග. ම. භූමිභාගවලින් ගැලුම් 45/46 හිස් පීප්ප හා පිළිස්සුණු තෙල් සහිත පීප්ප කොන්ත්‍රාත්තු ක්‍රමයට මිලදී හැර ගෙන යාම සඳහා ටෙන්ඩර් පත්‍ර 1970.10.11 වෙනි දින පෙරවරු 10 වනතෙක් කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහි පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ.

වේරහැර මාගේ කාර්යාලයෙන් ලබාගත හැකි පෝර්ම මගින් ටෙන්ඩර ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර පෝර්ම සඳහා රු. 100 (ආපසු ගෙවනු ලබන) සුරක්ෂිතයක් තැන්පත් කළ යුතුය.

වැඩි විස්තර මාගේ කාර්යාලයෙන් ලබාගත හැකිය.

සම්පාදක කොට්ඨාශය, ප්‍රධාන සම්පාදක නිලධාරී තැන.
වේරහැර, බොරලැස්ගමුව.

9-732—70.9.18 දින අංක 14,924 දරන ගැසට් පත්‍රය

---

## ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව

### ආයුධ මාණේ සැපයීම සඳහා ටෙන්ඩරය

1970 නොවැම්බර් මස 16 වැනි දින පෙරවරු 10 වන තෙක් ආයුධ මාණේ සැපයීම සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ. රුපියල් 100 ක ආපසු ලබාගත හැකි ටෙන්ඩර් තැන්පත් මුදලක් ගෙවා අවශ්‍ය ටෙන්ඩර් පෝර්ම කොළ මෙම කාර්යාලයෙන් ලබාගත හැක. ටෙන්ඩර් තැන්පත් මුදල් 1970 නොවැම්බර් මස 15 වැනි දින දහවල් 12න් පසු බාරගනු නොලැබේ. අවලංගු කරන ලද ටෙන්ඩර්පත් රුපියල් 10 ක් ගෙවීමෙන් ලබාගත හැක.

මිලට ගැනුම් කළමනාකරු.

ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව,
තැ. පෙ. අංක 670,
242, හැව්ලොක් පාර,
කොළඹ 5.

9-740—70.9.18 දින අංක 14,924 දරන ගැසට් පත්‍රය

---

## තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

### තෙල් පෙරනයන් සැපයීම

තෙල් පෙරනයන් සැපයීම සහ ගෙනවුත් භාරදීම සඳහා කොළඹ 1, ලෝටස් පාරේ තැපැල් සහ විදුලි සන්දේශ මූලස්ථාන ගොඩනැගිල්ලේ පස්වන මහලේ ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු විසින් 1970 ඔක්තෝබර් මස 10 වෙනි දින පෙ. ව. 10 දක්වා ටෙන්ඩර්පත් භාරගනු ලැබේ.

2. කොළඹ 1, තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථාන ගොඩනැගිල්ලේ, පස්වන මහලේ, ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු කාර්යාලයෙන් ලබාගත් පෝර්මවලින් පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර්පත් ඉදිරිපත් කළ යුතුය. ඉහත සඳහන් කාර්යාලයේදී ටෙන්ඩර් ලියකියවිලි පරීක්ෂා කර බැලීමට ද, අවශ්‍ය විස්තර දැන ගැනීමටද පුළුවන.

3. තැපැල් කාර්යාලයක හෝ මධ්‍ය විදුලි පණිවුඩ කාර්යාලයේ විදුලි පණිවුඩ කැෂියර් වෙත ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රු. 50ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක්, ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමෙන් 1970 ඔක්තෝබර් මස 5 වෙනි දින දවල් 12 වනතෙක් බලාපොරොත්තු ටෙන්ඩර්කරුවනට ටෙන්ඩර් ඉල්ලුම්පත් ලබාගත හැකිය.

වී. අලගරත්නම්,
ප්‍රධාන විදුලි සන්දේශ ඉංජිනේරු.

ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු කාර්යාලය,
පස්වන මහල,
තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථානය,
ලෝටස් පාර, කොළඹ 1.

9-746—70.9.18 දින අංක 14,924 දරන ගැසට් පත්‍රය

---

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

නුවරඑළිය කලුකැලේ නිවාස යෝජනා ක්‍රමයෙහි වෙළඳසැල් කුටිවල් ඉදි කිරීම සඳහා 1970 ඔක්තෝබර් මස 12 දින පෙරවරු 10 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනුයේ 1970 ඔක්තෝබර් මස 2 දින දහවල් 12 දක්වා පමණි. වැඩි විස්තර මෙම දෙපාර්තමේන්තුවේ අධිකාරි ඉංජිනේරු තැන ගෙන් ලබාගත හැක.

අයි. ඒ. සී. ප්‍රනාන්දු,
නියෝජ්‍ය කොමසාරිස්.

ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
කොළඹ 2.

9-745—70.9.18 දින අංක 14,924 දරන ගැසට් පත්‍රය

---

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

බත්තරමුල්ලේ සුභූතිපුර සහ ජයන්තිපුර නිවාස ක්‍රමයන්හි නිවාසයනට සපයා ඇති ජල සම්බන්ධතාවල වතුර මීටර් සවිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබේ. මීටර් දෙපාර්තමේන්තුව මගින් සැපයේ.

ටෙන්ඩර් පත් 1970 ඔක්තෝබර් මස 9 දින දහවල් 12 දක්වා නිකුත් කරන අතර 1970 ඔක්තෝබර් 16 දින පෙරවරු 10 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

වැඩි විස්තර මෙම දෙපාර්තමේන්තුවේ අධිකාරි ඉංජිනේරු තැන ගෙන් ලබාගත හැක.

අයි. ඒ. සී. ප්‍රනාන්දු,
වැඩ බලන ජාතික නිවාස කොමසාරිස්.

ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
කොළඹ 2.

9-744—70.9.18 දින අංක 14,924 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1970 ඔක්තෝබර් මස 9 වැනි දින පෙරවරු 10 වන තෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර කුරුණෑගල අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ.

| පාඨශාලාවේ නම | වැඩෙහි ස්වභාවය |
| --- | --- |
| කු/බුළුවල මහා විද්‍යාලය ... | විද්‍යාගාරය |

සංක්ෂේපය.—කු=කුරුණෑගල දිස්ත්‍රික්කය.

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශ කාර්යාලයේ රු. 100 ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය කුරුණෑගල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් අංක 1 සඳහා රු. 40,000 හෝ ඊට වැඩි ගණනකට අධ්‍යාපන අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1970 ඔක්තෝබර් මස 8 වැනි දින දහවල් 12 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත්කරනු ලැබේ. (වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000 කට අඩු වැඩ සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට සුදුස්සෝ නොවෙත්.) චැක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාර ගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාර දීමේ කුවිතාන්සි කොළඹ 2, මැල් වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ කුරුණෑගල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබාගත හැක. මුදල් භාර දීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියාපදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක් ය.

3. දෙවැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයට අධ්‍යාපන අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති අනුමත සමිතිවලට ද ටෙන්ඩර් පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍ය වේ. ඔවුන් දෙවැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර 2 වැනි හා 3 වැනි ඡේදවල සඳහන් පරිදි කුරුණෑගල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධ සියළු විස්තර දැනගත හැකි අතර සැලැස්ම ආදියද බලා ගත හැක. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත් ලියාපදිංචි තැපෑලෙන් කුරුණෑගල අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුයි. තැපෑලෙන් නො එවන ටෙන්ඩර් පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් පුද්ගලිකව කුරුණෑගල අධ්‍යාපන කාර්යාලයේ පාලන සහකාර වෙත භාර දිය යුතුය. එසේ භාර දුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබා ගත යුතුයි.

5. 1970 ඔක්තෝබර් මස 9 වැනි ද පෙරවරු 10 ට කුරුණෑගල අධ්‍යාපන කාර්යාලයේ දී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා මිල ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් කළ දින සිට සති හයක් ගත වන තුරු තමන් සඳහන් කරන ලද මිල ගණන් වලට එම වැඩය කිරීමට ටෙන්ඩර්කරුවන් කැමති විය යුතුයි.

7. තවත් අවශ්‍ය විස්තරයක් වෙතොත් කුරුණෑගල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගේ කාර්යාලයෙන් ලබා ගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂා කර බැලීම සඳහා මෙම කාර්යාලයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේ දී 66.9.30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව කොන්ත්‍රාත් කරුවන්ගේ ලියාපදිංචි කිරීම් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් කරන ලද ලියාපදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

බී. බී. රත්නායක,
ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, කුරුණෑගල.

1970 සැප්තැම්බර් මස 6 දින,
කුරුණෑගල අධ්‍යාපන කාර්යාලයේ දී ය.

9–643—70.9.18 දින අංක 14,924 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව—කළුතර

1970 ඔක්තෝබර් මස 9 වැනිද පෙ. ව. 10.30 වන තෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර කළුතර ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාර ගනු ලැබේ.

| පාඨශාලාවේ නම | වැඩයේ ස්වභාවය |
| --- | --- |
| (1) ක/කටුකුරුන්ද ගුරු විද්‍යාලය | ආවරණය කරන ලද ගෙමග තැනීම. |
| (2) ක/මියුසියස් ගුරු විද්‍යාලය ... | ගිලන් කාමරය තැනීම. |
| (3) ක/මියුසියස් ගුරු විද්‍යාලය ... | කථිකාචාර්ය නිල නිවාසයක් තැනීම. |
| (4) ක/කටුකුරුන්ද ගුරු විද්‍යාලය | කථිකාචාර්ය නිල නිවාසයක් තැනීම. |
| (5) ක/මියුසියස් ගුරු විද්‍යාලය ... | ආදර්ශ බාලාංශ පන්ති කාමරය තැනීම. |
| (6) ක/කටුකුරුන්ද ගුරු විද්‍යාලය | දේශන ශාලා තැනීම. |

සංක්ෂේපය.—ක=කළුතර දිස්ත්‍රික්කය.

2. කළුතර ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ කළුතරින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශ කාර්යාලයේ රු. 100 ක මුදලක් තැන්පත්කර එම කුවිතාන්සිය කළුතර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් අංක 1 දරණ වැඩය සඳහා රු. 15,000 කට ද, අංක 2 දරණ වැඩය සඳහා රු. 25,000 කට ද, අංක 3, 4, 5 දරණ වැඩය සඳහා රු. 40,000 කට ද, අංක 6 දරණ වැඩය සඳහා රු. 50,000කට ද, හා ඊට වැඩි ගණනකට අධ්‍යාපන අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1970 ඔක්තෝබර් මස 8 වැනිද ප. ව. 3.30 දක්වා ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. චැක්පත්, මුදල් ඇනවුම්, තැපැල් ඇනවුම් ආදිය භාරගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාරදීමේ කුවිතාන්සි කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ කළුතර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් හෝ ලබාගත හැක. මුදල් භාරදීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියාපදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක් ය.

3. දෙවැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයකට අධ්‍යාපන අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති අනුමත සමිතිවලටද ටෙන්ඩර් පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍ය වේ. ඔවුන් දෙවැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර 2 වැනි හා 3 වැනි ඡේදවල සඳහන් පරිදි කළුතර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධ සියළුම විස්තර දැනගත හැකි අතර සැලැස්ම ආදියද බලා ගත හැක. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත් ලියාපදිංචි තැපෑලෙන් කළුතර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපෑලෙන් නොඑවන ටෙන්ඩර් පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයකු විසින් පුද්ගලිකව කළුතර අධ්‍යාපන කාර්යාලයේ, කාර්යාල සහකාර වෙත භාරදිය යුතුයි. එසේ භාර දුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

5. 1970 ඔක්තෝබර් මස 9 වැනිද පෙ. ව. 10.30 ට කළුතර අධ්‍යාපන කාර්යාලයේ දි ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවේ දී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා මිල ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් කළ දින සිට සති හයක් ගතවන තුරු තමන් සඳහන් කරන ලද මිල ගණන්වලට එම වැඩය කිරීමට ටෙන්ඩර්කරුවන් කැමති විය යුතුයි.

7. තවත් අවශ්‍ය විස්තර වෙතොත් කළුතර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගේ කාර්යාලයෙන් ලබාගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂා කර බැලීම සඳහා මෙම කාර්යාලයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේදි 66.9.30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව, කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචි කිරීම් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් කරන ලද ලියාපදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැම්මේ කටයුතු සඳහා සලකනු ලැබේ.

වී. වීරවර්ධන,
කළුතර ප්‍රදේශයේ
ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

1970 සැප්තැම්බර් මස 9 වන දින,
කළුතර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දීය.

9–649—70.9.18 දින අංක 14,924 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### කෑගල්ල ප්‍රදේශයේ පාසැල්වලට "ඇදිහැස" බිස්කෝතු ප්‍රවාහනය සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම—1970-71

1970 ක්වූ ඔක්තෝබර් මස 9 වැනි දින පෙරවරු 10 වන තෙක් පහත සඳහන් සේවාවන් සඳහා කෑගල්ල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. සැපයීම් මධ්‍යස්ථානයන් හි සිට "කොරියේටඩ් බෝඩ්" (ප්‍රමාණය 13"×11"×9½") පෙට්ටිවල අසුරන ලද රාත්තල් 20 ක් බර බිස්කෝතු පෙට්ටි පහත දක්වෙන සැපයීම් මධ්‍යස්ථානයන් හි සිට ඒ ඒ මණ්ඩලවල පිහිටි පාසැල්වලට ප්‍රවාහනය කිරීම.

සැපයීම් මධ්‍යස්ථානයන් හා මණ්ඩල මෙසේය :—

කෑගල්ල සැපයීම් මධ්‍යස්ථානය—කෑගල්ල හා ගලිගමුව
කෑගල්ල සැපයීම් මධ්‍යස්ථානය—මාවනැල්ල සහ රඹුක්කන
වරකාපොල සැපයීම් මධ්‍යස්ථානය—දැදිගම
කොට්ටාව බිස්කෝතු කර්මාන්ත ශාලාව—රුවන්වැල්ල
කොට්ටාව බිස්කෝතු කර්මාන්ත ශාලාව—යටියන්තොට
කොට්ටාව බිස්කෝතු කර්මාන්ත ශාලාව—දෙහිඕවිට
කරවනැල්ල සැපයීම් මධ්‍යස්ථානය—රුවන්වැල්ල
කරවනැල්ල සැපයීම් මධ්‍යස්ථානය—යටියන්තොට
කරවනැල්ල සැපයීම් මධ්‍යස්ථානය—දෙහිඕවිට

3. කෑගල්ල ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැකි නියමිත ආකෘති පත්‍ර මත ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගැනීමට පෙර රු. 100 ක තැන්පත් මුදලක් කෑගල්ලේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත් අයට 1970 ඔක්තෝබර් මස 5 දින දහවල් 12 වන තෙක් ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. අනුමත කරන ලද සමිතියක් නම්, එකී මුදල තැන්පත් කිරීම අනවශ්‍යය.

4. ටෙන්ඩර් පෝරම නිකුත් කිරීමට පෙර ටෙන්ඩර් භාරදීම අපේක්ෂා කරන අයවලුන් විසින් කෑගල්ලේ අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත රුපියල් 10,000 ක් වටිනා ස්ථිර දේපල ඇති බවට ඒ ත්තු යන පරිදි සහතිකයක් තිබිය යුතුයි.

5. ප්‍රවාහනය කිරීමට අදහස් කරන මණ්ඩල ගණන එකක් හෝ දෙකක් නම් කොන්ත්‍රාත්කරු තමින් ලියා පදිංචි කළ ලොරි එකක් ද, මණ්ඩල ගණන දෙකකට වැඩි නම් ලොරි දෙකක් ද, කෑගල්ල අධ්‍යාපන ප්‍රදේශයේ පමණක් ප්‍රවාහනය කිරීමට තමා සතුව ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. ප්‍රවාහනය බාර ගන්නා මණ්ඩල ගණන අනුවත්, ඒ ඒ මණ්ඩලවල ගමනා ගමන පහසුකම් අනුවත්, අතිරේකව පාවිච්චි කළ යුතු ලොරි ගණන කෑගල්ලේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් තීරණය කරනු ලැබේ.

6. අනුමත කරන ලද සමූපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති හා කම්කරු සමිති මගින් ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමට කලින් කෑගල්ල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත සමූපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයාගෙන් හෝ ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂතුමාගෙන් හෝ කම්කරු කොමසාරිස්තුමාගෙන් හෝ එකී සමිතියට මෙම සේවය ඉටු කිරීමට හැකියාවක් ඇති බවට සහතිකයක් යථා යෝග්‍ය පරිදි ලබාගෙන ඉදිරිපත් කළ යුතුය. ඉහත සඳහන් අවශ්‍යතාවයන් සම්පූර්ණ නොකළ අයට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු නොලැබේ.

7. ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුක්තව ලියාපදිංචි කළ තැපෑලෙන් කෑගල්ලේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත එවිය යුතුය. තැපෑලෙන් නොඑවන ටෙන්ඩර් පත්‍ර කවරයක බහා මුද්‍රා තබා සේවයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් පෞද්ගලිකව කෑගල්ලේ ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පාලන නිලධාරි වෙත භාරදිය යුතුය.

8. 1970 ඔක්තෝබර් 9 වෙනි දින පෙ. ව. 10 ට කෑගල්ලේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර්කරුගේ නම හා මිළ ගණන් කියවනු ලැබේ.

9. කෑගල්ලේ අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් හෝ "ඇදිහැස" සංවිධානයෙන් හෝ නිකුත් කිරීමේ ඇණවුම පත් ලැබී සතියක් ඇතුලත පාසැල්වලට බිස්කෝතු ගෙන ගොස් භාරදීම කළ යුතුවේ. ටෙන්ඩරයක් සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කිරීමේ හෝ එකී කොටස භාර ගැනීමේ අයිතිය කෑගල්ලේ අධ්‍යාපන අධ්‍යක්ෂ සතුය. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කළ දින සිට සති හයක් ගතවන තුරු තමන් සඳහන් කළ මිල ගණන්වලට මෙම සේවාවන් භාර ගැනීමට කැමති විය යුතුය.

ඒ. ජේ. ඇස්. ගුණවර්ධන,
කෑගල්ලේ, ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

1970 සැප්තැම්බර් මස 9 දින,
කෑගල්ල, ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දී ය.

9–685—70.9.18 දින අංක 14,924 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1970 ඔක්තෝබර් මස 9 වන දින පෙ. ව. 10.30 වන තෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර තංගල්ල අධ්‍යාපන කාර්යාලයයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන විසින් භාරගනු ලැබේ.

| පාසලේ නම | කළ යුතු වැඩය | | අවශ්‍ය ලියාපදිංචිය |
|---|---|---|---|
| හ/උඩුවිල විදුහල | ගුරු නිවාසය තැනීම | | රු. 15,000 |

සංලක්ෂය.—හ=හම්බන්තොට දිස්ත්‍රික්කය.

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්යාලයේ රු. 100 (සියය)ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය තංගල්ලේ, ප්‍රධාන අධ්‍යාපන නිලධාරී වෙත ඉදිරිපත් කිරීමෙන් ඉහත සඳහන් හා ඊට වැඩි ගණනකට අධ්‍යාපන අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ, ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1970 ඔක්තෝබර් මස 8 වන දින දවල් 12 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. (වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000කට අඩු වැඩ සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුසෝ නො වෙත් ) චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම්, ආදිය භාරගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාරදීමේ කුවිතාන්සිය කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ තංගල්ලේ, ප්‍රධාන අධ්‍යාපන නිලධාරීගෙන් හෝ ලබාගත හැක. මුදල් භාරදීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියාපදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක් ය.

3. දෙවැනි ඡේදයේ සඳහන්කර ඇති මුදල් ප්‍රමාණයන්ට අධ්‍යාපන අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිවී ඇති අනුමත සමිතිවලටද ටෙන්ඩර් පත්‍ර මේ වැඩ සඳහා එවිය හැකිය. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍ය වේ. ඔවුන් දෙවැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර 2 වැනි හා 3 වැනි ඡේදවල සඳහන් පරිදි තංගල්ල ප්‍රධාන අධ්‍යාපන නිලධාරිගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධ සියලු විස්තර දැනගත හැකි අතර, සැලැස්ම ආදිය බලාගත හැක. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත් ලියාපදිංචි තැපෑලෙන් තංගල්ල අධ්‍යාපන කාර්යාලයයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපෑලෙන් නොඑවන ටෙන්ඩර් පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයකු විසින් පෞද්ගලිකව තංගල්ල අධ්‍යාපන කාර්යාලයේ, කාර්යාල සහකාර/ප්‍රධාන ලිපිකරු වෙත භාරදිය යුතුය. එසේ භාරදුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුය.

5. 1970 ඔක්තෝබර් මස 9 වන දින ප. ව. 2.30 ට තංගල්ල අධ්‍යාපන කාර්යාලයේ දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර්පත් විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා මිල ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් පත් භාරගැනීම අවසන් කළ දින සිට සති හයක් ගතවන තුරු තමන් සඳහන් කරන ලද මිළ ගණන්වලට එම වැඩය කිරීමට ටෙන්ඩර්කරුවන් කැමැතිවිය යුතුය.

7. තවත් අවශ්‍ය විස්තරයක් වෙතොත් තංගල්ලේ, ප්‍රධාන අධ්‍යාපන නිලධාරිගේ කාර්යාලයෙන් ලබාගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂාකර බැලීම සඳහා මෙම කාර්යාලයයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේදී 66. 9. 30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මඟින් කරන ලද පාසල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව, කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචි කිරීම් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් කරන ලද ලියාපදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

එන්. එල්. ඩී. එෆ්. කරුණාරත්න,
හම්බන්තොට ප්‍රදේශයේ ප්‍රධාන අධ්‍යාපන නිලධාරි.

1970 සැප්තැම්බර් 9 දින,
තංගල්ලේ, අධ්‍යාපන කාර්යාලයයේ දිය.

9–722—70.9.18 දින අංක 14,924 දරන ගැසට් පත්‍රය

යොමුව : පිඑස්බී 52/70.

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

**ඇමොඩියාකුයින් හයිඩ්‍රෝක්ලෝරයිඩ් යනාදිය සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර**

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් ඇමොඩියාකුයින් හයිඩ්‍රෝක්ලෝරයිඩ් යනාදිය සැපයීම සඳහා පහත සඳහන් උපලේඛනයේ ප්‍රකාශිත අයවලුන් ගෙන් ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ :—

(i) අංක 14,895 දරණ 1970 පෙබරවාරි මස 27 වැනි දිනැති "රජයේ ගැසට් පත්‍රයේ" පළකොට ඇති නාමාවලියෙහි සඳහන් මා විසින් ලේඛනගත කල වෙළඳ සමාගම්,

(ii) ලන්ඩනයේ රාජ්‍ය නියෝජිතයින්,

(iii) ඉන්දියාවේ කල්කටා නියෝජිතයින්,

(iv) ඔස්ට්‍රියාව, පෝලන්තය, චෙකොස්ලෝවැකියාව, මහජන චීන සමූහාණ්ඩුව, ස. සෝ. රු. ස., යුගෝස්ලේවියාව, එක්සත් අරාබි ජනරජය, බල්ගේරියාව, ජර්මානු ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය, හංගේරියාව හා රුමේනියාව.

2. සැපයීම් සඳහා ටෙන්ඩර් පත්‍ර, කොළඹ, තැ.පෙ. 584, මහලේකම් කාර්යාලයේ "බී" කොටසේ අමාත්‍යාංශ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1970.11.27 දින පෙරවරු 10 තෙක් භාරගනු ලැබේ.

3. මෙම ටෙන්ඩරයට අදාල, ටෙන්ඩර් ආකෘති, කොන්දේසි ආදිය නිකුත්කරනු ලබන්නේ—

(i) මා විසින්ම හෝ විදේශවල ඇති ලංකා නියෝජිතයින් මගින් ලේඛනගත කොට ඇති වෙළඳ සමාගම්වලටත්,

(ii) 1 වැනි ඡේදයේ iv වැනි උප ඡේදයේ සඳහන් රාජ්‍යයනට, ඔවුන්ගේ ලංකා නියෝජිතයින් මගිනුත් පමණකි.

4. ඉහත 2 වැනි ඡේදයේ සඳහන් දින නියමිත වේලාවට නියමිත ස්ථානයේදී, ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී, ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ අනුමත නියෝජිතයිනට පැමිණීමට ඉඩ දෙනු ලැබේ.

5. මේ සම්බන්ධ වැඩි විස්තර, කොළඹ 10, ඩීන්ස් පාරේ අංක 355 හි, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (සැපයීම්) ගෙන් ලබා ගත හැක.

එන්. කේ. පී. විජයසිංහම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

කොළඹ, 1970.9.1.

### SCHEDULE REFERRED TO

| Item No. | Description | Estimated requirements | Packing required |
|---|---|---|---|
| 1 .. | Amodiaquine Hydrochloride NF each tablet containing 0.2 grammes Amodiaquine base. 7 Chloro—4(3 diethylamine methyl—4—hydroxyanilino) quinolinehydrochloride dihydrate | 15,000,000 Tablets .. | In bottles of 1,000 tablets |
| 2 .. | Primaquine Phoshpate USP 8—(4—Amino—1—methylbutalamino)—6 methoxyquinoline Diphosphate Primaquinium Phosphate each tablet equivalent to 7.5mg. Primaquine base | 15,000,000 Tablets .. | do. |
| 3 .. | Choloquin Sulphate B.P. 0.2gm. OR Chloroquin Phosphate B.P. 0.25gm. each tablet containing 0.15gm. Chloroquin base | 5,000,000 Tablets .. | do. |

9-544—70.9.18 දින අංක 14,924 දරන ගැසට් පත්‍රය

---

යොමුව : පිඑස්සී 2/10/70.

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

**සැරහුම් යනාදිය සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර**

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් සැරහුම් යනාදිය සැපයීම සඳහා පහත සඳහන් උපලේඛනයේ ප්‍රකාශිත අයවලුන්ගෙන් ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ :—

(i) මා විසින් ලේඛනගත කල වෙළඳ සමාගම්,

(ii) ලන්ඩනයේ රාජ්‍ය නියෝජිතයින්,

(iii) ඉන්දියාවේ කල්කටා නියෝජිතයින්,

(iv) ඔස්ට්‍රියාව, පෝලන්තය, චෙකොස්ලෝවැකියාව, මහජන චීන සමූහාණ්ඩුව, ස.සෝ.රු.ස., යුගෝස්ලේවියාව, එක්සත් අරාබි ජනරජය, බල්ගේරියාව, ජර්මානු ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය, හංගේරියාව හා රුමේනියාව.

2. සැපයීම් සඳහා ටෙන්ඩර් පත්‍ර, කොළඹ, තැ. පෙ. 584 අමාත්‍යාංශ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 70.11.17 දින පෙරවරු 10 තෙක් භාර ගනු ලබේ.

3. මෙම ටෙන්ඩරයට අදාල, ටෙන්ඩර් ආකෘති, කොන්දේසි ආදිය නිකුත් කරනු ලබන්නේ —

(i) මා විසින්ම හෝ විදේශවල ඇති ලංකා නියෝජිතයින් මගින් ලේඛනගත කොට ඇති වෙළඳ සමාගම්වලටත්,

(ii) 1 වැනි ඡේදයේ iv වැනි උප ඡේදයේ සඳහන් රාජ්‍යයනට, ඔවුන්ගේ ලංකා නියෝජිතයින් මගිනුත් පමණකි.

4. ඉහත 2 වැනි ඡේදයේ සඳහන් දින නියමිත වේලාවට නියමිත ස්ථානයේදී, ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී, ටෙන්ඩර්කරුවනට හෝ ඔවුන්ගේ අනුමත නියෝජිතයිනට පැමිණීමට ඉඩ දෙනු ලැබේ.

5. මේ සම්බන්ධ වැඩි විස්තර, කොළඹ 10, ඩීන්ස් පාරේ අංක 355 හි, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (සැපයීම්) ගෙන් ලබා ගත හැක.

එන්. කේ. පී. විජයසිංහම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

කොළඹ, 70.9.4.

### SCHEDULE REFERRED TO

| Item No. | Description | Estimated requirements | Packing required |
|---|---|---|---|
| 1 .. | Bandages W. O. W. 2½″ × 6 yards Hospital Quality .. ..<br>*Threads per inch :*<br>Warp-average not less than 30<br>Weft-average not less than 22<br>Weight not less than 50 grains to a sq. foot<br>Foreign matter—not more than 1.5% | 16,000 Gross .. | In packets of 12 and 25 gross to a bale |
| 2 .. | *Absorbent* Cotton Wool Hospital Quality .. ..<br>*Length of Staple*—average not less than 3/8″<br>*Absorbency*—1G compressed to a volume of about 20 ml. placed lightly by means of a forcep on the surface of water 20°C becomes satatuarated within 10 seconds.<br>*Effects of heat*—Heat at 110°C for 20 minutes, it does not turn brown or show any appreciable signs of disintergration<br>*Water Soluble Extractive*—Not more than 1.0%<br>*Ash*—Not more than 0.5%<br>*Acidity*—Sprinkle with several drops of bromocresol green solution ; the bromocresol green solution does not become distinctly yellow | 60,000 lbs. .. | In 1 lb. (nett) rolls and 100 lbs. to a bale |

9-601—70.9.18 දින අංක 14,924 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව—මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාශය

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් සඟ සේවා.—වර්ෂ 1970 ඔක්තෝබර් 1 වනදා සිට 1971 සැප්තැම්බර් 30 වනදා දක්වා (දින දෙකම ඇතුළත්ව) කාලය තුළ මේ සංග ඇති උපලේඛනයෙහි පළමුවන තීරයෙහි සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකික යන්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර මාතලේ පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේදී සෞඛ්‍ය සේවා අධිකාරි තැන විසින් භාර ගනු ලැබේ.

2. (i) ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.—එම උපලේඛනයෙහි 2 වන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමූපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) ටෙන්ඩර් පත්‍ර.—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, පුත්තලම, රත්නපුරය, සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත ආකෘති පත්‍රයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි ආකෘති පත්‍ර සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත් කල්වේලා ඇතිව එවිය යුතුයි.

3. වත්කමේ විස්තර.—සියලුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් ආකෘති පත්‍ර සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ දිනට සැලකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරින්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා වූවමනා ආකෘති පත්‍ර ඉහත පෙනෙන දෙවන ඡේදයේ (ii) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමිවන්නට ඉඩ තිබේ.

4. ප්‍රමාණයන්.—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැනගැනීමට මේ සංග ඇති උපලේඛනයෙහි 5 වැනි තීරය බලන්න.

5. ටෙන්ඩර් එවිය යුතු අන්දම.—සියළු ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා '' මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරි වෙතට '' කියා එවිය යුතුයි. සීල් තබන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවක් දැයි පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ගණකාධිකාරි/ලේකම්තැනට හෝ භාර දෙන්නේ නම්, ටෙන්ඩර් පත්‍රිකා ලැබුණු බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

6. ටෙන්ඩර් පත් භාර ගන්නා අවසාන දිනය.—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයෙහි පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාරගැනීම අවසන්වූ වහාම ඒවා මෙම කාර්යාලයේදී විවෘත කරනු ලැබේ.

7. ටෙන්ඩර් පත් විවෘත කිරීම.—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන්ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. යමකිසි ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කළින් පිළියෙල කරගත් දිනක ම විසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. ටෙන්ඩරයෙහි තීරණය.—ටෙන්ඩර් පත් තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් ආකෘති පත්‍රයේ '' බී '' උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් ආකෘති පත්‍රයෙහි '' සී '' උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් හෝ එවකට වෙළඳපොලේ පවතින මිළ ගණන් හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිළක් පවතී නම් එම පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාලසීමාව ඉකුත්වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. තැන්පත් ඇප මුදල්.—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. බඩුබාහිරාදිය තබා ගැනීම.—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩාකර තබාගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම තුළ ඉඩකඩ සලසා දෙනු නොලැබේ.

12. ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසිද ටෙන්ඩර් කරුවන් විසින් සැලකිය යුතුය.

13. තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරුට රෝගීන් සහ සේවකයන් විසින් භාරදී ඇති කූපන් වෙනුවෙන් සහන මිළ යටතේ හෝ නොමිළයේ හෝ 1966.12.19 දින සිට පවතින ක්‍රමයට අවශ්‍ය සහල් ආහාර දෙපාර්තමේන්තුවෙන් ලබාගැනීමට ආයතන භාර ප්‍රධානියා විසින් බලපත්‍ර නිකුත් කරනු ලැබේ.

ඒ. උඩවත්ත,
මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරි.

1970.9.5 වැනි දින,
මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| (1) ආයතනය | (2) ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රු. | (3) ඇප මුදල රු. | (4) ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව | (5) ආහාර ප්‍රමාණය දළ වශයෙන් — සේවකයන්ට: මාළු | සේවකයන්ට: මස් | සේවකයන්ට: කරවල | සේවකයන්ට: එළවළු | නොගෙවන රෝගීන්ට: මාළු | නොගෙවන රෝගීන්ට: මස් | නොගෙවන රෝගීන්ට: කරවල | නොගෙවන රෝගීන්ට: එළවළු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1. බකමූන රෝහල ... ... | 100... | 800 | 70.10.16 වැනි දින පෙ.ව. 10 ට | 200... | 200... | 200... | 500... | 1,000... | 1,000... | 1,000... | 4,000 |

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—මාතර කොට්ඨාශය

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.—වර්ෂ 1971 ජනවාරි මස 1 දින සිට 1971 දෙසැම්බර් මස 31 වැනිද දක්වා (දින දෙකම ඇතුළුව) කාලය තුළ මේ සමඟ ඇති උපලේඛනයේ පළමුවන තීරයේ සඳහන් ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර මාතර පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේදී සෞඛ්‍ය සේවා අධිකාරී තැන විසින් භාර ගනු ලැබේ.

2. (i) ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.—මෙහි උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබා ගත යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලට ද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා, එවැනි ඉල්ලීම කරන විට ඒ ඒ සමාගම් හෝ සමිතිවල ලියා පදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) ටෙන්ඩර් පත්‍ර.—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, පුත්තලම, මාතලේ, රත්නපුර සහ වවුනියා යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරීන්ගේ කාර්යාලවලින් හෝ ලබා ගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාර ගනු නො ලැබේ. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පතට අමුනා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබා ගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි පෝර්ම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම්පත් කල් වේලා ඇතිව එවිය යුතුයි.

3. වක්කමේ විස්තර.—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට සැලකිය යුතු කාලයකට ප්‍රථම තම වක්කම් මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට කැමැති සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුය. මේ සඳහා උවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡේදයේ (ii) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබා ගත හැකිය. වක්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කිරීමට දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. ප්‍රමාණයන්.—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට මේ සමඟ ඇති උපලේඛනයේ 5 වන තීරය බලන්න.

(i) රෝගියකුගේ සම්පූර්ණ ආහාර වේලකට සහල් අවුන්ස 4½ ක් ඇතුළත් වන සේ බත් වේල් සැපයීමට ටෙන්ඩර්කරුවන් මිළ ගණන් දක්විය යුතුය.

(ii) දනට ආහාර උපලේඛනයේ දක්වා ඇති සහල් අවුන්ස 12 ප්‍රමාණය අවුන්ස 9 වශයෙන් වෙනස් කර ඇති නිසා 1970 ඔක්තෝබර් සිට ඒ වෙනුවෙන් අමතරව පාන් සැපයීම අනවශ්‍ය වනු ඇත.

(iii) අවශ්‍ය සහල් ආහාර කොමසාරිස් විසින් සලාක නොවන මිලට සපයන අතර ඒ සඳහා ටෙන්ඩර්කරු මුදල් ගෙවිය යුතුය. දනට සලාක නොවන සහල් රාත්තලක මිල ශත 50 කි.

පරිත්‍යාග කරන ලද සහල් හෝ නොමිලයේ සහල් හෝ පිසීම සඳහා කොන්ත්‍රාත්කරුට සැපයුවහොත් ඒ සඳහා සලාක නොවන සහල් මිලට කොන්ත්‍රාත්කරුගේ ආහාර වවුචරයෙන් මුදල් අඩු කරනු ලැබේ.

කිසියම් අවස්ථාවකදී සලාක සහල් සැපයුවහොත් ඒ සහල් සඳහා සලාක මිලට කොන්ත්‍රාත්කරු විසින් මුදල් ගෙවිය යුතුය. ඒ අතර සලාක නොවන සහල් මිලේ සහ සලාක සහල් මිලේ වෙනස කොන්ත්‍රාත්කරුගේ ආහාර වවුචරයෙන් අඩු කර ගනු ලැබේ.

(iv) කූපන් භාර නොදුනහොත් සේවකයන්ට සැපයිය යුත්තේ පාන්ය. කූපන් බාර දුනහොත් ඒ වෙනුවෙන් නොසපයනු ලබන පාන් සඳහා පහත සඳහන් පරිදි කොන්ත්‍රාත්කරුගේ වවුචරයෙන් මුදල් අඩු කරනු ලැබේ.

(අ) කූපන්වලට ලබා ගන්නා සහල් දනට මෙන් නොමිලයේ වුවහොත් නොසපයනු ලබන පාන්වල සම්පූර්ණ වටිනාකම අඩු කරනු ලැබේ.

(ආ) එවැනි කූපන්වලට සහල් නිකුත් කරන්නේ කොන්ත්‍රාත්කරු ගෙවන සලාක මිලට නම් නොසපයනු ලබන පාන්වල මිලේත් සලාක සහල් මිලේත් වෙනස අඩුකර ගනු ලැබේ.

5. ටෙන්ඩර් එවිය යුතු අන්දම.—සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයෙක බහා " සෞඛ්‍ය සේවා අධිකාරී, මාතර " කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත්‍ර බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවක් දැයි පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයෙහි තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියා පදිංචි තැපැලෙන් හෝ ලැබීමට සැලැස්විය හැකිය. ටෙන්ඩර් පත්‍රිකා පෞද්ගලිකව මට හෝ ගණකාධිකාරී/ලේකම් තැනට භාර දෙන්නේ නම් ටෙන්ඩර් පත්‍රිකා ලැබුණ බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබා ගත යුතුයි.

6. ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය.—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයෙහි පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා මෙම කාර්යාලයේදී විවෘත කරනු ලැබේ.

7. ටෙන්ඩර් විවෘත කිරීම.—ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට එම ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමඟ කලින් පිළියෙල කර ගත් දිනක මා විසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. ටෙන්ඩර් තීරණය.—ටෙන්ඩර්පත් තෝරනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝර්මයෙහි " බී " උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් පෝර්මයෙහි " සී " උපලේඛන යට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුය. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් හෝ එවකට වෙළඳ පොලේ පවතින මිළ ගණන් හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිලක් පවතී නම් එම පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිල ගණන් වලංගු කාල සීමාව.—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිල ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාල සීමාව ඉකුත් වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන් තබන ලද පොරොන්දු පත්‍රයේ විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නො ලැබේ.

10. තැන්පත් මුදල.—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයේ 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. බඩු බාහිරාදිය තබාගැනීම.—තෝරා ගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩා කර තබාගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම තුළ ඉඩකඩ සලසා දෙනු නො ලැබේ.

12. ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවෙකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැන ගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතු ද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසි ද ටෙන්ඩර් කරුවන් විසින් සැලකිය යුතුය.

අයි. ඊ. එස්. සිරිවර්ධන,
මාතර සෞඛ්‍ය සේවා අධිකාරී.

1970 සැප්තැම්බර් මස 2 දින,
මාතර සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේදී ය.

## උපලේඛනය

| (1) ආයතනයේ නම | (2) ටෙන්ඩර් තැන්පත් මුදල රුපියල් | (3) ඇප මුදල රුපියල් | (4) ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය හා වේලාව | (5) ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් — සේවකයින්ට: අළුත් මාළු | සේවකයින්ට: හරක් මස් | සේවකයින්ට: කරවල | සේවකයින්ට: එළවළු | රෝගීන්ට: අළුත් මාළු | රෝගීන්ට: හරක් මස් | රෝගීන්ට: කරවල | රෝගීන්ට: එළවළු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1. අම්බලන්තොට ග්‍රාමීය රෝහල ... | 100... | 400 | | 350... | 350... | 300... | 1,250... | 1,900... | 2,000... | 2,000... | 8,200 |
| 2. අපරැක්ක මාතෘ නිවාසය ... | 100... | 300 | | 100... | 100... | 100... | 400... | 150... | 150... | 150... | 550 |
| 3. බෙලිඅත්ත ග්‍රාමීය රෝහල ... | 100... | 300 | | 300... | 300... | 300... | 1,200... | 500... | 500... | 500... | 1,900 |
| 4. ඉහළ බෙලිගල්ල මාතෘ නිවාසය... | 100... | 300 | | 150... | 150... | 150... | 650... | 50... | 50... | 50... | 200 |
| 5. දෙවිනුවර මාතෘ නිවාසය ... | 100... | 300 | | 100... | 100... | 100... | 350... | 100... | 100... | 100... | 150 |
| 6. දෙයියන්දර මාතෘ නිවාසය ... | 100... | 600 | | 250... | 250... | 250... | 1,000... | 1,100... | 1,100... | 1,050... | 4,300 |
| 7. ගැටමාන්න මාතෘ නිවාසය ... | 100... | 300 | | — ... | — ... | — ... | — ... | 400... | 400... | 400... | 1,600 |
| 8. හකුරුවෙල මාතෘ නිවාසය ... | 100... | 300 | | 100... | 100... | 100... | 500... | 150... | 150... | 150... | 600 |
| 9. කිරින්ද මාතෘ නිවාසය ... | 100... | 300 | 1970 ඔක්තෝබර් 17 දින පෙරවරු 10 ට | 150... | 150... | 150... | 550... | 250... | 250... | 250... | 1,000 |
| 10. කිරම මාතෘ නිවාසය ... | 100... | ,300 | | 100... | 100... | 100... | 200... | 400... | 400... | 400... | 1,600 |
| 11. කොටපොල මාතෘ නිවාසය ... | 100... | 400 | | 100... | 100... | 100... | 350... | 350... | 350... | 350... | 1,450 |
| 12. මිරිස්ස මාතෘ නිවාසය ... | 100... | 300 | | 100... | 100... | 100... | 400... | 50... | 50... | 50... | 50 |
| 13. මිද්දෙනිය මාතෘ නිවාසය ... | 100... | 400 | | 50... | 50... | 50... | 250... | 300... | 300... | 300... | 1,150 |
| 14. නාකුළුගමුව මාතෘ නිවාසය ... | 100... | 400 | | 100... | 100... | 100... | 400... | 50... | 50... | 50... | 150 |
| 15. පල්ලෙගම මාතෘ නිවාසය ... | 100... | 300 | | 100... | 100... | 100... | 400... | 300... | 300... | 300... | 1,100 |
| 16. පලතුඩුව මාතෘ නිවාසය ... | 100... | 400 | | 100... | 100... | 100... | 400... | 50... | 50... | 50... | 50 |
| 17. උඩුවිල මාතෘ නිවාසය ... | 100... | 400 | | 50... | — ... | 50... | 200... | 50... | — ... | 50... | 100 |
| 18. වැලිපිටිය මාතෘ නිවාසය ... | 100... | 300 | | 100... | 100... | 100... | 400... | 50... | 50... | 50... | 150 |
| 19. වීරකැටිය මාතෘ නිවාසය ... | 100... | 400 | | 50... | 50... | 50... | 200... | 450... | 500... | 450... | 1,800 |

9–626—70.9.18 දින අංක 14,924 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—ගාල්ල කොට්ඨාශය

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.—වර්ෂ 1970 ඔක්තෝබර් 1 වනද සිට 1971 සැප්තැම්බර් 30 වනද දක්වා (දින දෙකම ඇතුළත්ව) කාලය තුළ මේ සමග ඇති උපලේඛනයෙහි පළමුවන තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන් ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර ගාල්ලේ පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේ දී සෞඛ්‍ය සේවා අධිකාරී තැන විසින් භාරගනු ලැබේ.

2. (i) ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.—මෙහි උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම හා විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා, එවැනි ඉල්ලීම කරන විට ඒ ඒ සංගම හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුයි.

(ii) ටෙන්ඩර් පත්‍ර.—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝරමයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝරම ඉල්ලුම් කිරිමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝරම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝරම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම්පත් කල්වේලා ඇතිව එවිය යුතුයි.

3. වත්කමේ විස්තර.—සියලුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට සෑළකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝරම ලබාගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝරම ඉහත පෙනෙන දෙවන ඡෙදයේ (ii) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල් අහිමි වන්නට ඉඩ තිබේ.

4. ප්‍රමාණයන්.—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට මෙ සමඟ ඇති උපලේඛනයෙහි 5 වැනි තීරය බලන්න.

5. ටෙන්ඩර් එවිය යුතු අන්දම.—සියලුම ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුතුව කවරයක බහා " සෞඛ්‍ය සේවා අධිකාරී, ගාල්ල ", කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර්පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහාදයි පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර්පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි කළ තැපැලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ගණකාධිකාරී/ලේකම්තැනට භාරදෙන්නේ නම්, ටෙන්ඩර් පත්‍රිකා ලැබුණු බවට කුවිතාන්සියක් ලබා ගත යුතුයි.

6. ටෙන්ඩර් බාරගන්නා අවසාන දිනය.—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් වූ වහාම ඒවා මෙම කාර්යාලයේදී විවෘත කරනු ලැබේ.

7. ටෙන්ඩර් පත් විවෘත කිරීම.—ටෙන්ඩර්පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම සහ ඔවුන් සඳහන් කරන ලද මිල ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමඟ කලින් පිළියෙල කරගත් දිනයක මා විසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. ටෙන්ඩරයන්හි තීරණය.—ටෙන්ඩර්පත් තෝරා ගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝරමයේ " බී " උපලේඛනයේ සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම්වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටැන්ඩර් පෝරමයෙහි " සී " උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිල ගණන් සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිල ගණන හෝ එවකට වෙළඳ පොළේ පවතින මිල ගණන හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිලක් පවතී නම් එම පාලන මිල ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිල ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් කරන ලද මිල ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාලසීමාව ඉකුත් වනතුරු වලංගුවේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිල ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුයි.

11. **බඩු බාහිරාදිය තබා ගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩාකර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම තුළ ඉඩකඩ සළසා දෙනු නොලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතු ද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසි ද ටෙන්ඩර් කරුවන් විසින් සැළකිය යුතුය.

ඇස්. ජී. කුලතිලක,
සෞඛ්‍ය සේවා අධිකාරි, ගාල්ල.

1970 සැප්තැම්බර් 6 වන දින,
ගාල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේ දී ය.

උපලේඛනය

| 1 | 2 | 3 | 4 | 5 | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල් | ඇප මුදල | ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව | ආහාර ප්‍රමාණය දළ වශයෙන් | | | | | | | |
| ආයතනය | | | | සේවකයන්ට | | | | නොගෙවන රෝගීන්ට | | | |
| | රුපියල් | රුපියල් | | මාළු | හරක්මස් | කරවල | එළවළු | මාළු | හරක්මස් | කරවල | එළවළු |
| 1. උනවටුන රජයේ රෝහල් ... | 100... | 800... | 1970.9.28 දින පෙරවරු 10ට ... | 150... | 150... | 150... | 700... | 1,300... | 1,300... | 1,300... | 5,000 |

9-641—70.9.18 දින අංක 14,924 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—වවුනියා කොට්ඨාශය

**ගබඩා බඩු ප්‍රවාහණය—1970-71**

අංක 14,919 හා 70.8.14 වැනි දින ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ 1970-71 වර්ෂයට වවුනියා කොට්ඨාශයේ (කොටස් I, II සහ III) බඩු ප්‍රවාහණය කිරීම සඳහා කැඳවූ ටෙන්ඩර් අවලංගු කර ඇත. ඒ සඳහා නැවතත් යථාකාලයේ ටෙන්ඩර් කැඳවනු ලැබේ.

පී. රත්නසභාපති,
සෞඛ්‍ය සේවා අධිකාරි, වවුනියාව.

සෞ. සේ. අධි. කාර්යාලයය,
වවුනියාව, 70.9.4.

9-338—70.9.18 දින අංක 14,924 දරන ගැසට් පත්‍රය

---

## ලංකා විදුලි බල මණ්ඩලය

**කිලිනොච්චියෙහි මණ්ඩලීය නිවාස තනා භාරදීම**

ලංකා විදුලි බල මණ්ඩලයේ ප්‍රධාන කළමනාකාර තැන වෙත ඉහත සඳහන් කාර්‍ය්‍ය කර භාරදීම සඳහා 1970 ක්වූ ඔක්තෝබර් මස 15 වන බ්‍රහස්පතින්දා පූ. භා. 10 දක්වා කොළඹ, ශ්‍රී චිත්තම්පලම් ගාඩිනර් මාවතේ ලංකා විදුලි බල මණ්ඩලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන (තැ. පෙ. 540) විසින් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර සම්බන්ධ ලියකියවිලි කොළඹ, ශ්‍රී චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි කොන්ත්‍රාත් සහ සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැනගේ කාර්යාලයේ දී කියවා බලාගත හැක. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අදහස් කරන අයවලුන් විසින් රු. 200 ක මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් ද, රු. 5 ක මුදලක් ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තු වශයෙන් ද, ලංකා විදුලි බල මණ්ඩලයේ සරප්තැන වෙත ගෙවා ලබාගත් කුවිතාන්සි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරුතැන වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වන රු. 5 ගේ මුදල ආපසු ගෙවනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් දමුල වන රු. 200 ටෙන්ඩර් කොන්දේසි ලෙඩ ආපසු ගෙවනු ලැබේ.

3. තම ලියාපදිංචිය ඔප්පු කරනු ලැබිය හැකි, රුපියල් තුන් ලක්ෂයකට (රු. 3,00,000) නො අඩු ගොඩනැගිලි වැඩ සඳහා ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ සංයුක්ත මණ්ඩලයන්හි ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීම සඳහා සුදුස්සන් වන්නෝය.

4. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ ඉහත කී අයුරු ලබාගත් ටෙන්ඩර් පෝරමවලයි. වර්ෂ 1970 ක්වූ ඔක්තෝබර් මස 12 දින දහවල් 2 වන තෙක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

5. වර්ෂ 1970 ක්වූ ඔක්තෝබර් මස 15 වන බ්‍රහස්පතින්දා පූ. භා. 10 ට ලංකා විදුලි බල මණ්ඩලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැනගේ කාර්යාලයේ දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

ඩී. ඩබ්ලිව්. මැන්දිස්,
ලංකා විදුලි බල මණ්ඩලයේ සභාපති.

තැ. පෙ. 540,
කොළඹ,
1970 සැප්තැම්බර් මස 18 දින.

9-660—70.9.18 දින අංක 14,924 දරන ගැසට් පත්‍රය

---

## ටෙන්ඩර් දැන්වීමයි

වරක් පමණක් පාවිච්චි කරන ලද හොඳ තත්ත්වයේ ඇති "එස්-ලොන් " නල ඇතුළු කරාම මිලදී ගැනීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් පත් මා විසින් 1970.10.10 දින ප. ව. 3 දක්වා භාර ගනු ලැබේ.

ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 25 ක් ගෙවා බදුල්ල දිසාපති කාර්යාලයෙන් ලබා ගන්නා ලද කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පෝර්ම 70.10.9 දින ප. ව. 3 දක්වා මෙම කාර්යාලයෙන් ලබා ගත හැක.

1970.10.11 දින ප. ව. 3.30 ට බදුල්ල කච්චේරියේ දී ටෙන්ඩර් පත් විවෘත කරනු ලබන හෙයින්, ටෙන්ඩර්කරුවන්ට එකී වේලාවට පැමිණිය හැකි සි.

ටෙන්ඩර් පත් එවන විට කවරයේ වම් කෙළවරේ "එස්-ලොන් නල මිළදී ගැනීම සඳහා ටෙන්ඩරය" යනුවෙන් සඳහන් කර ලේඛනගත තැපෑලෙන් එවිය යුතු ය. මොනම හේතුවක් හෝ සඳහන් නොකොට එවන්නට යෙදුන ඕනෑම ටෙන්ඩර් පතක් ප්‍රතික්ෂේප කිරීමට බදුල්ලේ දිසාපතිට බලය තිබේ.

මෙකී ද්‍රව්‍ය 70.10.1 දින බදුල්ල කච්චේරියට අනුබද්ධ ගබඩාවේදී පරීක්ෂා කළ හැක.

ව. හතරසිංහ,
බදුල්ලේ මැ. බ. දිසාපති වෙනුවට.

1970 සැප්තැම්බර් 5 දින,
බදුල්ල කච්චේරියේ දී ය.

9-629—70.9.18 දින අංක 14,924 දරන ගැසට් පත්‍රය

### වරාය (නැව්බඩු) සංයුක්ත මණ්ඩලය

**දැන්වීමයි**

වරායේ ආපනශාලා සඳහා (I) කෙසෙල් කොළ (II) [illegible] කම්[illegible] සැපයීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් පත් කැඳවනු ලැබේ. [illegible] සම්බන්ධයෙන් විස්තර කොළඹ 1, වරාය (නැව්බඩු) සංයුක්ත මණ්ඩලයෙන්, ප්‍රධාන මුදල් කළමනාකරු ගෙන් ලබා ගත හැක. මෙම ටෙන්ඩර් පත් 1970.9.23 දින ප. ව. 2. 30 පෙර ප්‍රධාන මුදල් කළමනාකරු වෙත ලැබිය යුතුය.

ප්‍රධාන මුදල් කළමනාකරු.

9-534—70.9.18 දින අංක 14,924 දරන ගැසට් පත්‍රය

---

## තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම්

### සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—මාතර සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාශය

**1970 වර්ෂය තුළ වෛද්‍ය ආයතනයනට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම**

| | (1) ආයතනයේ නම | (2) තෝරාගත් ටෙන්ඩර්කරුගේ නම | (3) ලැබුණ ටෙන්ඩර් ගණන | (4) පිළිගත් මිළ ගණන් — සේවකයින්ට: අළුත් මාළු | හරක්මස් | කරවල | එළවළු | රෝගීන්ට: අළුත් මාළු | හරක්මස් | කරවල | එළවළු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ |
| 1. | අම්බලන්තොට ග්‍රාමීය රෝහල | ඩබ්ලිව්. බී. ආර්. සොයිසා මහතා | 2 | 1 85 | 1 80 | 1 65 | 1 25 | 1 68 | 1 60 | 1 35 | 1 18 |
| 2. | බෙලිඅත්ත ග්‍රාමීය රෝහල | ඩී. දීරසිංහ මහතා | 2 | 2 50 | 2 25 | 2 25 | 2 0 | 2 50 | 2 25 | 2 25 | 2 0 |
| 3. | දෙයියන්දර ග්‍රාමීය රෝහල | එම්. බී. සෙනෙවිරත්න මහතා | 4 | 1 20 | 1 0 | 90 | 85 | 1 10 | 1 0 | 90 | 80 |
| 4. | දෙවිනුවර මාතෘ නිවාසය | එච්. ජී. පී. මෙතියස් සිල්වා මහතා | 1 | 2 75 | 2 40 | 2 25 | 1 90 | 2 50 | 2 25 | 2 10 | 1 85 |
| 5. | ගැටමාන්න මාතෘ නිවාසය | ජේ. විජේසිංහ මහතා | 1 | 2 60 | 2 50 | 2 10 | 1 25 | 2 45 | 2 40 | 2 10 | 1 18 |
| 6. | හකුරුවෙල මාතෘ නිවාසය | ඩී. දීරසිංහ මහතා | 1 | 2 75 | 2 20 | 2 20 | 1 75 | 2 75 | 2 20 | 2 20 | 1 75 |
| 7. | ඉහල බෙලිගල්ල මාතෘ නිවාසය | ඩී. දීරසිංහ මහතා | 1 | 2 65 | 2 40 | 2 40 | 2 15 | 2 65 | 2 40 | 2 40 | 2 15 |
| 8. | කිරම මාතෘ නිවාසය | ටී. ඩී. එස්. කරුණානායක මහතා | 1 | 2 20 | 1 95 | 1 90 | 1 55 | 2 20 | 1 95 | 1 95 | 1 30 |
| 9. | මිද්දෙනිය මාතෘ නිවාසය | එම්. වීරකෝන් මහතා | 1 | 2 20 | 1 90 | 1 90 | 1 70 | 2 20 | 1 95 | 1 95 | 1 55 |
| 10. | මීරිස්ස මාතෘ නිවාසය | ඩී. දීරසිංහ මහතා | 1 | 3 0 | 2 75 | 2 75 | 2 50 | 3 0 | 2 75 | 2 75 | 2 50 |
| 11. | නාකුළුගමුව මාතෘ නිවාසය | ඩී. දීරසිංහ මහතා | 1 | 2 85 | 2 55 | 2 45 | 2 30 | 2 75 | 2 45 | 2 35 | 2 20 |
| 12. | පල්ලේගම මාතෘ නිවාසය | පී. විජේනායක මහතා | 1 | 1 80 | 1 80 | 1 75 | 1 70 | 1 70 | 1 70 | 1 65 | 1 60 |
| 13. | පලතුඩුව මාතෘ නිවාසය | ඩී. දීරසිංහ මහතා | 1 | 3 50 | 3 0 | 3 0 | 2 75 | 3 50 | 3 0 | 3 0 | 2 75 |
| 14. | උඩුවිල මාතෘ නිවාසය | ඩී. දීරසිංහ මහතා | 1 | 3 50 | 3 0 | 3 0 | 2 75 | 3 50 | 3 0 | 3 0 | 2 75 |
| 15. | අපරැක්ක මාතෘ නිවාසය | ඩී. දීරසිංහ මහතා | 1 | 2 90 | 2 50 | 2 75 | 2 45 | 2 90 | 2 50 | 2 75 | 2 45 |
| 16. | වැලිපිටිය මාතෘ නිවාසය | ඩී. ඉලම්පෙරුම මහතා | 1 | 3 0 | 2 75 | 2 75 | 2 50 | 3 0 | 2 75 | 2 75 | 2 50 |
| 17. | වීරකැටිය මාතෘ නිවාසය | ඩබ්ලිව්. බී. ආර්. සොයිසා මහතා | 1 | 1 70 | 1 55 | 1 50 | 1 30 | 2 10 | 2 04 | 2 0 | 1 65 |
| 18. | කිරින්ද මාතෘ නිවාසය | ඩී. සී. සුබසිංහ මහතා | 2 | 2 10 | 2 0 | 2 0 | 1 80 | 2 0 | 1 90 | 1 80 | 1 68 |
| 19. | කොටපොල මාතෘ නිවාසය | බී. ඒ. කරුණාධීර මහතා | 2 | 1 85 | 1 75 | 1 70 | 1 50 | 1 80 | 1 70 | 1 70 | 1 45 |

වෛද්‍ය අයි. ඒ. එස්. සිරිවර්ධන,
මාතර සෞඛ්‍ය සේවා අධිකාරි.

1970 සැප්තැම්බර් මස 2 දින,
මාතර සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේදී ය.

9-627—70.9.18 දින අංක 14,924 දරන ගැසට් පත්‍රය

---

### නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

**ටෙන්ඩර් ප්‍රතිඵල**

| ටෙන්ඩර් ප්‍රමාණය දිග ටොන් | වර්ගය | ටෙන්ඩර් අවසන් කළ දිනය | ලැබුන ටෙන්ඩර් ගණන | ඇණවුම් කළ ප්‍රමාණය දිග ටොන් | සාර්ථක ටෙන්ඩර්කරු | ආරම්භක රට | මිළ (දිග ටොන් එකක මිළ නැව් ගාස්තු පමණක්) රු. ශ. |
|---|---|---|---|---|---|---|---|
| 2,000 | සෝඩා අළු | 23.5.70 | 15 (ප්‍රමාදවී 2) | 2,000 | සීමාසහිත කෙමිකල් ඉන්ඩස්ට්‍රීස් (කොළඹ) සමාගම, තැ. පෙ. 352, කොළඹ 1. | එංගලන්තය | 386 80 |
| 100 | රොසින් සයිස් | 10.6.70 | 9 (ප්‍රමාදවී 1) | 100 | සීමාසහිත මිට්සුයි සහ සමාගම, තැ. පෙ. 119, ඔසාකා මධ්‍යම, ජපානය | ජපානය | 1,979 15 (1970 මිල)<br>2,079 55 (1971 මිළ) |

ති. බ. නාරන්පනාව,
සාමාන්‍යාධිකාරි,
නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය.

356, යූනියන් පෙදෙස,
කොළඹ 2,
1970.9.3.

9-737/2—70.9.18 දින අංක 14,924 දරන ගැසට් පත්‍රය

## නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

1970. 6. 7 දින දී අවසන් කළ ස්ට්‍රෝ බෝඩ සඳහා වූ ටැන්ඩරයේ ප්‍රතිඵල

| විෂයය | විස්තර | ලැබුණු ටෙන්ඩර් ගණන | සාර්ථක ටෙන්ඩර්කරු | ඇණවුම් කළ දිග ටොන් ප්‍රමාණය | දිග ටොන් 1 ක මි.භා.වා. රු. ශත | නිෂ්පාදිත රට |
|---|---|---|---|---|---|---|
| 1 ... ස්ට්‍රෝ බෝඩ 1820/ග්‍රෑ. 2 | 25½ × 30½/ග්‍රෑම | 11 ... | ස්ටාර් ඉන්ටර් නැෂනල් (ඕවර් සීස්) ලිමිටඩ්, 77, හාට්පිල්ඩ් රෝඩ්, ලන්ඩන් ඇස්. ඩබ්ලිව්. 19 එක්සත් රාජධානිය | 50 | ... 650 58 | ... ඉන්දියාව |
| 2 ... ස්ට්‍රෝ බෝඩ 2730/ග්‍රෑ. 3 | 25½ × 30½/ග්‍රෑම | 11 ... | එම ... | 10 | ... 650 58 | ... ඉන්දියාව |

කි. බ. නාරන්පනාව,
සාමාන්‍යාධිකාරී,
නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය.

356, යූනියන් පෙදෙස,
කොළඹ 2,
1970. 9. 6.

9–737/3—70.9.18 දින අංක 14,924 දරන ගැසට් පත්‍රය

---

# බඩු බාහිරාදිය විකිණීම

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කොළඹ 10, ඩී. ආර්. විජේවර්ධන මාවතේ (මැකලම් පාරේ) පිහිටි ප්‍රවාහණ අංශයේ ඇති පාවිච්චි කළ පහත සඳහන් වර්ගයන්ට අයත් මෝටර් රථ වාහන 10ක් 1970 ඔක්තෝබර් මස 3 දින උදය 10.30 ට එම ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

| ලියාපදිංචි කළ අංකය | වර්ගය |
|---|---|
| 1. ඊ.වයි. 9091 | ... පෝර්ඩ් ඉකොනොලයින් සල් සාරය |
| 2. සී.වී. 2041 | ... මොරිස් ටොන් 1 වෑනය. |
| 3. සී. වී. 535 | ... බෙඩ් පර්ඩ් ටොන් 5 ලොරිය. |
| 4. සී.වී. 1771 | ... මොරිස් කොමර්ෂල් ටොන් 5 ලොරිය. |
| 5. සී.වී. 535 | ... මොරිස් ටොන් 1 වෑන් රථය. |
| 6. සී.වී. 1774 | ... මොරිස් කොමර්ෂල් ටොන් 5 ලොරිය. |
| 7. සී. වී. 1775 | ... මොරිස් කොමර්ෂල් ටොන් 5 ලොරිය |
| 8. සී.වී. 5234 | ... මොරිස් කොමර්ෂල් ටොන් 5 ලොරිය |
| 9. සී.වී. 1773 | ... මොරිස් කොමර්ෂල් ටොන් 5 ලොරිය |
| 10. සී.ඈන්. 6486 | ... මොරිස් කොමර්ෂල් ටොන් 3 ලොරිය |

ගැනුම්කරුවන් විසින් එම ස්ථානයේදී ම මුදල් ගෙවා වාහන ඉවත් කරගෙන යායුතුය. වැඩි විස්තර කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ, බී. එස්. එස්. අයි. ගොඩනැගිල්ලෙහි පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

ආර්. ඇෆ්. සී. ද ලිවේරා,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1970.9.10 දින,
කොළඹ 1,
බ්‍රිස්ටල් වීදිය,
බී. එස්. එස්. අයි. ගොඩනැගිල්ල,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේදීය.

9–749—70.9.18 දින අංක 14,924 දරන ගැසට් පත්‍රය

---

## සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුව

**සේවයට අයෝග්‍ය බඩු බාහිරාදිය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

සේවයට අයෝග්‍ය බඩු බාහිරාදිය තොගයක් 1970 ඔක්තෝබර් 11 දින පෙරවරු 10 ට කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ දීද, තවත් තොගයක් 1970 ඔක්තෝබර් 12 දින පෙරවරු 10 ට රත්මලානේ කොළඹ ගුවන් තොටුපලේ දී ද, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. විකුණනු ලබන දිනයන්හි පෙරවරු 9 සිට මෙම බඩු බාහිරාදිය පරීක්ෂාකර බැලීම සඳහා තබනවා ඇත. සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ තැ. පෙ. 535, ලෝටස් පාර, කොළඹ 1, යන ලිපිනයට ඉල්ලුම් පතක් එවීමෙන් හෝ රත්මලාන හා කටුනායක ගුවන් තොටුපල් කාර්යාල වලින් හෝ මෙම බඩු බාහිරාදියේ ලැයිස්තුවක් ලබා ගත හැක.

3. මිලදී ගනු ලබන බඩු බාහිරාදිය සඳහා එම ස්ථානයේදීම මුදල් ගෙවිය යුතු වන අතර මිල දී ගත් බඩු එදිනම පස්වරු 4.30 ට පෙර ඉවත් කරගත යුතුය.

ඩබ්ලිව්. ඇල්. පී. ද මැල්,
සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ.

1970 සැප්තැම්බර් මස 10 වැනි දින,
තැ. පෙ. 535,
කොළඹ 1.

9–752—70.9.18 දින අංක 14,924 දරන ගැසට් පත්‍රය

---

## කැලෑ දෙපාර්තමේන්තුව

**දැව වෙන්දේසිය**

ගල්ගමුව අඩවියේ ඇති ඝන අඩි 136.9ක්වූ බුරුත කඳන් 20ක් සහ මිල්ල කඳන් 1ක්ද, 1 පන්තියේ තේක්ක කණු 45ක්, 2 පන්තියේ තේක්ක කණු 112ක් හා 3 පන්තියේ තේක්ක කණු 20ක් 1970 සැප්තැම්බර් 27 දින පෙරවරු 10.30 ට ම විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වෙන්දේසියට ප්‍රථම දැව පරීක්ෂා කරන ලෙස දැව මිලට ගැනීමට බලාපොරොත්තු වන්නන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. මේ පිළිබඳ වැඩි විස්තර ගල්ගමුව අඩවි වන නිලධාරිගෙන් හෝ මගෙන් ලබාගත හැක.

ඊ. සී. ද ඉසෑඩ් වීරවර්ධන,
වයඹ දිසාභාර වන නිලධාරී,
කුරුණෑගල.

1970. 9. 7 දින,
කුරුණෑගල.

9–690—70.9.18 දින අංක 14,924 දරන ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### නාරාහේන්පිට සැල්වීසියා කඳවුරේ අප්‍රයෝජනවත් භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

නාරාහේන්පිට සැල්වීසියා කඳවුරේ ඇති පහත සඳහන් අප්‍රයෝජනවත් භාණ්ඩ 1970 ඔක්තෝබර් මස 30 වැනි දින පෙ. ව. 10.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ :—

| | | |
|---|---|---|
| 1. | ගැලුම් 1 ටින් ... ... ... | 22 |
| 2. | ප්‍රථමාධාර පෙට්ටි ... ... ... | 1 |
| 3. | ලී කුඤ්ඤ ... ... ... | 179 |
| 4. | යකඩ කුඤ්ඤ ... ... ... | 53 |
| 5. | එවරෙඩි විදුලි පන්දම් කෑලි 3 ... ... | 1 |
| 6. | ස්පැනර් ... ... ... | 4 |
| 7. | බ්‍රාස් ඩිස් ... ... ... | 10 |
| 8. | බිල්හුක් කැති ... ... ... | 3 |
| 9. | විලියස් ලාන්ස්-යුනියන් ... ... | 6 |
| 10. | ලාන්ස් යුනියන් ... ... ... | 2 |
| 11. | හෝස් යුනියන් 4½″ ... ... ... | 2 |
| 12. | බ්‍රාස් නොසල් යුනියන් ... ... ... | 13 |
| 13. | විලියස් ලාන්ස් හෝස් යුනියන් ... ... | 2 |
| 14. | නොසල් ටිප්ස් ... ... | 40 |
| 15. | ඇලුමිනියන් ගන් පෙට් ... ... | 2 |
| 16. | ගැලුම් 46 බැරල් ... ... ... | 4 |
| 17. | ගැලුම් 50 ටැන්කි ... ... ... | 2 |
| 18. | පැට්‍රල් මැක්ස් ලාම්පු ... ... ... | 1 |
| 19. | ගැලුම් 25 ටැන්කි ... ... ... | 1 |
| 20. | ජී. අයි. ආවුද පෙට්ටි ... ... ... | 1 |
| 21. | ගැලුම් 45 බැරල් ... ... ... | 8 |
| 22. | කුඩා ලන්තෑරුම් ... ... ... | 4 |
| 23. | කැති ... ... ... | 1 |
| 24. | වෝල්ට් 12 බැටරි ... ... ... | 1 |
| 25. | ගැලුම් 4 ටින් ... ... ... | 8 |
| 26. | මැනිලා රෝප් ½ ... ... ... | අඩි 51 |
| 27. | ලන්තෑරුම් විමිනි ... ... ... | 1 |
| 28. | ස්පැනර් ... ... ... | 7 |
| 29. | අහල් 12 බාල්දි ... ... ... | 7 |
| 30. | ඇක්සයිඩ් බැටරි ... ... ... | 1 |
| 31. | ලන්තෑරුම් ලොකු ... ... ... | 1 |
| 32. | වෝල්ට් 12 බැටරි ... ... ... | 2 |
| 33. | ගැලුම් 50 හිස් බැරල් ... ... ... | 3 |
| 34. | යේල් ඉබ්බන් ... ... ... | 3 |
| 35. | සිනියර් නැප්සැක් ... ... ... | 1 |
| 36. | සිනියර් නොසල්ස් ... ... ... | 1 |
| 37. | සිනියර් ලාන්ස් ... ... ... | 1 |
| 38. | වෝල්ට් 12 බැටරි ... ... ... | 9 |
| 39. | වෝල්ට් 6 බැටරි ... ... ... | 3 |
| 40. | ස්පැනර් ... ... ... | 11 |
| 41. | ලාන්ස් නොසල්ස් සමඟ නැප්සැක් ... ... | 2 |
| 42. | මැෂින් කරාම ... ... ... | 16 |
| 43. | බොන්ස් ස්පැනර් ... ... ... | 1 |
| 44. | ලී මිටි ... ... ... | 6 |
| 45. | අඩි 60 ක් දිග වයර් කෑලි ... ... | 8 |
| 46. | විඩිසයිඩ් පුනීල ... ... ... | 12 |
| 47. | ගැලුමෙ ටින් ... ... ... | 35 |

2. මෙම භාණ්ඩ වැඩ කරන දිනයන්හි සාමාන්‍ය වැඩ කරන වේලාවන් අතර නාරාහේන්පිට සැල්වීසියා කඳවුරේදී පරීක්ෂා කර බැලිය හැක.

3. ගැනුම්කරු විසින් එවෙලේම මුදල් ගෙවා තමන් මිළට ගත් දෑ එම ස්ථානයෙන් ඉවත් කර ගත යුතු ය. එම දේවල් ඉන් පසු එම ස්ථානයේ තබා ගනු ලබන්නේ ගැනුම්කරුගේම වගකීම පිටය.

4. දැනුම් දීමක් නොමැතිව මෙම ද්‍රව්‍යයන්ගෙන් ඕනෑම එකක් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමෙ බලය රජය සතුය.

ඇල්. ආර්. ඇල්. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

1970 සැප්තැම්බර් මස 6 වැනි දින,
පේරාදෙණියේදිය.

9–699—70.9.18 දින අංක 14,924 දරන ගැසට් පත්‍රය

---

## දැන්වීමයි

මීගමුව මහෙස්ත්‍රාත් උසාවියේ රාජසන්තක කළ සහ අයිතිවාසිකම් නොකියන ලද බඩු 1970 ඔක්තෝබර් මස 6 වෙනි දින පස්වරු 1ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. අයිතිවාසිකම් කියන්නෙක් සිටිනම් 1970 සැප්තැම්බර් මස 25 වෙනි දින හෝ ඊට පෙර එසේ කළ යුතු ය.

පු. බ. රඹුක්වැල්ල,
මීගමුව මහෙස්ත්‍රාත්.

1970. 9. 5 දින,
මීගමුව මහෙස්ත්‍රාත් උසාවියේදිය.

9–696—70.9.18 දින අංක 14,924 දරන ගැසට් පත්‍රය

---

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව—බස්නාහිර දිසාව

### දව වෙන්දේසිය

තොග 14 කින් යුත් පෙලෙන්, කරව්, උලුහු, මිල්ල, මලබඩ, හැඩවක, වැලිපියන්න, කැකුන, දවට, හොර, කින සහ ලියන් කදන් ඝ. අ. 2936.9 ක්, තොග 2 කින් යුත් හොර, නාඉඹුල්, මිල්ල, කරව් සහ කින ඉරූ ලී ඝ. අ. 38.6 ක්, තොග 1 කින් යුත් හැඩවක සිල්පර 37 ක්, කියත් 1 ක්, අඩිකෝදුවක්, ලනුවක් සහ ලාම්පුවක් බස්නාහිර දිසා වන නිලධාරි විසින්, 1970.10.6 දින පෙරවරු 10 ට දෙහිවිට අඩවි වන නිලධාරි කාර්යාලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. වෙන්දේසියට ප්‍රථම මෙම දව බලා සෑහීමකට පත්වන ලෙස ඉල්ලුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. මෙම දව රඹඩ කැලයේ මැතික්දෙල මාර්ගයන්න දව ගබඩාවේ මැරක්කැලේ අංගොට්විගම මාර්ගයන්න දව ගබඩාවේ අවිස්සාවේල්ල ද්‍රම්රියාංගන යේ සහ පොල්ගස්වත්තේ ඇත. වෙන්දේසිය පිළිබඳ වැඩි විස්තර බස්නාහිර දිසා වන නිලධාරීගෙන් හෝ දෙහිඕවිට අඩවි වන නිලධාරීගෙන් හෝ ලබාගත හැක.

කේ. අරුල්වෙල්වම්,
දිසා වන නිලධාරි, බස්නාහිර දිසාව.

දි. ව. නි. කාර්යාලය,
රත්නපුර.

9–543—70.9.18 දින අංක 14,924 දරන ගැසට් පත්‍රය

---

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව—බස්නාහිර දිසාව

### දව වෙන්දේසිය

තොග 15 කින් යුත්, මිල්ල, අලුබෝ, බෝම්, හම්පලඳ, ඇටඹ, හැඩවක, කැකුණ, වැලිපියන්න, මලබඩ, හුලංඉද්ද සහ දෙබකින, කදන් ඝ. අ. 1538.1 ක් බස්නාහිර දිසා වන නිලධාරි විසින් 1970.10.2 දින පෙරවරු 10 ට කලවාන අඩවි වන නිලධාරි කාර්යාලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වෙන්දේසියට ප්‍රථම මෙම දව බලා සෑහීමකට පත්වන ලෙස ඉල්ලුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. මෙම දව ඉඳිපිටිය මුකලාන, දිග්ගල සහ අයගම මාවරකන්ද මුකලානේ ඇත.

වෙන්දේසිය පිළිබඳ වැඩි විස්තර බස්නාහිර දිසා වන නිලධාරීගෙන් හෝ කලවාන අඩවි වන නිලධාරීගෙන් හෝ ලබාගත හැක.

කේ. අරුල්වෙල්වම්,
දිසා වන නිලධාරි, බස්නාහිර දිසාව.

දිසා වන කාර්යාලය,
රත්නපුර.

9–547—70.9.18 දින අංක 14,924 දරන ගැසට් පත්‍රය

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව—බස්නාහිර දිසාව

### දැව වෙන්දේසිය

තොග 4 කින් යුත් මලබොඩ, කොස්, බැදිදෙල්, උබ්බෙරිය, හිඹිය, කීන, දඹු, මල්ලාවුලු, දියපර, අලුබෝ, කටමද, දුන් සහ දියපර කඳන් ඝ. අ. 880.9 ක් තොග 2 කින් යුත් දුන් සහ පලු සිල්පර 115 ක් තොග 2 කින් යුත්, සදු සහ බුරුත ලෑලි 40 ක්, උදලු 2 ක්, කුඩා 5 ක්, උනිටවු 1 සහ යකඩ 1 ක් බස්නාහිර දිසා වන නිලධාරි විසින් 1970.10.4 දින පෙරවරු 10 ට රක්වාන අඹවි වන නිලධාරි කාර්යාලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වෙන්දේසියට ප්‍රථම එම දැව බලා සෑහීමකට පත්වන ලෙස ඉල්ලුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. මෙම දැව සහ ආයුධ රක්වාන අඹවි වන නිලධාරි කාර්යාලයේ, කහවත්ත දුම්රියාංගනයේ, ඇන්දන මාගිසන්න දැව ගබඩාවේ, රක්වාන වන රක්ෂක බාරේ, සහ පල්ලෙබැද්දේ වන රක්ෂක බාරේ ඇත.

වෙන්දේසිය පිළිබඳ වැඩිදුර විස්තර බස්නාහිර දිසා වන නිලධාරි ගෙන් හෝ රක්වාන අඹවි වන නිලධාරිගෙන් හෝ ලබාගත හැක.

කේ. අරුල්වෙල්වම්,
දිසා වන නිලධාරි, බස්නාහිර දිසාව.

දි. ව. නි. කාර්යාලය,
රත්නපුර.

9–546—70.9.18 දින අංක 14,924 දරන ගැසට් පත්‍රය

---

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව—බස්නාහිර දිසාව

### දැව වෙන්දේසිය

තොග 16කින් යුත් පැපිලිය, ලියන්, උබ්බෙරිය, හොර, තව්වැන්න, දාඹු, වැලිපියන්න, අල්බෝ, ගුරුකීන, මිල්ල, හැඩවක, දුන්, මලබඩ සහ දවට කඳන් ඝ. අ. 1686.0ක් තොග 3කින් යුත් හොර සහ දුන් පිටපලු 700ක් සහ තොග 2කින් යුත් හොර සහ දුන් සිල්පර 65ක් බස්නාහිර දිසා වන නිලධාරි විසින් 1970. 9. 27 පෙරවරු 10ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වෙන්දේසියට ප්‍රථම මෙම දැව බලා සෑහීමකට පත්වන ලෙස ඉල්ලුම් කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. මෙම දැව තිතියවල මාර්ගාසන්න දැව ගබඩාවේ, තිතියවල හල්ලෙල මූකලානේ සහ ලන්පඳුර බැට්ටුවේ ඇත.

වෙන්දේසිය පිළිබඳ වැඩි විස්තර බස්නාහිර දිසා වන නිලධාරි ගෙන් හෝ අගලවත්ත අඹවි වන නිලධාරිගෙන් හෝ ලබාගත හැක.

කේ. අරුල්වෙල්වම්,
දි. ව. නි.—බ. දි.

දි. ව. නි. කාර්යාලය,
රත්නපුර.

9–692—70.9.18 දින අංක 14,924 දරන ගැසට් පත්‍රය

---

## හිමිකම් නොපෑ තැපැල් පැකැට්ටුවල බහා තිබුණු භාණ්ඩ වෙන්දේසියේ විකිණීම

අහිමි ලිපි කාර්යාලයට ලැබුණු හිමිකම් නොපෑ තැපැල් භාණ්ඩවල බහා තිබුණු පහත සඳහන් භාණ්ඩ 1970 ඔක්තෝබර් මස 5 වෙනි සඳුදා පස්වරු 1.30ට කොළඹ 3, කොල්ලුපිටියේ 19 වෙනි පටුමගේ අංක 20 දරණ ස්ථානයේ පිහිටි අහිමි ලිපි කාර්යාලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

සාධාරණ ගණනකට නොඉල්ලනු ලබන භාණ්ඩ විකිණීම අත්හිට වනු ලැබේ.

ඇම්. පී. ද සිල්වා,
පෝස්ට්මාස්ටර් ජනරාල් සහ
විදුලි සංදේශ අධ්‍යක්ෂ වෙනුවට.

තැපැල් කොට්ඨාශය,
තැපැල් හා විදුලි සංදේශ මූලස්ථානය,
කොළඹ 1,
1970. 9. 9.

| භාණ්ඩ අංකය | | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 1 | ... | පරණ පත්තර හොණ්ඩරයක් |
| 2 | ... | පරණ පත්තර හොණ්ඩරයක් |
| 3 | ... | පරණ පත්තර හොණ්ඩරයක් |
| 4 | ... | රූත්තල් 40 පරණ මුද්‍රිත කඩදාසි මලු 25ක් |
| 5 | ... | රූත්තල් 40 පරණ මුද්‍රිත කඩදාසි මලු 25ක් |
| 6 | ... | ඉංග්‍රීසි සඟරා 100යේ මිටියක් |
| 7 | ... | ඉංග්‍රීසි සඟරා 100යේ මිටියක් |
| 8 | ... | ඉංග්‍රීසි සඟරා 100යේ මිටියක් |
| 9 | ... | ඉංග්‍රීසි සඟරා 100යේ මිටියක් |
| 10 | ... | ඉංග්‍රීසි සඟරා 100යේ මිටියක් |
| 11 | ... | ඉංග්‍රීසි සඟරා 100යේ මිටියක් |
| 12 | ... | ඉංග්‍රීසි සඟරා 100යේ මිටියක් |
| 13 | ... | ඉංග්‍රීසි සඟරා 100යේ මිටියක් |
| 14 | ... | ඉංග්‍රීසි සඟරා 100යේ මිටියක් |
| 15 | ... | ඉංග්‍රීසි සඟරා 100යේ මිටියක් |
| 16 | ... | ඉංග්‍රීසි සඟරා 100යේ මිටියක් |
| 17 | ... | ඉංග්‍රීසි සඟරා 100යේ මිටියක් |
| 18 | ... | ඉංග්‍රීසි සඟරා 100යේ මිටියක් |
| 19 | ... | ඉංග්‍රීසි සඟරා 100යේ මිටියක් |
| 20 | ... | ඉංග්‍රීසි සඟරා 100යේ මිටියක් |
| 21 | ... | ඉංග්‍රීසි වෛද්‍ය සඟරා 100යේ මිටියක් |
| 22 | ... | ඉංග්‍රීසි වෛද්‍ය සඟරා 100යේ මිටියක් |
| 23 | ... | ඉංග්‍රීසි වෛද්‍ය සඟරා 100යේ මිටියක් |
| 24 | ... | ආගමික සඟරා 100 මිටියක් |
| 25 | ... | ආගමික සඟරා 100 මිටියක් |
| 26 | ... | ආගමික සඟරා 100 මිටියක් |
| 27 | ... | දෙමළ සඟරා 100යේ මිටියක් |
| 28 | ... | විදේශ භාෂාමය සඟරා මිටියක් |
| 29 | ... | ඉංග්‍රීසි පොත් 5ක් "ති. වු. කැරීටර්ස් ඇඩ්වාන්ස්ඩ් එකවුන්ට්ස්" |
| 30 | ... | පරණ "රීඩර්ස් ඩයිජස්ට්" සඟරා තොගයක් |
| 31 | ... | පරණ "රීඩර්ස් ඩයිජස්ට්" සඟරා තොගයක් |
| 32 | ... | පරණ "රීඩර්ස් ඩයිජස්ට්" සඟරා තොගයක් |
| 33 | ... | පරණ "රීඩර්ස් ඩයිජස්ට්" සඟරා තොගයක් |
| 34 | ... | පරණ "රීඩර්ස් ඩයිජස්ට්" සඟරා තොගයක් |
| 35 | ... | ඉංග්‍රීසි පොත් 10ක් "කිම්ලිල් සුං බයෝග්‍රැෆි" |
| 36 | ... | විදේශ භාෂාමය පොත් තොගයක් |
| 37 | ... | ඉංග්‍රීසි පොත් තොගයක් |
| 38 | ... | ඉංග්‍රීසි පොත් තොගයක් |
| 39 | ... | රේඩියෝ වැල්ව් තුනක් |
| 40 | ... | ග්‍රැමපෝන් තැටි 34ක් හා ටේප් රෙකෝඩ් පහක් |
| 41 | ... | බ්‍රෑන්ඩි බෝතලයක් හා දුම්බොන පයිප්පයක් |
| 42 | ... | සායම් ටින් හයක් |
| 43 | ... | වයින් වීදුරු 15ක් |
| 44 | ... | ඉංග්‍රීසි පොතක් "කොරියා 20 ඉයර්ස් ඉන් පික්චර්ස්" |
| 45 | ... | හම් බෑග් එකක් |
| 46 | ... | වොලි බෝලයක්, දැලක් හා නිකල් කුසලානක් |
| 47 | ... | විල්කින්සන් බ්ලේඩ් 12ක් හා අත් බොත්තම් 12 |
| 48 | ... | "එවරෙස්ට්" පටිකපන යන්ත්‍රයක් |
| 49 | ... | ඉංග්‍රීසි බයිබලයක් තිව් ටෙස්තමේන්තුව හා ක්‍රිස්තියානි පොත් තොගයක් |
| 50 | ... | වෙසක් කාඩ්ස් හා වෙසක් ලාම්පු තොගයක් |
| 51 | ... | පාවිච්චි කළ සාය 2ක්, ඇඳුම් 2ක් ස්කාප් 1ක්, නෝනා මහතුන්ගේ කුඩයක් හා ඉඳිකොළ තොප්පියක් |
| 52 | ... | පාවිච්චි කළ නෝනා මහතුන්ගේ සපත්තු කුට්ටම් 6ක්, කුඩා සපත්තු කුට්ටම් 1ක්, මුදල් පසුම්බියක් හා දම්වැලක් |
| 53 | ... | ලීමල් බඳුන් 2ක්, බිත්තියේ එල්ලන ලී පින්තූරයක්, කියුරියෝ සෙල්ලම් බඩු 4ක්, කළුවර අලි පාලමක්, කළුවර අලිදෙන්නෙක් |
| 54 | ... | මේසය මත තබන කැලැන්ඩරයක් හා රබර් සිට් රෝල් 2ක් |
| 55 | ... | කොට්ටෑරයක්, ලේන්සු 3ක් හා බ්‍රැසියර් 6ක් |
| 56 | ... | පරණ කමිසයක්, සරමක්, පිරිමි කුඩයක්, තොප්පියක්, කිරිච්චි පිහියක්, කොපුවක් සමග ඇස් කන්නාඩියක්, කන්නාඩි කොපුවක් හා අව්වට පලඳින කන්නාඩි කුට්ටම් දෙකක් |
| 57 | ... | කුඩා ළමුන්ගේ වූල් ඇඳුම් 25 තොගයක් |
| 58 | ... | කුඩා ළමුන්ගේ වූල් ඇඳුම් 25 තොගයක් |
| 59 | ... | කුඩා ළමුන්ගේ වූල් ඇඳුම් 24 තොගයක් |
| 60 | ... | 20,000ක් පමණ (පාවිච්චි කළ) මුද්දර තොගයක් |
| 61 | ... | 20,000ක් පමණ (පාවිච්චි කළ) මුද්දර තොගයක් |
| 62 | ... | 20,000ක් පමණ (පාවිච්චි කළ) මුද්දර තොගයක් |

9–765—70.9.18 දින අංක 14,924 දරන ගැසට් පත්‍රය

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## වෙන්දේසියේ විකිණීමක්

### හංවැල්ල පහල—පල්ලියවත්ත

ජාතික නිවාස දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස් තැන්පත් ඩී. ඇස්. වීරසිංහ මහතා විසින් මා වෙත නිකුත් කරන ලද බලය ප්‍රකාර හංවැල්ල, පහල හංවැල්ලේ, අංක 167 පදිංචි ඩී. වී. අමරසේකර මහතා ගෙන් සහ ඇස් ඇම්. ඩී. අනාහාමි මහත්මියගෙන් 1968 ක් වූ සැප්තැම්බර් මස 30 වෙනි දින දක්වා පී. ජී. ද සිල්වා නොතාරිස් තැන විසින් ලියා සහතික කළ වර්ෂ 1956 ක් වූ ජූනි මස 24 වෙනි දින අංක 55 සහ 1968 ක් වූ අගෝස්තු 31 වෙනි දින අංක 104 දරණ උගස්කර දෙක මට අයවිය යුතු රු. 29,224.20, 70.3.9 වෙනි දින ගෙවන ලද රු. 800 හැර අයකර ගැනීම සඳහා එසේම 1968 ක් වූ සැප්තැම්බර් 30 වෙනි දින සිට එම මුදල සම්පූර්ණයෙන් ගෙවන දින දක්වා හෝ ඉඩම වෙන්දේසියේ විකුණන දින දක්වා තවදුරටත් රුපියල් 20,500 කට පොළිය අවුරුද්දට සියයට 4 බැගින්ද, අය කර ගැනීමටද, එසේ අයකර ගැනීමේදී දැරීමට සිදුවන වියදම් සහ ගාස්තුද, දඩ මුදල්ද, අයකර ගැනීම සඳහා මෙහි පහත සඳහන් ඉඩම, නිවාසය සහ සියළු දේත්, වර්ෂ 1970 ක්වූ ඔක්තෝබර් මස 6 වෙනි දින පස්වරු 4 ට පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

එකී ඉඩම නම් :—

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළයේ මැද පත්තුවේ හංවැල්ලේ පිහිටි, උතුරින් : කොළඹ-අවිස්සාවේල්ල පාරෙන්ද ; නැගෙනහිරෙන් : අංක 2 දරණ බිම් කැබැල්ලෙන්ද ; දකුණින් ප්‍රධාන ගම්සභා පාරෙන් සහ බටහිරෙන් පී. මාර්තා හාමි සහ තවත් අය විසින් හිමිකම් කියන දේපලින්ද, මායිම් වූ අක්. 1, පර්චස් දශම එකයි හයෙන් පහක අක්. 1, රූඩ්. 0, පර්. 0. 15/6 ප්‍රමාණයෙන් යුත් බලය ලත් මිනින්දෝරු එච්. එස්. පෙරේරා මහතා විසින් සකසන ලද අංක 109 හා 1947.10.7 දිනැති මානක සැලැස්මේ සඳහන් පල්ලියවත්ත නොහොත් කෝන්ගහවත්ත නැමැති අංක 1 දරණ බෙදා වෙන්කරන ලද කොටස.

පෙරකී හංවැල්ලේ පිහිටි, උතුරින් සහ ඊසානින් : කොළඹ-අවිස්සාවේල්ල ප්‍රධාන පාර, කෝන්ගහ වත්ත සහ එලාරිස් විජේගුණවර්ධන විසින් හිමිකම් කියන වලාඹිටෙන්ද ; නැගෙනහිරෙන් : එස්. ඩී. ජෝකිනු සහ තවත් අය විසින් හිමිකම් කියන දෙල්ගහවත්තෙන්ද ; ගිනිකොනින් : අංක 1591 දරණ සැලැස්මේ සඳහන් "එන්" දරණ කැබැල්ලෙන්ද, දකුණින් සහ නිරිතෙන් : අංක 1591 දරණ සැලැස්මේ සඳහන් "එන්" සහ "පී" දරණ කැබැලි සහ ගම්සභා පාරෙන් සහ බටහිරින් සහ වයඹින් : පී. මාර්තාහාමි සහ තවත් අය දැන් හිමිකම් කියන දේපොලින්ද මායිම් වූ එච්. එස්. පෙරේරා බලයලත් මිනින්දෝරු තැන විසින් සකස් කරන ලද අංක 45 දරණ සැලැස්ම අනුව අක්කර හයයි පර්චස් එකොළහක අක්. 6, රූඩ් 0, පර්. 11 ක ප්‍රමාණයෙන් යුත් පල්ලිය වත්ත සහ කෝන්ගහවත්ත නමැති ඉඩමෙන් බෙදා වෙන් කරන ලද කොටසකි, ඉහත කී ඉඩම් කොටස.

වැඩි විස්තර සඳහා කොළඹ 2, සර් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ ජාතික නිවාස කොමසාරිස්තුමාගෙන් විමසන්න.

සම්පූර්ණ විස්තර අංක 14,918 දරණ 1970 ක් වූ අගෝස්තු මස 7 වෙනි දින ගැසට් පත්‍රයේ ඇත.

ඇස්. වී. පී. ජයකොඩි,
වෙන්දේසි සහ තක්සේරුකරු.

33, බැල්මන්ට් වීදිය,
කොළඹ 12.

9–715—70.9.18 දින අංක 14,924 දරන ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතු වන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුයි.

### උපලේඛනය

### 1970

| මාසය | පළ කිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|
| ජූලි | 70. 7. 2 බ්‍රහස්පතින්ද | 70. 6.25 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70 7 10 සිකුරාද | 70 7 2 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 7.17 සිකුරාද | 70. 7.10 සිකුරාද | දහවල් | 12.0 |
| | 70. 7.24 සිකුරාද | 70. 7.17 සිකුරාද | දහවල් | 12.0 |
| | 70. 7.31 සිකුරාද | 70. 7.24 සිකුරාද | දහවල් | 12.0 |
| අගෝස්තු | 70. 8. 7 සිකුරාද | 70. 7.30 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 8.14 සිකුරාද | 70. 8. 7 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 8.21 සිකුරාද | 70. 8.14 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 8.28 සිකුරාද | 70. 8.21 සිකුරාද | ප.ව. | 3.30 |
| සැප්තැම්බර් | 70. 9. 4 සිකුරාද | 70. 8.28 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.11 සිකුරාද | 70. 9. 4 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.18 සිකුරාද | 70. 9.11 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.25 සිකුරාද | 70. 9.18 සිකුරාද | ප.ව. | 3.30 |
| ඔක්තෝබර් | 70.10. 2 සිකුරාද | 70. 9.25 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10. 9 සිකුරාද | 70.10. 2 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.16 සිකුරාද | 70.10. 9 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.23 සිකුරාද | 70.10.16 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.30 සිකුරාද | 70.10.23 සිකුරාද | ප.ව. | 3.30 |
| නොවැම්බර් | 70.11. 5 බ්‍රහස්පතින්ද | 70.10.30 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.11.12 බ්‍රහස්පතින්ද | 70.11. 5 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70.11.20 සිකුරාද | 70.11.12 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70.11.27 සිකුරාද | 70.11.20 සිකුරාද | දහවල් | 12.0 |
| දෙසැම්බර් | 70.12. 4 සිකුරාද | 70.11.27 සිකුරාද | දහවල් | 12.0 |
| | 70.12.11 සිකුරාද | 70.12. 4 සිකුරාද | දහවල් | 12.0 |
| | 70.12.18 සිකුරාද | 70.12.10 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70.12.24 බ්‍රහස්පතින්ද | 70.12.17 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70.12.31 බ්‍රහස්පතින්ද | 70.12.24 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1970 ජූනි 2 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.